# සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් සඳහා අත්වැල



ලෝක සෞඛ්‍ය සංවිධානයේ Information series on School Health ඇසුරෙන් සකස් කරන ලදී

2010

සෞඛ්‍ය අමාත්‍යාංශය
පවුල් සෞඛ්‍ය කාර්යාංශය

අධ්‍යාපන අමාත්‍යාංශය

# සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් සඳහා අත්වැල

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ පවුල් සෞඛ්‍ය කාර්යාංශය
විසින් 2010 වර්ෂයේදී මුද්‍රණය කරන ලදි

# පෙරවදන

සෞඛ්‍යය යනු ලෙඩ රෝග වලින් මිදී සිටීම පමණක් නොව පූර්ණ කායික, මානසික, සාමාජීය සහ අධ්‍යාත්මික යහපැවැත්ම ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය නිර්වචනය කර ඇත.

රෝග ප්‍රතිකාරයට වඩා රෝග නිවාරණයට වැදගත් ස්ථානයක් මෙතෙක් හිමි ව තිබූ අතර වර්තමානයේ ඒ සියල්ල අභිබවා සෞඛ්‍ය ප්‍රවර්ධනය මුල්තැන ගෙන ඇත. සෞඛ්‍ය ප්‍රවර්ධනය තුළින් රෝග නිවාරණය තිරසර විසඳුමක් බවත් ඒ සඳහා ඵලදායී මෙන් ම, උචිත ම වැඩසටහන සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් වැඩසටහන බවත් මුළු ලොව ම පිළිගෙන ඇත.

මේ වැඩසටහන පාසල තුළ ක්‍රියාත්මක කිරීමෙන් සෞඛ්‍යයට බලපාන සාධක පාලනය කර ගනිමින් සෞඛ්‍ය තත්ත්වය දියුණු කර ගැනීම සඳහා ජීවන රටාව සකස් කරගැනීමට අවශ්‍ය දැනුම ආකල්ප සහ කුසලතා නිරන්තරයෙන් පාසල් කාලය තුළ ප්‍රගුණ කිරීමට සහ ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමට දරුවන්ට අවකාශ ලැබේ.

ජීවන නිපුණතා සංවර්ධනය තුලින් දරුවන් තුල යහජීවන පුරුදු චරිතගත කිරීමත් එමගින් පාසල් වියේ සිට ඔවුන් අත්දකින අවදානම් හැසිරීම්/අවස්ථාවලින් ඈත්වී ප්‍රීතිමත් යහපත් පෞරුෂයකින් හෙබි වැඩිහිටියන් ලෙස සමාජයට පිවිසීමටත් මගපෑදෙනු ඇත. ළමා පරපුරට අද තර්ජනයක් ව පවතින බෝවන හා බෝනොවන රෝග වළක්වා ගැනීමටත් රෝගී වීම් සහ ජීවිත අහිමි වීම් තුළින් ඇති වන සමාජ ආර්ථික පරිහානිය අවම කර ගැනීමටත් මෙම වැඩසටහන ඉමහත් පිටිවහලක් වනු නොඅනුමාන ය. එසේ ම ගුරුකාර්ය මණ්ඩලයේ සහ ප්‍රජාවේ සෞඛ්‍යය ගොඩනැගීම ද සිදු වන අතර එය රටේ අනාගත සංවර්ධනයට අතිමහත් පිටුවහලක් වනු ඇත.

සෞඛ්‍ය සමාජ, පාසල් දරුවන් දෙමාපියන් ඇතුළු ප්‍රජාවේ දායකත්වයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්ය මණ්ඩලයේ මග පෙන්වීමෙන් සහ සහභාගිත්වයෙන්ද මේ වැඩසටහන තමාගේ පාසල තුළ ක්‍රියාත්මක කිරීමේදී විදුහල්පති ප්‍රධාන ගුරු කාර්ය මණ්ඩලයට මේ පොත් පිංච බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත. සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් වැඩසටහන සාර්ථක ව ක්‍රියාත්මක කිරීමට සියලුම පාසල්වලට අපගේ ආශිර්වාදය පුදකර සිටිමු.

වෛද්‍ය එච් ඒ පී කහඳලියනගේ
ලේකම්
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය
සුවසිරිපාය

එම් එම් එන් ඩී බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය

# විශේෂ ස්තුතිය

මිලියන 19 ක් පමණ වන ශ්‍රී ලාංකිය ජනහගහනයක් මිලියන 4.2 ක් පමණ පාසල් දරුවෝ වෙති. එම දරුවන්ගෙන් 60%ක් පමණ වයස අවුරුදු 10- 19 ක් අතර නව යොවුන් වියේ පසුවෙති.

මෙම දරුවන්ගේ සෞඛ්‍ය ප්‍රවර්ධනයටත් ඔවුන් එදිනෙදා ජීවිතයේදි මුහුණ පෑමට සිදුවන නානාවිධ අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට අවශ්‍ය කුසලතාවයන් ඔවුන් තුල දියුණු කිරිම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල තුලින් ඉටුකලහැකි කාර්යභාරය අති විශාලය සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් කෙසේ සකස් විය යුතුද යන්න පිළිබඳ උපදෙස් මෙම මාර්ගෝපදේශ සංග්‍රහය තුලින් ලබා දී ඇත. එය සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට මෙන්ම අධ්‍යාපන කාර්ය මණ්ඩලයටද බොහෝ සේ ප්‍රයෝජනවත් වනු ඇත.

ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් ප්‍රකාශයට පත්කර ඇති මෙම පොත සංහලයට පරිවර්තනය කරදීම පිළිබඳව බස්නාහිර පළාත් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක මල්ලවාරච්චි මහතාටත්, සංස්කාරක මණ්ඩලයටත් සම්බන්ධීකරණ කටයුතු සිදුකළ පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ පාසල් හා නව යොවුන් සෞඛ්‍ය ඒකකයේ සියළු කාර්ය මණ්ඩලයටත්, මෙම ග්‍රන්ථය සකස් කිරිම හා මුද්‍රණය සඳහා මුල්‍ය අනුග්‍රහය ලබාදුන් සෞඛ්‍ය අමාත්‍යාංශයටත්, නන් අයුරින් සහයෝගය ලබාදුන් සැමටත් අපගේ ප්‍රණාමය පුදකර සිටිමු.

අපගේ විශේෂ ස්තුතිය පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ හිටපු අධ්‍යක්ෂිකා වෛද්‍ය වී. කරුණාරත්න මහත්මියටත්, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ පාසල් හා නව යොවුන් සෞඛ්‍ය ඒකකයේ හිටපු වැඩසටහන්භාර වෛද්‍ය නිළධාරිණී වෛද්‍ය නෙලී රාජරත්න මහත්මියටත් පුදකර සිටිමු.

වෛද්‍ය අයේෂා ලොකුබාලසුරිය මිය
ප්‍රජා වෛද්‍ය විශේෂඥ
පාසල් සහ නව යොවුන් සෞඛ්‍ය ඒකකය
පවුල් සෞඛ්‍ය කාර්යාංශය

වෛද්‍ය දීප්ති පෙරේරා මිය
ප්‍රජා වෛද්‍ය විශේෂඥ
අධ්‍යක්ෂ (මාතෘ හා ළමා සෞඛ්‍ය)
පවුල් සෞඛ්‍ය කාර්යාංශය

සම්බන්ධීකරණය :- පාසල් හා නව යොවුන් සෞඛ්‍ය ඒකකය, පවුල් සෞඛ්‍ය කාර්යාංශය

පරිවර්තනය :- මල්ලවාරච්චි මයා
විශ්‍රාමික පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක
බස්නාහිර පළාත

සංස්කරණය :- විශේෂඥ වෛද්‍ය අයේෂා ලොකුබාලසූරිය මිය
පාසල් සහ නව යොවුන් සෞඛ්‍ය ඒකකය
රේණුකා පීරිස්, අධ්‍යාපන අධ්‍යක්ෂ/ සෞඛ්‍ය හා පෝෂණ, අධ්‍යාපන අමාත්‍යාංශය

සම්පත් දායකත්වය:-

පාසල් හා නව යොවුන් සෞඛ්‍ය ඒකකය,
වෛද්‍ය එන්.එන්. රාජරත්න මිය වෛද්‍ය නිලධාරී (යුන්සෙෆ් සම්බන්ධීකාරක)
වෛද්‍ය මංජුලා දනන්සූරිය
වෛද්‍ය අසේලා වික්‍රමසිංහ
වෛද්‍ය ඉන්දිකා පෙතියාගොඩ
වෛද්‍ය සුදර්ශනී විග්නේශ්වරන්
අයි ලියනගේ - පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක
ආර්.පී. නුවන් සමීර - මහජන සෞඛ්‍ය පරීක්ෂක
එස් ඒ එස් කරුණාතිලක - සංවර්ධන සහකාර

සෝදුපත් බැලීම අයි ලියනගේ - පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක

පරිගණක යතුරු ලියනය :- නිමාලි චන්ද්‍රලතා මිය

පිටකවර නිර්මාණය :- ආර්.පී. නුවන් සමීර

# සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් සඳහා මාර්ගෝපදේශය

## පටුන


**1 වන පරිච්ඡේදය**

*හැඳින්වීම.* 06

- මෙම මාර්ගෝපදේශක සංග්‍රහය කවුරුන් සඳහා ද? 07
- සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් යනු කුමක් ද? 08
- සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලකින් සෞඛ්‍ය හා අධ්‍යාපනය වැඩිදියුණු වන්නේ කෙසේද? 10
- පාසල් තුළින් සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමෙන් සියලු දෙනාටම ප්‍රතිලාභ ලැබේ 11
- ගැහැණු දරුවන්ගේ අධ්‍යාපනය සියලු දෙනාගේ සෞඛ්‍යයට අඩිතාලමක් වන්නේ ඇයි? 12
- ලොව පුරා පැතිර යන සෞඛ්‍ය ව්‍යාපාරයන් සඳහා සම්බන්ධ වීමට ඇති හැකියාව 13

**2 වන පරිච්ඡේදය.**

ආරම්භය - ප්‍රාදේශීය සහයෝගිතාවය ගොඩ නැගීම. 13

**3 වන පරිච්ඡේදය**

මෙය සිදුකරන්නේ කවුරුන් විසින්ද? 14
පාසල් සෞඛ්‍ය සමාජයක් ආරම්භ කිරීම 14
ප්‍රජා උපදේශක කමිටුවක් පිහිටුවා ගැනීම 17
කණ්ඩායම් සහභාගිත්වය සහ සන්නිවේදන ජාලයක් ඇති කිරීම 19

**අපට අවශ්‍ය තොරතුරු රැස්කරගන්නේ කෙසේ ද?**

වර්තමාන සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්වල ප්‍රගති සමාලෝචනය 20
ප්‍රජාවේ ගැටලු, සම්පත් හා ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම 20
සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් - ක්‍රියාකිරීම සඳහා ඇති හැකියාවන් විමසා බැලීම 21

**ක්‍රියාකාරී සැලැස්මක් වැඩි දියුණු කරන්නේ කෙසේද?**

පරමාර්ථයන් ඇතිකිරීම 23

ක්‍රියාකාරී සැලැස්ම ඇගැයීම 25
ප්‍රගතිය ප්‍රදර්ශනය කිරීමු 25
තොරතුරු එක්රැස් කිරීම 26

**අපට ගැටලු ඇතිවුවහොත් හෝ උදව් අවශ්‍ය නම් යා යුත්තේ කොතනටද?**

පුහුණුව සහ තාක්ෂණික සහාය ලබාගැනීම 27
ප්‍රාදේශීය වැඩසටහන්, පුළුල් අභිලාෂයන් සමග සම්බන්ධ කිරීම 28

## 4 වන පරිච්ඡේදය

පළාත් ප්‍රාදේශීය දිස්ත්‍රික් මට්ටමේ නායකයින්ට පණිවිඩයක් 29

## 5 වන පරිච්ඡේදය

වැඩදායක පාසල් සෞඛ්‍ය වැඩ සටහන් සඳහා සම්පත් යොමු කිරීම 31

**මෙවලම් සහ චක්‍රලේඛ**

**පාවිච්චි කල යුතු මෙවලම්**

මෙවලම 1 සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් ප්‍රතිපත්තය ක්‍රියාකිරීම සඳහා ඇති අවස්ථාවන් විමසා බැලීම.

මෙවලම 2 සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් චක්‍රලේඛය 41
මෙවලම 3 අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් චක්‍රලේඛය 51

# 1 වන පරිච්ඡේදය

## හැඳින්වීම

හොඳ සෞඛ්‍ය යහපත් ඉගෙනීමකට උදව් කරන අතර යහපත් ඉගෙනීම සෞඛ්‍යයට උදව් කරයි. අධ්‍යාපනය හා සෞඛ්‍ය එකිනෙකින් වෙන්කල නොහැකිය. ලොව ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධනයේදී අධ්‍යාපනයේ අප කර ඇති සැලකිය යුතු ආයෝජනය මගින් අති මහත් ප්‍රයෝජන ඇතිවී ඇති බව අපට මැනවින් පෙනේ.

**- වෛද්‍ය ඩෙස්මන්ට් ඕ බ්‍රයන්**
**ලෝක සෞඛ්‍ය සංවිධානය**

සෑම ප්‍රජාවකම සහ රටකම වඩාත් වැදගත් ස්වාභාවික සම්පත වන්නේ ළමුන්ය. සංවර්ධනයේ හදවත වන්නේ ඔවුන්ය. ඔවුන්ගේ යහ පැවැත්ම හැකියාවන්, දැනුම සහ ශක්තිය තුලින් ලොව පුරා ගම්මානවල, නගරවල සහ ජාතීන්ගේ අනාගතය තීරණය කරනු ලබයි. නිරෝගිමත් දරුවෙකුගේ ජීවන ශක්තිය සෝදිසි කර බැලීමේ ගුණය සහ අළුත් අත්දැකීම් ලබාගැනීමට ඇති සූදානම සීමාරහිත බව ගුරුවරුන් ලෙස සියළු තැන්වලදී අපි දනිමු.

පසුගිය දශක කිහිපයේදී අපගේ තරුණ දරුවන්ගේ සෞඛ්‍යයට තිබූ බරපතල තර්ජන කිහිපයක් අඩු කිරීමට බොහෝ රටවල් වලට හැකිවී ඇත. සමස්ථයක් වශයෙන් වර්තමාන ළමුන් අතීතයේ ජීවත් වූ ළමුන්ට වඩා වැඩි කලක් ජීවත් වේ. වඩා හොඳින් පෝෂණයක්ද ලබයි, එදිනෙදා ප්‍රතිශක්තිකරණ නිසි කලට ලබයි, පෙරට වඩා සෞඛ්‍ය සම්පන්නය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් දරුවන්ගේ මරණ සංඛ්‍යාව 1990 ට වඩා මිලියන 2.5 කින් පමණ අඩු වී ඇත. වැඩි වශයෙන් දරුවන් පාසල් යන වයස් තෙක් ජීවත්වන නිසා ලෝකයේ සෑම රටකම පාසල් යන දරුවන් සංඛ්‍යාව වැඩිවන බව දක්නට ලැබේ. කෙසේ වුවත් සමහර අවස්ථාවන්හිදී රෝග තත්වයන් නිසා දරුවන්ට නව දැනුම හා කුසලතා වර්ධනය කර ගැනීමටත්, එමගින් ඔවුන්ගේ ප්‍රජාවන්ට වැඩි දියුණුවීමටත්, සමෘද්ධිමත් වීමටත් උදව් කළ හැකි ඵලදායී පුරවැසියන් වීමටත් අවස්ථාව නොලැබේ. ප්‍රබල තත්ත්වයක් ගොඩ නගා ගැනීමට පාසල් දරුවන් සම්පූර්ණ වශයෙන් අධ්‍යාපන කටයුතුවල නියැලිය යුතුය. මේ සඳහා ඔවුන් සෞඛ්‍ය සම්පන්න, සෑමට ඇහුම්කන් දෙන, චිත්තවේගවලින් සුරක්ෂිත අය විය යුතුය. පාසල්වලට ගුරු මණ්ඩලයේත්, පවුල්වලත්, ප්‍රජාවේත්, පාසල් දරුවන්ගේත්, සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා උදව් කල හැක. සෞඛ්‍ය සහ අධ්‍යාපනය අතර ඇති සම්බන්ධතාවය ගැන අද බොහෝ දේ දැනගෙන ඇත. සෑම තැනම මහජනතාවට මෙම දැනුම උපයෝගි කරගෙන සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් ඇති කිරීමට උදව් කල හැක. සෑම ප්‍රජාවකම වාගේ බොහෝ ජනතාව අන් අය සම්බන්ධව අවධානය යොමු කිරීමටත්, ගරු කිරීමටත්, ඉගෙනීමට සහ වැඩ කිරීමටත් පාසල ආධාර කරගනී. ගුරු මණ්ඩලය සහ දරුවන් ඔවුන්ගේ කාලයෙන් වැඩි කොටසක් ගත කරන්නේ පාසලේය. සෞඛ්‍ය හා අධ්‍යාපන වැඩ සටහන් තුලින් දරුවන්ගේ වැදගත් අවස්ථාවන්හිදී එනම් ළමාවියේදී හා නව යොවුන් වියේදී විශාල බලපෑමක් ඇතිකරවන ස්ථානයක් ලෙස පාසල ක්‍රියා කරයි. සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් ඇති කිරීම තුලින් ලොව පුරා සිටින පාසල් දරුවන්ගේ ඉගෙනීම වැඩි දියුණු කරන අතර වඩාත් ක්‍රියාකාරී ලෙස සෞඛ්‍ය සම්බන්ධව අවධානය යොමු කිරීමට හැකිවේ.

## මෙම මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල කර ඇත්තේ කවුරුන් සඳහා ද?

මෙය මූලික වශයෙන් පාසල් පරිපාලන නිලධාරීන්, ගුරුවරුන් හා ප්‍රජා නායකයින් සඳහා වේ. මෙමගින් පාසල් නායකයින්ට ඔවුන්ගේ පාසල්වල හා ප්‍රජාවේ වැඩ සටහන් සංවිධානය කිරීමේ අදහස් ඇතිකර ගැනීමටත්, සෞඛ්‍ය කටයුතු සඳහා ක්‍රියාකාරකම් හඳුනා ගැනීමටත් පාසල මගින් ඒ සඳහා සෞඛ්‍ය සහ ඉගෙනීම වැඩිදියුණු කිරීමට වැඩ සටහන් සකස් කිරීමටත් අවස්ථාව සැලසේ. මෙහි ඇති මග පෙන්වීම් සහ මෙවලම් තුලින් අලුත් අදහස් ඇතිකර ගැනීමටත්, ක්‍රියාකාරී සැලසුම් වර්ධනය කරගැනීමටත් අවස්ථාව සැලසේ.

***පාසල් කණ්ඩායම්වලට මෙම මෙවලම් උපයෝගී කරගෙන,***

* සම්පත් විශ්ලේෂණය, ප්‍රදේශයේ සෞඛ්‍ය ගැටළු හඳුනාගැනීම හා ගැටළු විසඳීමට ඇති අවස්ථාවන් හඳුනා ගැනීමටත්,

* පාසලේ සාමාජිකයින් - දරුවන්, ගුරුවරුන් උපයෝගි කරගෙන අදහස් ලබාගැනීම හා ක්‍රියාකිරීම සඳහා වූ දැක්ම විධිමත් කර ගැනීමටත්,

* පරමාර්ථ සහ අරමුණු නිශ්චිතව හඳුනාගෙන ඒ සඳහා ක්‍රියාකාරි සැලසුම් සකස් කරගැනීමටත්,

* ලේඛණගත තොරතුරු ඇසුරෙන් ප්‍රගතිය විමසා බලා අනාගතය සඳහා සැලසුම් කිරීමටත් අවස්ථාව සැලසේ.

මේ සඳහා උපයෝගී කරගන්නා මෙවලම් යොදාගතයුතු වන්නේ පාසලේ සංස්කෘතිකමය පසුබිම සහ සම්පත් ප්‍රමාණය අනුවය. මෙමගින් ලොව පුරා ඇති සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල්වල අදහස් හා තොරතුරු සම්බන්ධ අවබෝධයක් ලබාගැනීමටත්, ඒවා බෙදා හදා ගැනීමටත්, පාසල් කණ්ඩායම්වලට අවස්ථාව සැලසේ. මෙවැනි අදහස් වලින් බොහොමයක් මෙම මාර්ගෝපදේශක සංග්‍රහයේ විස්තර කර ඇත. සමහර විශේෂිත උදාහරණ සියළු දෙනාටම නොව සමහර රටවල් වලට වඩා උචිත වනු ඇත. මෙම උදාහරණ අධ්‍යයනය කර නිර්දේශ කර ඇති කරුණු සහ උපාය මාර්ග තමාගේ පාසල්වල සම්පත් හා අවශ්‍යතාවයන් අනුව යොදාගැනීම පාසල් නායකයින් සතු වගකීමක් වන්නේය.
මෙම මාර්ගෝපදේශක සංග්‍රහය මගින් ප්‍රාදේශීය මට්ටමේ පාසල් සඳහා තීරණ ගෙන ඒවා ක්‍රියාත්මක කරන දිස්ත්‍රික් මට්ටමේ /පළාත් මට්ටමේ නිලධාරීන්ට ද මග පෙන්වීමක් කරනු ඇත.

## සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් යනු කුමක් ද?

සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් "සෞඛ්‍ය" සම්බන්ධව දකින්නේ කායික මානසික සමාජයීය සහ ආධ්‍යාත්මික යහ පැවැත්ම පූර්ණත්වයට පත්වීමක් ලෙසයි. පාසලේ සහ ප්‍රජාවේ සෑම කරුණකදීම සෞඛ්‍ය සම්පන්න තත්ත්වයන් ගොඩ නැගීමට සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල බලවත් පරිශ්‍රමයක් දරයි.

රටකින් රටකට සලකා බැලීමේදී එකම රටක වුවත් විවිධ කලාප සහ ප්‍රජාවන් අතර විවිධ වෙනස් වූ ශක්තීන් සහ අවශ්‍යතාවයන් පාසල්වලට ඇත. මෙවැනි විවිධ ශක්තීන් ගොඩ නඟාගෙන ළමුන්ගේ, දෙමව්පියන්ගේ, ගුරුවරුන්ගේ සහ පාලකයින්ගේ සිතුවිලි සම්බන්ධව අවධානය යොමුකර සෑම පාසලකටම සෞඛ්‍යය දියුණු කිරිමට සහ සෞඛ්‍ය ගැටළු සම්බන්ධව ක්‍රියාකිරීමට අලුත් මාර්ගයක් සොයාගත හැකි වනු ඇත. සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් ඇති කිරීමේ ක්‍රියාවලියේ හදවත මෙය වේ.
මේ අනුව පාසල තම පූර්ණ සංවිධානාත්මක ශක්තිය යොදවා පාසල් හා ගුරුවරුන් ඇතුළු පාසල් ප්‍රජාවගේ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කෙරේ.

### සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ 06 (ලෝක සෞඛ්‍ය සංවිධානය - 1996)

1. සෞඛ්‍ය හා අධ්‍යාපන නිලධාරින්, ගුරුවරුන්, විවිධ සංවිධාන, දරුවන්, දෙමව්පියන් සහ ප්‍රජා නායකයින්ගේ සහභාගිත්වයෙන් සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා යොමුවීම
    * පාසල හා සම්බන්ධ ප්‍රජාවේ කණ්ඩායම් සහ පවුල්
    * පාසල හා සම්බන්ධ ප්‍රජා සේවාවන්, ව්‍යාපාරයන් සහ සංවිධාන
    * පාසල් / ප්‍රජා ව්‍යාපෘති
    * පාසල් කාර්ය මණ්ඩලය සහභාගී කරගත යුතුය

2. පහත සඳහන් දේවලින් සමන්විත සුරක්ෂිත සෞඛ්‍යමත් පරිසරයක් ඇති කිරීමට පරිශ්‍රමයක් දැරිය යුතුය.

    * ප්‍රමාණවත් ජලය හා සනීපාරක්ෂක පහසුකම් පැවතීම
    * අපයෝජනයෙන් සහ ප්‍රචණ්ඩත්වයෙන් තොරවීම
    * ආරක්ෂාව, විශ්වාසනියත්වය සහ ගෞරවාන්විත බව ඇති වටපිටාවක් පැවතීම
    * සමාජීය සහයෝගය වර්ධනය හා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය
    * ආරක්ෂිත පාසල් භූමිය
    * ශාරීරික අධ්‍යාපනයට හා විනෝදාස්වාදයට අවස්ථාවන් පැවතීම

3. කුසලතා පදනම් කරගත් සෞඛ්‍ය අධ්‍යාපනයක් ලබාදීම සඳහා යොමුවීම

* විෂය නිර්දේශය තුලින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තම සෞඛ්‍යයට බලපාන සාධක පිළිබඳ අවබෝධයක් ලබාදෙන අතරම සෞඛ්‍ය සම්පන්න දේ පමණක් තෝරා ගැනීමටත්, එමගින් ජීවිත කාලය පුරාම යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීමටත් සැලැස්වීම.

* විශේෂිත සෞඛ්‍ය හා ජීවන කුසලතා ඇතුළත් අධ්‍යාපන ක්‍රම තුළින් සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ යහපැවැත්ම සඳහා කේන්ද්‍රස්ථානයක් ඇතිකිරිම සහ වැදගත් සෞඛ්‍ය ගැටලු වැලැක්වීමටත්, දරුවන්ගේ බුද්ධිය සහ උද්වේගාත්මක හැකියාවන් වර්ධනය කිරිමට තොරතුරු සහ ක්‍රියාකාරකම් ඇතිකිරිම.

* ගුරුවරුන්ට සහ දෙමව්පියන්ට පුහුණුව සහ අධ්‍යාපනය ලබාදීම.

4. සෞඛ්‍ය සේවාවන්ට ප්‍රවේශයක් ලබාදීම සඳහා සහාය වීම

* පාසලේ ඇති සම්පත් සහ අවශ්‍යතාවයන් අනුව වඩා කාර්යක්ෂමව සැපයිය හැකි සේවාවන් සැපයීම - උදා: වෛද්‍ය පරීක්ෂණ සහ අවශ්‍ය ප්‍රතිකාර, වර්ධනය මැන බැලිම, ප්‍රතිශක්තීකරණ.
* සේවාවන් සපයන පළාත් පාලන ආයතන සමග සම්බන්ධකම් පැවැත්වීම
* පෝෂණ සේවාවන් සපයන පළාත් පාලන ආයතන සමග සම්බන්ධකම් පැවැත්වීම
* පෝෂණ සහ සුරක්ෂිත ආහාර සඳහා සේවාවන් සැලසීම

5. සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති සහ පුරුදු ක්‍රියාවෙහි යෙදීම

* දරුවන් සහ ගුරු මණ්ඩලය සඳහා සෞඛ්‍යමත් මනෝ සමාජයීය පරිසරයක් ඇති කිරිමට ඉවහල් වන ඉගැන්වීමේ ක්‍රම ඇති කිරිමට පාසල් පරිපාලනයේ සහ කළමනාකාරිත්වයේ සහයෝගයෙන් ප්‍රතිපත්ති සකස් කිරිම
* සියළුම සිසුන්ට සමානාත්මකව සැලකිය යුතු අයුරින් ප්‍රතිපත්ති සකස් කිරිම
  දරුවන්ගේ කායික, මානසික හා චිත්තවේගාත්මක ගැටළු පාලනයට හෝ නැවැත්වීමටද මධ්‍යසාර, මත්ද්‍රව්‍ය, සැහැසිකම්, අපයෝජනයන්ට අදාල නීතිරිති සැකසීම
* ප්‍රථමාධාර පහසුකම් ලබාදීම පිළිබඳව ප්‍රතිපත්ති ඇතිකර ගැනීම

6. ප්‍රජාවේ සෞඛ්‍ය වැඩිදියුණු කිරිම සඳහා පරිශ්‍රමයක් දැරිම

* ප්‍රජාවේ සෞඛ්‍ය අපේක්ෂාවන් ගැන අවධානය යොමු කිරිම
* ප්‍රජාවේ සෞඛ්‍ය ව්‍යාපෘති සඳහා සහභාගිත්වය

සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් එහි සම්පූර්ණ සංවිධානාත්මක ශක්තිය යොදවන්නේ දරුවන්, ගුරු මණ්ඩලය, පවුල් සහ ප්‍රජාවේ සාමාජිකයින්ගේ සෞඛ්‍ය ප්‍රවර්ධනය සැළසීම සඳහාය.

## සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් සෞඛ්‍ය සහ අධ්‍යාපනය වැඩි දියුණු කරන්නේ කෙසේද?

පාසල්වලට යොදවන කාලය, මුදල් සහ සම්පත් මහජනතාව විසින් කරන ප්‍රධාන සහ වැදගත් ආයෝජනයන්ය. සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් ඇතිකිරිම මගින් ප්‍රජාවේ සියළු දෙනාට පාසල්වලට කරන ලද ආයෝජනවල වැදගත් ඵල ප්‍රයෝජන භුක්ති විඳිමට හැකිවේ.

## අධ්‍යාපනය සඳහා අපගේ ආයෝජනවල ප්‍රතිඵල ලැබෙන්නේ දරුවන් පාසල් යන්නේ නම් පමණකි

පාසල් දරුවන් හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් අසනීපවන අවස්ථාවන්හිදි දරුවන් පාසලට පැමිණීම පහල වැටේ. පාසල අපිරිසිඳු තත්ත්වයක පවතින විට හෝ සනීපාරක්ෂක පහසුකම් නොමැතිවිට හෝ දෙමව්පියන්ට දරුවන් පාසලට එවීමට නොහැකි වනවිට හෝ දරුවන්ට නොයෙකුත් වැඩ කටයුතු කිරිමට සිදුවන අවස්ථාවන්හිදි හෝ පාසලේදී, පාසලට යන එන අතරතුරදී ප්‍රචණ්ඩත්වයට හෝ අපයෝජනයට ලක්වේ යයි පවතින බිය නිසාද දරුවන් පාසලට පැමිණීම අඩුවේ. තවද විෂය නිර්දේශ වල වයසට නොගැලපෙන දේ තිබීමද දරුවන් පාසල් අතහැරීමට ඇති ප්‍රවණතාව වැඩිකරයි.

## පාසල්වලට ඔවුන්ගේ කාර්යය හරිහැටි කල හැකිවන්නේ පාසලට පැමිණෙන දරුවන්ට ඉගෙනීමට හැකියාවක් තිබේනම් පමණකි

ළමුන් අසනීප අවස්ථාවන්හිදී, සාගින්නෙන් පෙළෙන විට, පරපෝෂිත රෝගවලින් දුර්වල වූ විට, මන්දපෝෂණය ඇතිවිට, බියට හෝ වෙහෙසට පත්වූ විට හොඳින් ඉගෙනීමට හැකියාවක් නොලැබේ. දූනටමත් විශාල කාලයක් මිඩංගු කොට මහත් උත්සාහයෙන් වැඩිහිටි තත්වයට පත්වී ඇති දරුවන් නියමිත කාලයට පෙර හෝ බලාපොරොත්තු නොවූ විටක ගර්භණී තත්වයට පත්වන විටත්, ප්‍රචණ්ඩත්වයට මුහුණ දුන් විටත්, ලිංගික රෝගවලින් පෙලෙන විටත්, චිත්තවේග ගැටළුවලදීත් සහ වලක්වා ගත හැකි සෞඛ්‍ය හා මානසික රෝගවලදීත් තමන්ගේ ඉගෙනීමේ කටයුතුවලට බාධා ඇතිකර ගනී.

## පාසලක ඇති ශක්තිය සෞඛ්‍ය ප්‍රවර්ධනය හා සෞඛ්‍ය ආරක්ෂා කිරිම සඳහා සංවිධානාත්මකව යොදා ගන්නේ නම් බොහෝ විට අධ්‍යාපනයට කර ඇති ආයෝජනයේ ප්‍රතිලාභ ලැබේ

ප්‍රතිපත්ති හා සැලසුම් තුළින් ද, හොඳ පුරුදු චරිතගත කිරීම තුළින්ද පරිසර සෞඛ්‍ය ප්‍රවර්ධනයද පාසල්, අධ්‍යාපනයට කරන ආයෝජනයන්ගෙන් විශාල ප්‍රතිඵල ලබාගැනීමට උදව් කරයි. මේ සඳහා අවධානය යොමුකිරීම මූලික සෞඛ්‍ය අවශ්‍යතාවයන් වේ,

* ආරක්ෂිත ජලය සහ සනීපාරක්ෂක පහසුකම්
* බෝවන රෝගවලින් ආරක්ෂාව
* වෙනස්කම් කිරීමෙන් හිරිහැර කිරීමෙන්, ප්‍රචණ්ඩත්වයෙන් සහ අපයෝජනයෙන් ආරක්ෂා කිරීම
* දුම්පානය, ළමා අපයෝජනය HIV/AIDS /ලිංගාශ්‍රිත රෝග අපචාර ඇති නොවන පරිසරයක් පැවතීම

* දුම්පානය නැවැත්වීමට අවශ්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරකම් කිරීම, අපයෝජනය, එච්අයිවී/ලිංගාශ්‍රිත රෝග ඇතිවිය හැකි ලිංගික හැසිරීම් සහ බලාපෙරොත්තු රහිත ගර්භණී තත්ත්වයට පත්වීමෙන් වැලැක්වීම.
* සෞඛ්‍යවත් පෝෂණය ළඟාකර ගත හැකි හා මානසික සෞඛ්‍ය ඇතිකර ගත හැකි පුරුදු වැඩිදියුණු කිරීම.

## පාසල්වලින් සෞඛ්‍ය ප්‍රවර්ධනය සිදුවන විට සැමටම ප්‍රතිලාභ ලැබේ

සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් ඇතිකිරීම යනු නව අයුරකින් සිතීමට සැලැස්වීමකි. පාසලින් සහ ප්‍රජාවෙන් කරන සෑම කටයුත්තකදීම සෞඛ්‍ය ප්‍රවර්ධනය ඇතුළත් ප්‍රතිපත්ති වර්ධනය කර ගැනීමත්, පුරුදු හා ආකෘතීන් සකස් කිරීමත් එයින් අදහස් වේ. ඒ අනුව ශක්තිමත් නායකයකු සමග එක්ව කටයුතු කිරීම තුළින් සැමදෙනාටම අදහස් හෝ මත ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබාදී අවසානයේ පොදු පරමාර්ථ කරා ළඟාවීමට එකගවීම සිදුවේ.

## සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල්වලින් ඇතිවන විශාල ප්‍රතිලාභ සහ එහි බලපෑම

* දරුවන්ට කායික, මානසික හා සමාජයිය යහපැවැත්ම ඉතා උසස් අයුරින් පවත්වාගෙන යන නිසා සෑම අවස්ථාවකදීම අධ්‍යාපනයේ සම්පූර්ණ ප්‍රතිඵල ලබා ගැනිමට හැකිවේ. තරුණ වියේදී සෞඛ්‍ය නිසි අයුරින් පවත්වාගෙන යාමට කුසලතා හුරු කරවන දරුවන්ට වැඩිහිටියන් ලෙසද ඒවා භාවිතා කර ඉන්පසු ඔවුන්ගේ දරුවන්ටද ඒවා පුරුදු කරවීමට අවස්ථාව සැලසේ.

* දෙමව්පියන්ගේ සහ සමාජයේ සහයෝගය සහ ආධාර ලැබෙන නිසා පාසල්වලට ප්‍රතිලාභ ලැබේ. සමාජයේ වැදගත් සේවාවන් සහ සම්පත් දායකයින් සමග සම්බන්ධකම් පැවැත්වීමට ලැබීමද, පාසලට ලැබෙන ප්‍රතිලාභයකි. අත්‍යවශ්‍ය පණිවිඩ, ජනමාධ්‍ය, ප්‍රජා සංවිධාන, පවුල් හා ආගමික කණ්ඩායම් වැනි විවිධ පාර්ශවයන්ගේ පුළුල් සහයෝගය මත සිදුවන අතර ප්‍රායෝගික අත්දැකීම්ද මත සිදුවන නිසා සාමාන්‍ය පංති කාමර ඉගැන්වීම වඩා ශක්තිමත් වීමට හේතුවේ. පාසලේ ආචාර්ය මණ්ඩලය වැඩිදියුණු වූ චිත්ත ධෛර්යය සහ කුසලතා ඇති නිසා ඔවුන්ගේ රාජකාරී වඩා හොඳින් කර ගැනීමට ලැබෙන අතර ඔවුන්ගේ සෞඛ්‍යය ද දියුණු වේ. පාසල් සහ සෞඛ්‍ය සේවාවන්ට දුර්ලභ සම්පත්වලින් උපරිම ප්‍රයෝජනය ගැනීමට හැකිවන අතර පාසැලේ එකතු වන අපද්‍රව්‍ය අඩු කිරීමට ද හැකිවේ.

* දෙමව්පියන්ට හා ප්‍රජා සාමාජිකයින්ට ප්‍රදේශයේ සෞඛ්‍ය ප්‍රශ්න සම්බන්ධව පුළුල් අවබෝධයක් ලැබෙන අතර, වැදගත් නව සෞඛ්‍ය තොරතුරු හා කුසලතා සම්බන්ධවද දැනගැනීමට ලැබේ. එමගින් ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය සමග සම්බන්ධවීමට ද අවස්ථාව ලැබේ. ඔවුන්ගේ නුදුරින් ඇති පාසල ඔවුන්ගේ අදහස්වලට සහ සහභාගිත්වයට විවෘතව ඇති බව ඔවුන්ට ස්ථිරව දැනගැනීමට ලැබේ.

* ප්‍රජා කණ්ඩායම් සහ සංවිධානවලට ලැබෙන ප්‍රතිලාභය නම් පාසල් දරුවන් සහ ගුරුවරුන් ප්‍රජා කටයුතුවලට සම්බන්ධවීමයි. පාසල සමග සහයෝගයෙන් වැඩ කටයුතු කිරීම තුළින් එම සංවිධානවලට තම භාණ්ඩ හෝ සේවාවන් සම්බන්ධව සියලු දෙනාට දැනගැනීමට සැලැස්වීමට හැකිවේ. හොඳින් අධ්‍යාපනය ලැබූ සෞඛ්‍ය සම්පන්න ජනතාවක් සිටීම සමස්ථයක් හැටියට සමාජයට සම්පතකි.

* ව්‍යාපාරිකයින්ට මෙමගින් වඩා ඵලදායක වඩා හොඳින් අධ්‍යාපනය ලැබූ සේවකයින් පිරිසක් අපේක්ෂා කල හැක. ව්‍යාපාරිකයින් සහ පාසල සම්බන්ධ වී කටයුතු කිරීම තුළින් වැඩිහිටියන්ට ප්‍රජාවේ ඇති රැකියා අවස්ථා සම්බන්ධව තොරතුරු සහ තරුණ කණ්ඩායම්වලට රැකියා සොයා ගැනීමට අවශ්‍ය කුසලතාවයන් මොනවාදැයි දැනගැනීමට හැකිවේ.

* රටට ලැබෙන ප්‍රතිලාභය නම් සෞඛ්‍යමත් වඩා හොඳින් අධ්‍යාපනය ලැබූ රටවැසියන් සිටීම තුළින් රටේ ආර්ථික වර්ධනයට ශක්තිමත් පදනමක් ලැබීමයි.

* විවිධ ජාත්‍යන්තර සෞඛ්‍ය හා අධ්‍යාපන සමුළුවලදී සවිස්තරව දක්වා ඇති පරිදි මූලික මිනිස් අයිතිවාසිකම් සහතික කිරීම තුළින් සමස්ත සමාජයේම/ලෝකයේම දියුණුවක් ඇතිවේ.

## ගැහැණු ළමුන්ගේ අධ්‍යාපනය සැමදෙනාගේම සෞඛ්‍යයට වැදගත් වන්නේ ඇයි?

ප්‍රජාවේ යහපැවැත්මට හා ආර්ථික සංවර්ධනය ඇතිවීමට සියළුම ළමුන්ගේ සෞඛ්‍ය නගාසිටුවීම අත්‍යවශ්‍යය. ගැහැණු ළමුන්ගේ සෞඛ්‍ය වැඩිදියුණු කිරීම විශේෂයෙන් වැදගත්ය. එමගින් ඔවුන්ගේ සහ අන් අයගේ ජීවිතවල විස්මයජනක වෙනසක් ඇතිවේ. චීන ප්‍රස්ථා පිරුළකට අනුව *"කාන්තාව අහසින් අඩක් උසුලාගෙන සිටී".* කෙසේ වෙතත් ලොව පුරාම පාසල් ජනගහනයෙන් අඩක් ගැහැණු ළමුන් වේ. එබැවින් ගැහැණු ළමුන්ට ලැබිය යුතු සෞඛ්‍ය සහ අධ්‍යාපන සේවාවන්හි සිදුවන දුර්වලතා නිසා ඇතිවිය හැකි අවාසනාවන්ත බලපෑම දිගු කලක් සමාජයට දැනෙනු ඇත.

* ප්‍රාථමික පාසල් අධ්‍යාපනය නොලබන ළමුන් අතරින් පිරිමි ළමුන් සංඛ්‍යාවට වඩා මිලියන 13 කට වැඩි ළමුන් ප්‍රමාණයක් ගැහැණු ළමුන්ය එම ගැහැණු ළමුන් ප්‍රමාණය මිලියන 86 කි. ලොව පුරා පාසල් නොයන පිරිමි ළමුන් ප්‍රමාණය මිලියන 73 කි.

* ප්‍රාථමික පාසල්වලින් අධ්‍යාපනය අරඹන මිලියන 500 ක් වූ ළමුන් අතරින් මිලියන 100 කටත් වඩා වැඩි සංඛ්‍යාවක් වසර 4 ක් සම්පූර්ණ වීමට ප්‍රථම අධ්‍යාපනය අත්හැර සිටිති. ඉන් 2/3 ක් ගැහැණු ළමුන්ය.

* ලෝකයේ නූගත් වැඩිහිටියන් බිලියනයක් සිටින අතර ඉන් 2/3 ක් කාන්තාවන්ය.

ගැහැණු ළමුන් පාසල්වලින් ඉවත් වීමට හේතුව දුර්වල සෞඛ්‍ය තත්ත්වය පමණක් නොවේ. ලිංගික ප්‍රචණ්ඩත්වය, වෙනස්කම් සිදුවීම සහ වැඩ අධිකවීම වැනි හේතූන්ය. පිරිමි ළමුන්ට වඩා වැඩි ගැහැණු ළමුන් සංඛ්‍යාවක් නිවෙස්වල නතරවීමට හේතුවේ.

බොහෝ රටවල්වල ගැහැණු ළමයාට ඇයගේ සහෝදරයින්ට වඩා අඩුවෙන් ආහාර ලැබෙන අතර වැඩි වැඩ කොටසක් කිරීමට සිදුවේ. ඊට අමතරව පාසල් යාමටද අවස්ථාව අඩුවන අතර පිරිමි ළමුන් හා සමානව සෞඛ්‍ය ආරක්ෂාව ද නොලැබේ. පවුලේ වයසින් අඩු අනෙක් දරුවන් බලාගන්නා තරුණ ගැහැණු ළමයකු නිවසද පිරිසිදු කරයි, ඉවුම් පිහුම් කරයි. දර දිය රැගෙන එයි, ගොවිතැන්වලට උදව් කරයි. මේ සියළු කටයුතු කරන ඇයට පාසල් යාමට වේලාවක් සහ ශක්තියක් නැත. ඇය පාසල් ගියත් ඇයට බොහෝ විට පාසල් පෙළ පොත්වලින්, පාසල් පැවරුම් වලින් ගුරුවරුන්ගේ සැලකිලි වලින් වෙනස්කම් සිදුවේ. ඊට අමතරව පිරිමි ළමුන් ගැහැණු ළමුන්ට වඩා දක්ෂ යයි වරදවා විශ්වාස කරන පන්තියේම පිරිමි ළමුන්ගේ සහ පිරිමි ගුරුවරුන්ගෙන්ද ඇයට වෙනස්කම් සිදුවේ. ගුරුවරුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ලිංගික අපයෝජනවලට මුහුණ දීමට ද සමහර විට ඇයට සිදුවේ. ගැහැණු ළමුන් පිරිමි ළමුන්ට වඩා කලින් විවාහ වන අතර එම නිසා යොවුන් වියේදී හෝ වැඩිහිටි විය ආරම්භයේදී මරණයට පත්වීමේ වැඩි අවධානමක්ද ඇත. ලොව පුරා අවුරුදු 15ත් 19 අතර ගැහැණු ළමුන්ගේ මරණවලට ප්‍රධාන හේතුව ගර්භණීභාවය හා සම්බන්ධ සංකූලතා බව සොයාගෙන ඇත.

## ලොව පුරා සෞඛ්‍ය ව්‍යාපෘතිවලට සම්බන්ධවීමට ඇති ඉඩකඩ.

1997 දි පැවති යුරෝපීය සමාජයේ සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් පිළිබඳව පැවැත් වූ පළමු වන සමුළුවේදී පහත සඳහන් යෝජනාව සම්මත කරගන්නා ලදි. යුරෝපයේ සෑම දරුවෙකුටම සහ තරුණයෙකුටම සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල්වල ඉගෙන ගැනීමට අයිතියක් සහ අවස්ථාවක් තිබිය යුතුය. මේ වචනවලින් දෝංකාර දෙන්නේ යුරෝපයේ ලෝක සෞඛ්‍ය සංවිධාන, ප්‍රාදේශීය කාර්යාලය, යුරෝපීය කවුන්සිලය සහ යුරෝපයේ සමාජ කොමිසම 1990 දී ආරම්භ කල ව්‍යාපාරය සම්බන්ධවයි. මෙය ඉන් පසු ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් ලොව පුරා ප්‍රචලිත කරන ලදි. ඔබ පාසල සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් බවට පත්කිරීමට ඔබ සූදානමින් සිටින්නේ නම් ඔබ කළ යුත්තේ ඔබ පළාතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ කලාපයේ හෝ කොට්ඨාශ කාර්යාලයෙන් විමසීමයි.

දැනට පවත්නා වැඩ සටහනට ඔබට සම්බන්ධවීමට හැකි වුවත් නැතත් සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් සංවර්ධනය කිරීමේදී ප්‍රධාන සෞඛ්‍ය තේමාවන් එයට ඇතුළත් කර ගැනීම ගැන ලෝක සෞඛ්‍ය සංවිධානයේ පාසල් සෞඛ්‍ය තොරතුරු වැඩ සටහනෙන් ඔබට උපදෙස් ලැබේ.

# 2 වන පරිච්ඡේදය.

## ප්‍රදේශයේ සහයෝගය වැඩිදියුණු කර ගැනීම.

සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් ඇති කිරීමට පුළුල් සහයෝගයක් තිබිය යුතුය. ඔබ විදුහල්පතිවරයෙක් වුවත්, ගුරුවරයෙක් වුවත්, කාර්ය මණ්ඩලයේ අයකු වුවත්, දෙමව්පිය සංවිධානයක ප්‍රධානියෙකු වුවත් ඔබට ඔබේ සහායකයින් සමග සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් බවට ඔබේ පාසල පත් කිරීම සඳහා කටයුතු ආරම්භ කළ හැකිය.  මෙය සාර්ථක වීමට නම් ආධාරකරුවන් විශාල කණ්ඩායමක් සිටිය යුතු අතර ප්‍රජාවෙන් සහයෝගය ලබාගත යුතුය.

මෙම සහයෝගය ලබාගැනීමේ ඉතා වැදගත් ප්‍රථම පියවර වන්නේ සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් යනු කුමක්ද යන්න අවබෝධ කර ගැනීමයි.  ඒ සමගම එයින් දරුවන්ට, පවුල්වලට ගුරුවරයින්ට සහ ප්‍රජාවට ලැබෙන දේ ගැනද සැලකිය යුතුය. පාසල්වලට එමගින් ලැබෙන ප්‍රතිලාභය නම් ප්‍රදේශයේ සෞඛ්‍ය අවශ්‍යතාවයන් සම්බන්ධව ප්‍රජාවේ අදහස් දැනගැනීමට ලැබීමත් ඒවා සම්බන්ධව කටයුතු කිරීමට පාසලට සහයෝගය දිය හැක්කේ කෙසේද යන්න පාසලට දැනගැනීමට ලැබීමත්ය.  මෙය ක්‍රම 2 කින් ආරම්භ කළ හැකිය.

* සෞඛ්‍ය ප්‍රවර්ධනය සම්බන්ධවත් දරුවන්ගේ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සම්බන්ධවත් උනන්දුවක් දක්වන කුඩා කණ්ඩායමක් එක් රැස් කිරීම.

මේ සඳහා පාසලේ විදුහල්පතිවරයාත්, පාසල් සංවර්ධන සමිතියෙන් සාමාජිකයකුත් උනන්දුවක් දක්වන ගුරුවරයෙක්ද, දෙමව්පියන්ගෙන් එක් අයකුද ආගමික නායකයින්ද, ප්‍රදේශයේ රජයේ නිලධාරීන්ද, පාසලින් පිටතදී තරුණයින් සමග සම්බන්ධ වී කටයුතු කරන අයද පත්කර ගත යුතුය. ප්‍රදේශයේ සෞඛ්‍ය වැඩ සටහන් හෝ වෙනත් ප්‍රජා වැඩ සටහන්වල නිරතවන අය සමග කටයුතු කිරීම තුළින් සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ඔබට ලැබෙන අවස්ථාවන් විමසා අවබෝධයක් ලබාගත හැකිය. මේ කණ්ඩායමට, සෞඛ්‍ය ගැටළු සම්බන්ධව සහ සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල්වල වැදගත්කම සම්බන්ධවද, අවධාරණය කළහැක.

මෙලෙස රැස්කරන කණ්ඩායම පාසලේ සෞඛ්‍ය ප්‍රවර්ධන උත්සාහයන් සම්බන්ධව මග පෙන්වීම හා නිරීක්ෂණය කරන පාසල් සෞඛ්‍ය කමිටුව වේ.

විවිධ අන්දමේ පුද්ගලයින් මේ සඳහා සහභාගී කරගත යුතුය. විධිමත් හා අවිධිමත් නායකයින්, පිරිමි සහ කාන්තා දෙපක්ෂය සහ පාසල් සිසුන් ද එහි සිටිය යුතුය. ආරම්භයක් වශයෙන් පහත සඳහන් ක්‍රියාකාරකම් ඔබට උදව් වනු ඇත.

* පාසලේ ක්‍රියාකාරිත්වයට බලපාන මූලික සෞඛ්‍ය ප්‍රශ්න සම්බන්ධව හා සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් ඇති කිරීම මගින් දරුවන්ට පාසල් කාර්ය මණ්ඩලයට හා ප්‍රජාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව අවබෝධයක් ඇති කිරීම, නායකයින් හමුවී මූලික කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම.

* තොරතුරු හුවමාරු කරගැනීමට සහ ඔවුන්ගේ අදහස් ලබාගැනීමට දෙමාපියන් හා පාසල් දරුවන් සමග සාකච්ඡා කිරීම
* තොරතුරු දැනුම්දීමේ රැස්වීමකට ප්‍රදේශයේ මහජනතාවට ආරාධනය කිරීම.
* සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් වැඩසටහන සම්බන්ධව දැනුවත් කිරීමට කුඩා පොත් පිංචක් සකස් කිරීම.
* ගුවන්විදුලිය, දේශන හා පෝස්ටර් වැනි වෙනත් මහජනතාවට අධ්‍යාපනය ලබාදීමේ ක්‍රම පාවිච්චි කිරීම.
* ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපකරණ පාවිච්චි කර විධිමත් ඉදිරිපත් කිරීමක් සිදුකිරීම.
* තේමාවක් හෝ ආදර්ශ පාඨයන් සකස් කරගැනීමට තරඟයක් පැවැත්වීම.
* ජනතාව හොඳින් ගැවසෙන ස්ථානයක වීදි නාට්‍යයක් පෙන්වීම.

සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් සංකල්පය වැඩිදියුණු කරනවිට සහ ඒ සම්බන්ධව උනන්දුවක් ඇතිකරන විට ඒ සඳහා වඩා හොඳ සහයෝගයක් දක්වන කාන්තාවන් හඳුනා ගැනීමට හැකිවනු ඇත. මෙම අය ප්‍රජා උපදේශක කමිටුවක් සඳහාද සුදුස්සන් වේ. සංවේදී සෞඛ්‍ය ගැටළු පිළිබඳව හා ඒවා සම්බන්ධව පාසල ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳව සමහර විට මතභේද ඇතිවනු ඇත. ප්‍රජාවේ සියළුම කොටස් නියෝජනය කරන ප්‍රජා උපදේශක කමිටුවක් මගින් මෙම මතභේද නිරාකරණය කර ගැනීමට හැකිවනු ඇත.

# 3 වන පරිච්ඡේදය.

## මෙය ක්‍රියාත්මක කරන්නේ කව්ද?

සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් ඇති කිරිමට ඒ සඳහා කැපවීමෙන් කටයුතු කල හැකි පුද්ගලයින් අවශ්‍ය වේ. මේ සඳහා කණ්ඩායම් දෙකක් අවශ්‍යය. පාසල් සෞඛ්‍ය සමාජය ඉන් එක් අංගයක් වන අතර අනෙක පාසල් උපදේශක කමිටුවයි.

### පාසල් සෞඛ්‍ය ශිෂ්‍ය සමාජ කණ්ඩායම පිහිටුවීම.

සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් සංකල්පය ඉදිරියට ගෙන යාම පාසල් සෞඛ්‍යය උපදේශන කමිටුවේ සහ සෞඛ්‍යය සමාජයෙහි වගකීම වේ. මෙම කණ්ඩායම් මෙම කාර්යය සඳහා ප්‍රමුඛතාවය ගෙන කටයුතු කරනු ඇත. ප්‍රාථමික අංශය හා ද්විතියික අංශය සඳහා වෙන්වූ සෞඛ්‍ය සමාජ දෙකක් පත්කර ගැනීම හා ඔවුන්ට වගකීම් පැවරීම මගින් වඩාත් කාර්යක්ෂමව ඒ ඒ වයස් මට්ටම්වල ළමුන් සඳහා සුදුසු සෞඛ්‍ය පණිවිඩ සහ සෞඛ්‍යමය මැදිහත්වීම් ලබා දීම කළ හැකිය.

*මෙම කණ්ඩායමේ ක්‍රියාකාරකම්වලට පහත සඳහන් කරුණු ඇතුළත් වනු ඇත.*

* පාසල් නිලධාරීන්ට පිළිගත හැකි සහ ඔවුන්ගේ සහයෝගය ලබා ගතහැකි ක්‍රියාකාරී සැලැස්මක් සෑදීම සඳහා නායකත්වය දීම හා පිළිගත හැකි දර්ශනයක් ඉදිරිපත් කිරීම.
* පාසල් සෞඛ්‍ය කණ්ඩායමට නායකයකු පත්කර ගැනීමට පාසලේ බලධාරීන් සමග කටයුතු කිරීම. මෙම නායකයා ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධව සොයා බලන අතර වගකීම් පවරනු ලැබූ අය එම වගකීම් නිසි පරිදි ඉටු කරන්නේ දැයි අධීක්ෂණය කිරිම.
* සිදුවන දේ සම්බන්ධව හොඳින් සටහන් සහ විස්තර තබා ගැනීම.
* අවශ්‍යතාවය හඳුනා ගැනීමටත්, අදහස් ලබාගැනීමටත්, සහභාගිත්වය පිළිබඳව ධෛර්යය ගැන්වීමටත් දෙමව්පියන් සමග කටයුතු කිරිම.
* පාසල් උපදේශක කමිටුව සමග එක්ව කටයුතු කිරිම.
* පාසල් උපදේශක කමිටුවට අවශ්‍ය විස්තර හෝ සැලසුම් සැපයීම සඳහා මූලිකත්වය ගැනීම හා සම්බන්ධීකරණ කටයුතු කිරිම පුහුණු කටයුතු සඳහා සූදානම් කිරිම.
* ප්‍රාදේශීය මට්ටමේ අධ්‍යාපන නිලධාරීන් හා සෞඛ්‍ය නිලධාරීන් සමග පළාත් සහ අමාත්‍යාංශ මට්ටමේ නිලධාරීන් සමග සම්බන්ධකම් ඇතිකර ගැනීම.

පාසල් සෞඛ්‍ය ශිෂ්‍ය සමාජයට සාමාජිකයින් පත්කර ගැනීමට මේ සඳහා කැපවී කටයුතු කරන අයට අමතර සාමාජිකයින් නම් කිරිමට ඉඩදිය හැකිය. ඒ සඳහා තෝරාගැනීමේ නිර්නායකයන් ඇතිකර ගත යුතුය. පාසල් බලධාරීන්ට පිළිගත හැකි පරිදි පාසල් සෞඛ්‍ය කණ්ඩායමේ සාමාජිකයින් පත්කර ගත යුතුය.

පාසලේ විදුහල්පති විසින් මෙම කණ්ඩායමේ ක්‍රියාකාරී සැලැස්ම ඉදිරියට ගෙන යාමට නායකත්වය දිය යුතු අතර, අවශ්‍ය පරිදි කළමනාකරණ කටයුතු සහ සම්බන්ධීකරණ කටයුතු ඉටුකල යුතුය.

මෙම කණ්ඩායමට සාමාජිකයින් 8 සහ 14 අතර සංඛ්‍යාවක් තෝරාගැනීම සුදුසුය.

## පාසල් සෞඛ්‍ය උපදේශක කමිටුව සඳහා සුදුස්සන්.

* කැපී පෙනෙන, ධෛර්ය සම්පන්න සියළු දේ ඉටුකල හැකි අය විය යුතුය.
* සෞඛ්‍ය ප්‍රවර්ධන සංකල්පය දැඩි ලෙස වැළඳගත් අය විය යුතුය.
* සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් ඇතිකිරීමේදී සෞඛ්‍ය අධ්‍යාපනයේද සෞඛ්‍ය සේවාවන්ගේද, සෞඛ්‍යමත් පරිසරයක් ඇතිකිරිමට ගන්නා උත්සාහයේ ද අනෙකුත් සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාවන්ගේද වැදගත්කම වැටහෙන අය විය යුතුය.
* ජයග්‍රහණ ලැබිය හැකි ප්‍රවේශයනට සහ අදහස්වලටත් පාසල්වලට අලුත් වැඩ පිළිවෙලක් සඳහාත් ප්‍රබල ප්‍රජා සහභාගිත්වයක් සඳහාත් ඉවහල්වන අදහස්වලට සහ ප්‍රවේශයන්ට උනන්දුවක් දක්වන අය විය යුතුය.
* කණ්ඩායමක් සමග හොඳින් එක්ව කටයුතු කළ හැකි අය විය යුතුය.
* දිගු කලක් සේවය කිරිම සඳහා කැපවීමකින් කටයුතු කල හැකි අය විය යුතුය.
* පිරිමින්, කාන්තාවන්, පිරිමි ළමුන් ගැහැණු ළමුන් සමාන වශයෙන් ඇතුළත් විය යුතුය.

මෙම කණ්ඩායමේ සාමාජිකයින් කිහිප දෙනෙකු ශක්තිමත් නායකයින් විය යුතු අතර අනෙක් අය විශේෂ කරුණු සම්බන්ධ උනන්දුවක් දක්වන හෝ විශේෂඥ අදහස් ඇති අය විය හැකිය. මෙම කණ්ඩායම සඳහා පහත සඳහන් අයද ඇතුළත් කිරීමට උත්සාහ කළ යුතුය.

* පාලකයින්
* ගුරු සංවිධාන නායකයින්
* ගුරුවරුන්/කාර්ය මණ්ඩලය
* ශිෂ්‍ය ශිෂ්‍යාවන්
* අඩු වශයෙන් දෙමව්පියන්ගෙන් එක් අයෙක්.
* පාසලෙන් හෝ ප්‍රජාවෙන් හෙදියක් හෝ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ අයෙක්
* ආහාර සපයන්නෙක්
* ගුරු දෙගුරු සංගම් නියෝජිතයෙක්

මෙම කණ්ඩායම සඳහා නායකයෙකු පත්කර ගැනීමට පාසල් නිලධාරීන් එක්ව කටයුතු කළ යුතුය. මෙම නායකයා ඉතා වැදගත් කාර්ය මණ්ඩල සාමාජිකයකු වීම වඩා යෝග්‍යය. අනිවාර්යෙන්ම විදුහල්පතිවරයා මෙහි නායකත්වය ගත යුතුය. කුඩා පාසල්වල පාසල් සෞඛ්‍ය කණ්ඩායමට මේ සියළුම පුද්ගලයින් ඇතුලත් නොවිය හැකිය. නමුත් එවැනි පාසල්වල විදුහල්පතිවරයා, ගුරු මණ්ඩලයේ එක් අයෙක්, දෙමව්පියන්ගෙන් එක් අයෙකු, සෞඛ්‍ය සේවාවේ නියුතු අයෙක් සහ සිසුන් මෙම කණ්ඩායමේ සිටිය යුතුයි

## ප්‍රජා උපදේශක කමිටු පිහිටුවීම

පාසල් සෞඛ්‍ය කණ්ඩායමට ඌන පූර්ණයක් ලෙස ප්‍රජා උපදේශක කමිටු ක්‍රියා කරයි. ප්‍රජාවට සහ පාසලට බලපාන සෞඛ්‍ය අවශ්‍යතාවයන් ගැන අවබෝධයක් ඇති අය හෝ සෞඛ්‍ය ප්‍රවර්ධනය ඇති කර ගැනීමට ඉවහල් වන සම්පත් ලබාගැනීමට දායක විය හැකි අය එයට ඇතුළත් විය යුතුය. උපදේශක කමිටුවේ සාමාජිකයින්ට සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ගනු ලබන වැඩ පිළිවෙලේ බලපෑම වඩා පුළුල් වන ආකාරයට කටයුතු කිරීමටත්, සෞඛ්‍ය සේවාවන් වැඩිදියුණු කිරීමටත්, පාසල හා ප්‍රජාව අතර සබඳතාවය වඩා ශක්තිමත් කිරිමට කටයුතු කිරීමටත් පුළුවන.

***ඔවුන්ට පාසල් සෞඛ්‍ය කණ්ඩායම සමග පහත සඳහන් කරුණු ඉටුකල හැක.***

* නායකයින්, කාර්ය මණ්ඩලය සහ සංවිධානවල සාමාජිකයින් සමග සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල දියුණු කිරීමට කටයුතු කිරීම.
* සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් සම්බන්ධ තොරතුරු සමාජයේ සෑම කොටසකටම ලබාදී එම වැඩ කටයුතුවලට සහයෝගය ලබා ගැනීම.
* අමතර ප්‍රජා කණ්ඩායම්වලට ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරිමට අවස්ථාව ලබාදී ඔවුන් සෞඛ්‍ය අවශ්‍යතාවය සඳහා සම්බන්ධ කර ගැනීම.
* සමාජයේ සිටින විවිධ අන්දමේ හැකියාවන් ඇති පුද්ගලයින් සොයාගෙන නොයෙකුත් ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය වන සම්පත් ඔවුන්ගෙන් ලබාගැනීම.
* සමාජයේ ඇති සෞඛ්‍යයට බලපාන ගැටලු සහ අවස්ථා තක්සේරු කිරීමට උදව් වීම.

## ප්‍රජා උපදේශක කමිටුව සඳහා සුදුස්සන්.

* නම්‍යශීලී සහ නව අවස්ථාවන් සඳහා හැඩගැසිය හැකි අය
* ළමුන්, යෞවනයින්, අධ්‍යාපනය සහ මහජන සෞඛ්‍ය සම්බන්ධව කැමැත්තක් දක්වන හා පළපුරුදු අය
* සමාජය සම්බන්ධ දැනුමක් ඇති අය
* උදව් ලබා ගැනීමට හැකියාව ඇති අය

සෑම වැදගත් කණ්ඩායමක්ම නියෝජනය වන පරිදි ලැයිස්තු ලබාගෙන එක් එක් අයදුම්කරුගේ නායකත්වය සහ වෘත්තීය දක්ෂතාවය සම්බන්ධවත් කණ්ඩායමක් සමග සේවය කිරීමට ඇති හැකියාව පිළිබඳවත් සමාජ සම්බන්ධකම් පිළිබඳවත්, දිස්ත්‍රික් නායකයින්ට ඇති සම්බන්ධකම් පිළිබඳවත් විමසා බැලිය යුතුය. ඒ සමගම ඔවුන්ට ලිවීමට, සාකච්ඡා කිරීමට, වර්තමාන පර්යේෂණ සම්බන්ධ දැනුම ලබා

ගැනීමට, කණ්ඩායම් සම්බන්ධ කර ගැනීම, මුදල් සොයා ගැනීමට, මහජනතාව ඇමතීමට හැකියාවක් තිබිය යුතුයි. ඉන්පසු සුදුස්සන් කමිටුවට සම්බන්ධ කරගත යුතුය. මෙම කමිටුව මේ සඳහා කැමැත්තක් දක්වන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු අතර ඔවුන් තමන්ගේ පළපුරුද්ද හා සම්පත් උපයෝගී කරගෙන සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල වෙනුවෙන් සහයෝගය ගොඩනැගිය යුතුයි.

## පහත සඳහන් ක්ෂේත්‍ර නියෝජනය කරන පුද්ගලයින් ඇතුළත් කිරීම සුදුසුය.

* සෞඛ්‍ය කාර්ය මණ්ඩල (වෛද්‍යවරුන්, හෙදියන්, මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන්, පවුල් සෞඛ්‍ය නිලධාරිණියන්, මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය)
* තරුණයින් සහ පවුල් කණ්ඩායම්
* වෘත්තීය සමිති/කම්කරු නියෝජිතයින්
* කාන්තා සංවිධාන
* මුල් ළමාවිය අධ්‍යාපනය
* පළාත් පාලන ආයතනය
* විනෝදාස්වාදය සපයන ආයතන
* කලා/අත්කම්
* බැංකු
* සනීපාරක්ෂාව/මහජන සේවා
* නීතිය ක්‍රියාත්මක කිරීම
* ව්‍යාපාරිකයන්
* ප්‍රවාහන
* රාජ්‍ය නොවන සංවිධාන/පුණ්‍ය ආයතන/සංවර්ධන සංවිධාන

කමිටුව සඳහා 15-25 අතර සාමාජිකයින් පිරිසක් පත්කර ගැනීම සුදුසුය. කුඩා පාසල්වල පාසල් සෞඛ්‍ය කණ්ඩායම හා ප්‍රජා උපදේශක කමිටුව යන කණ්ඩායම් 02 ක් සෑදීම වෙනුවට මෙම කණ්ඩායම් 02 ම නියෝජනය වන එක් කණ්ඩායමක් සෑදීම සුදුසුය. පාසල් සෞඛ්‍ය කණ්ඩායම සමග සම්බන්ධ වී හෝ වෙනම කණ්ඩායමක් හැටියට හෝ ප්‍රජා උපදේශකයින් පත්කල යුත්තේ පාසලට සහයෝගය ලබාදිය හැකි හොඳම පිරිසයි.

## කණ්ඩායමේ සහභාගිත්වය සහ අන්තර් සම්බන්ධතාවයක් ඇති කිරීම

පාසල් සෞඛ්‍ය කණ්ඩායමේ සහ ප්‍රජා උපදේශක කමිටුවේ සාමාජිකයින් පත්කර අවසන් වූ පසු කණ්ඩායම් දෙකම සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් ගොඩ නැගීමට තම කාර්යයන් ඉටුකිරීම ආරම්භ කළ යුතුය. මේ සඳහා හොඳින් කාලය මිඩංගු කළ යුතුය. එවිට කණ්ඩායම් සංකල්පය ගොඩ නගාගැනීමටත්, එක්ව කටයුතු කිරීමේ වාතාවරණය වැඩිදියුණු කර ගැනීමටත් පුළුවන. ක්‍රියාකාරී සැලැස්මේ සාර්ථකත්වයට කණ්ඩායමේ සහ උපදේශක කමිටුවේ සහයෝගීතාවය අතිශය වැදගත් වෙයි. ඔබගේ පාසල වෙනුවෙන් මාර්ගෝපදේශක සංග්‍රහයක් සකස් කර ගැනීමටත්, පාසලේ සියළු දෙනා සමගත්

ප්‍රජාව සමගත්, දිස්ත්‍රික් සෞඛ්‍ය හා අධ්‍යාපන නිලධාරින් සමගත් මේ සම්බන්ධව අදහස් හුවමාරු කර ගැනීමට වගබලා ගත යුතුය.

දැනට කරගෙන යන ක්‍රමවලින් බැහැරව අලුත් පුරුදුවලට මිනිසුන් යොමු කිරීම අභියෝගයකි. ඔවුන් සම්බන්ධ වී ඇතිකරගත් දර්ශනයකින් හෝ විශාල අදහසකින් නම් පෙළඹවීම වඩා පහසුය. සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් සංකල්පය සම්බන්ධව කථා කිරීමේදී කණ්ඩායම් සංකල්පය සම්බන්ධව සුළුකොට නොතැකිය යුතුය. අදහස්, පළපුරුද්ද සහ උපකරණ හුවමාරු කර ගැනීම තුළින් වැඩ සටහන් දියුණුවන අතර ජනතාවගේ කැපකිරීම්ද නොනවත්වා සිදුවිය යුතුය. කාලයක් මුළුල්ලේ අදහස්, පළපුරුද්ද සහ උපකරණ හුවමාරු කර ගැනීම මගින් මහජනතාවගේ කැපවීම දිගටම පවත්වාගෙන යාමට සහ වැඩ සටහන්වල වර්ධනයට හේතු කාරක වේ. යලි යලිත් උත්සාහ කරනු ලැබීමත්, මගනොහැරීමටත්, පොදු අරමුණක් සඳහා සැම කෙනෙකුම මෙහෙයවීමටත්, කණ්ඩායම සහ කමිටුව ඔවුන්ගේ ප්‍රයත්නයන් බෙදා හදා ගැනීම සහ එකිනෙකා සමග නිරතුරු අදහස් හුවමාරු කිරීම කළ යුතුය. කණ්ඩායම සහ කමිටුව වෙන් වෙන්ව ඔවුනට කැමති අයුරින් ප්‍රජාව පාසල් නියෝජිතයින්, ජාතික පළාත් හා දිස්ත්‍රික් මට්ටමේ නායකයින් සමග සාකච්ඡා කිරිමට අනුබල දිය යුතුය.

## අපට අවශ්‍ය වන තොරතුරු එක්රැස් කරගන්නේ කෙසේ ද?

මීළග කාර්යය වන්නේ පාසලේ සහ ප්‍රදේශයේ සෞඛ්‍ය වැඩ සටහනට සහ සෞඛ්‍ය ගැටළු සම්බන්ධව හැකිතරම් අධ්‍යයනය කිරිමයි. ඔබ පාසල සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා දැනට කරන කාර්යභාරය කුමක්ද? වලක්වා ගත හැක්කේ හෝ අඩුකර ගත හැක්කේ කුමන සෞඛ්‍ය ගැටළුද? ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඇති අවස්ථාවන් කවරේද? මෙම කරුණු සම්බන්ධව කටයුතු කිරිමට ඇති සම්පත් කවරේද? ලබාගත යුතු සම්පත් මොනවා ද?

මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයනවිට මූලිකත්වය දිය යුතු කරුණු සම්බන්ධව තොරතුරු ඔබට ලැබෙනු ඇත.

## <u>වර්තමාන පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන උත්සාහය ඇගයිම.</u>

ඔබේ පාසල හෝ ප්‍රජාව සෞඛ්‍ය දියුණු කිරීම සඳහා දැනටමත් කටයුතු කරන ආකාරය සොයා බැලිය යුතුය. බොහෝ පාසල්වල කුමන හෝ සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සිදුවෙමින් පවතී. සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක මූලික කාර්යයක් වන්නේ එම ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරිමට ඇති අවස්ථාවන් සොයා බැලීමයි.

මෙතෙක් සිදු කිරිමට හැකිවූ සහ සිදු කල නොහැකි වූ දේ පිළිබඳව සොයා බැලිය යුතුය. ප්‍රදේශයේ තවත් සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් තිබේ නම් එම පාසල්වල අත්දැකීම් සහ තොරතුරු ලබාගත යුතුවේ.

## ප්‍රජාවේ සෞඛ්‍ය ගැටළු පිළිබඳ ඇගයීම.

සෞඛ්‍ය ගැටළු ප්‍රදේශයෙන් ප්‍රදේශයට බොහෝ සේ වෙනස් වුනත් ලොව පුරා වෙනස් සමාජවල දැකිය හැකි ප්‍රධාන සෞඛ්‍ය ගැටළු ඇත. මෙම ප්‍රධාන සෞඛ්‍ය ගැටළු තරුණවියේ යහ පැවැත්මට තර්ජනයක් ඇතිකරන අතර, පාසල් යා යුතු කාලයේ පාසලේ රැඳී සිටීමටත්, ඉන්පසු කාලයේදී ඔවුන්ගේ සෞඛ්‍යයටත් ඉන් බාධා ඇතිවේ. ඒවා නම්,

- මත්පැන් සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම
- පණු රෝග
- ඒඩ්ස් සහ ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග
- ප්‍රතිශක්තිකරණ ලබාදිය හැකි රෝග.
- මැලේරියාව
- මානසික ගැටළු - යුද්ධය පවතින ප්‍රදේශවල ජීවත්වීම නිසා ඇතිවන ආතතිය, නිවාස නොමැතිවීම, වැඩ කටයුතු අධික වීම, බඩගින්න, අපයෝජනය හා හිරිහැර කිරීම්.
- ක්ෂුද්‍ර පෝෂක ඌනතා - යකඩ අයඩීන්, විටමින්
- මුඛ රෝග
- ප්‍රෝටීන් ශක්ති මන්දපෝෂණය / අධිපෝෂණය
- ශ්වසන රෝග
- සනීපාරක්ෂාව මදකම
- අනපේක්ෂිත ගැබ් ගැනීම්
- අනාරක්ෂිත ජලය
- ප්‍රචණ්ඩත්වය සහ අනතුරු (ලිංගික ප්‍රචණ්ඩත්වය සහ වැඩකරන ස්ථානයේදී ඇතිවන අනතුරු)
- ඇසීම හා පෙනීම පිළිබඳ ප්‍රශ්න

මීට අමතරව පාසල මගින් කටයුතු කර සෞඛ්‍යයට පුළුල් බලපෑමක් කර සමාජයේ යහපැවැත්මට ආධාර කල හැකි සෞඛ්‍යමය අවශ්‍යතාවයක් ඇත. මූලිකත්වය දිය යුතු කරුණු සම්බන්ධ උදාහරණ පහත සඳහන් වේ.

- නොහැකිවීම හා ප්‍රතිඵල රහිතවීම සම්බන්ධව මහජනයා දක්වන ආකල්ප
- පස අපවිත්‍රවීම නිසා ආහාර සකස් කිරීමේදී ඇතිවන තර්ජන
- බිළින්දාට සහ තරුණ ළමුන්ට මානසික උද්දීපනයක් නොලැබීම
- අවුරුදු 02 ට අඩු ළමුන්ට ආහාර ලබාදීමේ වැරදි පුරුදු නිසා ඇතිවන ලෙඩ රෝග සහ මරණ

රෝහල් සායන සහ සෞඛ්‍ය නිලධාරීන් වෙත ගොස් තොරතුරු එක්රැස් කළ යුතුය. මෙම තොරතුරු සහ සංඛ්‍යාලේඛණ නොමැති නම් හෝ තිබෙන තොරතුරු යාවත්කාලීන කළ යුතු නම් පාසල් සෞඛ්‍ය කණ්ඩායමේ සාමාජිකයින්ට ඒ සම්බන්ධ සමීක්ෂණයක් මගින් හෝ සම්මුඛ සාකච්ඡා මගින්, පුද්ගලයින්ගෙන්, කණ්ඩායම්වලින්, දෙමාපියන්ගෙන්, හෙදියන්ගෙන්, ගුරුවරුන්ගෙන් සහ ප්‍රජා නියෝජිතයින්ගෙන් ප්‍රජාවට බලපාන සෞඛ්‍ය ගැටළු ගැන තොරතුරු ලබාගත හැක.

## පවත්නා නීති සහ ප්‍රතිපත්ති තක්සේරු කිරීම.

පවත්නා නීති සහ ප්‍රතිපත්ති නිසා සෞඛ්‍ය නගා සිටුවීමට ගන්නා උත්සාහයන්ට සමහර විට රුකුලක් වේ සමහරවිට බාධාවක් වේ. ජාතික, දිස්ත්‍රික්, සමාජ හෝ පාසල් නීති සහ ප්‍රතිපත්ති සෞඛ්‍යයට බලපාන අන්දම සොයා බැලිය යුතුය. උදාහරණයක් ලෙස පහත සඳහන් කරුණු ගැන දැනට තිබෙන ප්‍රතිපත්ති සලකා බලන්න.

* දරුවන් පාසලට පැමිණීමේ අවශ්‍යතාවයන්
* පිරිමි ළමුන්ට සහ ගැහැණු ළමුන්ට පාසලට යාමට සම අයිතිවාසිකම්
* ළමුන් සේවයේ යෙදවීම/ කම්කරු නීති
* ප්‍රතිශක්තීකරණ අවශ්‍යතා
* ගුරුවරුන්ට සහ කාර්ය මණ්ඩලයට ලැබෙන ප්‍රසූත නිවාඩු
* ලිංගික අපයෝජන කිරීම
* පාසලේදී, ජන ජීවිතයේදී, සේවා ස්ථානයේ කාන්තාවගේ තත්ත්වය.
* පාසලේ ඒඩ්ස් ප්‍රතිපත්තිය
* ප්‍රචණ්ඩත්වය සහ අපයෝජනය (ලිංගික, කායික, මානසික)
* මධ්‍යසාර, දුම්වැටි හා ඒ සම්බන්ධ අනෙකුත් දේ (නිෂ්පාදනය, අලෙවිකරණය, බෙදාහැරීම)

## මෙම නීති ප්‍රතිපත්ති කෙලින්ම බලපාන අන්දම.

i. ***පාසලේ දරුවන්ට***

* සෞඛ්‍යය සහ යහ පැවැත්ම පවත්වා ගැනීම සඳහා
* දරුවන්ගේ ආරක්ෂාව තහවුරු වීම
* ශිෂ්‍යයන්ගේ හැසිරීම යහපත් වීම
* ශිෂ්‍යයන් නොකඩවා පාසලට පැමිණීම
* පාසලට පැමිණීමට ඇති හැකියාව සහ උනන්දුව වැඩිවීම
* පන්ති කාමරයේ සහභාගිත්වය වර්ධනය
* වැඩි වසර ගණනක් පාසලේ ගත කිරීමට සිදුවීම
* දරුවන්ගේ ඉගෙනීම සහ අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා ඇති උනන්දුව වැඩිවීම

ii. ***ගුරුවරුන්ට සහ කාර්ය මණ්ඩලයට***

* සෞඛ්‍ය සහ යහ පැවැත්ම
* ආරක්ෂාව
* හැසිරීම
* පාසලට නොපැමිණීම
* රැකියා තෘප්තිය සහ කාර්ය මණ්ඩලය සේවයට පැමිණීම
* චිත්ත ධෛර්යය
* ප්‍රජාව සමග සම්බන්ධ වී කටයුතු කිරීම.
* ඉගැන්වීමේ ගුණාත්මක භාවය

**සමාජයට**

* පුද්ගලයින්ගේ සහ පවුල්වල සෞඛ්‍ය සහ යහපැවැත්ම
* ආර්ථික ශක්තිය සහ රැකියා අවස්ථා
* ආරක්ෂාව
* රෝග පැතිරීම
* සෞඛ්‍ය නීති ක්‍රියාත්මක කිරිම හා සමාජ සේවා
* ප්‍රජා සහභාගිත්වයට ඇති අවකාශයන්

## සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල්වල ඇති ප්‍රධාන ලක්ෂණ 06

1. සෞඛ්‍ය, අධ්‍යාපන සහ ප්‍රජා නායකයින් සහභාගි කරගැනීම ප්‍රජාවේ සෞඛ්‍ය නගා සිටුවීම
2. ආරක්ෂා සහිත සෞඛ්‍යමත් පරිසරයක් ඇති කිරීම (භෞතික හා මනෝ සාමාජයික)
3. නිපුණතා පදනම් කරගත් සෞඛ්‍ය අධ්‍යාපනයක් ලබාදීම
4. සෑම මට්ටමකම සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති ඇතිකර ගැනීම
5. සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති සහ පුරුදු ක්‍රියාත්මක කිරිම
6. සෞඛ්‍ය සේවාවන් පහසුවෙන් ලබගත හැකි අවස්ථා සැලසීම

## සම්පත් තක්සේරු කිරිම

ප්‍රජාවේ තිබෙන සම්පත් සම්බන්ධව ඇගයීමක් කිරීම තුලින් දැනටමත් ක්‍රියාත්මක සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩ සටහන් සහ ඒවා ක්‍රියාත්මක කරන අය සම්බන්ධවත්, පාසල සමග සම්බන්ධ වී වැඩ කිරිමට කැමැත්තෙන් සිටින අය පිළිබඳවත් දැනගැනීමට ලැබේ.

**<u>සිතාබැලිය යුතු කරුණු :</u>**

* සායන රෝහල් සහ සෞඛ්‍ය සේවා සපයන්නන්
* ළදරුවන්ගේ සෞඛ්‍ය, ළමා පෝෂණය, පවුල් සැලැස්ම, එච්.අයි.වී වැලැක්වීම,
* ආරක්ෂාව සහ වෙනත් මහජන සෞඛ්‍ය වැඩ සටහන්
* දෙමව්පිය අධ්‍යාපනය සහ දෙමව්පිය සෞඛ්‍ය ප්‍රවර්ධන ව්‍යාපෘති
* ජාතික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩ සටහන්
* රාජ්‍ය නොවන සංවිධානවල සහ අන්තර් ජාතික ආයතනවල ව්‍යාපෘති

දැනට තිබෙන්නා වූ සම්පත් ප්‍රයෝජනයට ගැනීම යලි සකස් කිරීමෙන්, මූලිකත්වය දිය යුතු කරුණු යලි සලකා බැලීමෙන් සහ සම්ප්‍රදායික වශයෙන් වෙන් වෙන්ව පවත්නා වූ වැඩ සටහන් ඒකාබද්ධ කිරීමෙන්, සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලකට සෞඛ්‍ය හා ඉගෙනීම යන ද්විත්ව අරමුණු වෙනුවෙන් එම පාසලට ඇති කැපවීම ප්‍රදර්ශනය කල හැක.

මෙහි සඳහන් කර ඇති ප්‍රධාන ලක්ෂණ 05 තුල ප්‍රජාවට කුඩා පියවරවල් ගත හැක. මෙම පියවර ගැනීම තුළින් ඊට වඩා විශාල පරමාර්ථවලට යාමට අවස්ථාව සැලසේ. තනි ක්‍රියාවන්ට වඩා පොදු පරමාර්ථයන් ඉලක්ක කරගත් උපාය මාර්ග කිහිපයක් සම්බන්ධ කර ගැනීම තුළින් සාර්ථක ප්‍රතිඵල ලැබේ. උදාහරණයක් වශයෙන් පාසල් පෝෂණ වැඩ සටහන්, පෝෂණ අධ්‍යාපනය සහ ප්‍රජා සහභාගිත්වය සමග තදින් සම්බන්ධ වේ. මෙම වැඩ සටහන් සාර්ථක වන්නේ සනීපාරක්ෂක පහසුකම් උසස් මට්ටමක තිබීම හා හොඳ සෞඛ්‍ය පුරුදු තිබේ නම් පමණකි. ප්‍රජනක සෞඛ්‍යය අධ්‍යාපනය සාර්ථක වන්නේ පාසල් පරිසරයේ පිරිමි සහ ගැහැණු සම තත්වයේ සලකන්නේ නම් හා සමාජ ආචාර ධර්ම තුල ලිංගික කාර්යයන් ප්‍රමාද කිරීමට අනුග්‍රහයක් දක්වන්නේ නම් පමණකි.

ප්‍රජාවට පාසල් වැඩ සටහන්වලට සහයෝගය ලබාදී ඒවා ශක්තිමත් කර බොහෝ ප්‍රජා ව්‍යාපෘතිවලදී පාසලට සම්පත්දායකයකු ලෙස ක්‍රියා කිරීමටත්, අවස්ථාව සැලසේ. වෙනස් කල යුතු ක්ෂේත්‍රයන් සම්බන්ධ සලකා බැලීමේදි අලුතින් ජනතාව පුහුණු කිරීම හා අලුත් ව්‍යාපෘති සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට සහ කුසලතා ඇතිකර ගැනීමට කල්පනා කල යුතුයි.

## ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරගන්නේ කෙසේද?

සෞඛ්‍යයට සම්බන්ධ අවශ්‍යතාවයන් සම්බන්ධ දැනුම හා තොරතුරු ලැබුණු පසු හා පාසලේ සහ සමාජයේ ඇති අවස්ථාවන් දැනගත් පසු මීළග පියවර විය යුත්තේ චර්යාවන් වෙනස් කිරීම සඳහා වැඩ සටහන් සකස් කිරිමයි. මෙයින් ප්‍රමුඛතාවය දිය යුත්තේ කුමන කරුණකටද? එය කරන්නේ කෙසේද? යන ප්‍රශ්නවලට පිළිතුර නම්, ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමයි. (පරමාර්ථ, අරමුණු හා ක්‍රියාකාරකම්)

## පරමාර්ථ සැකසීම.

ලැබී ඇති තොරතුරු මත සෞඛ්‍ය ඇති කිරීම සඳහා ඇති අවස්ථා ගැන ඔබ ඉගෙන ගත යුත්තේ කුමක් ද? මුලින් ක්‍රියාවට නැගිය යුත්තේ කුමක්ද? ඔබ සාර්ථක නම් අපගේ පාසල සහ ප්‍රජාව වසරකින් ක්‍රියාවට නැංවීමට බලා සිටින්නේ කුමන කරුණුද? වසර 03 කින් ක්‍රියාවට නංවන්නේ කුමන කරුණු ද?

පාසලේත්, ප්‍රජාවේත් ප්‍රධාන පුද්ගලයින්ද, ප්‍රජා උපදේශක කමිටුවේ සාමාජිකයින්ද සහභාගී කරගෙන ඔවුන්ගේ මනස සකස් කිරීම සඳහා වැඩමුළු කිහිපයක් සංවිධානය කල යුතුය. ප්‍රජාව වැදගත් යයි එකඟවන පරමාර්ථ සම්බන්ධව අවධානය යොමුකර පරමාර්ථ ලැයිස්තු කෙටිකර ගැනීමට උත්සාහ කළ යුතුයි.

පරමාර්ථ ළඟා කර ගැනීමට අරමුණු අවශ්‍යය. අරමුණු හරිහැටි විස්තර විය යුතු අතර එය ලබාගෙන තිබේදැයි සොයා බැලීමට ක්‍රම තිබිය යුතුයි.

මෙවලම 3.1 හි ඇති පරමාර්ථයන්ගෙන් 01 ක් මුලින් තෝරාගන්න. මෙවලම 3.2 හි ඉහලින්ම පරමාර්ථය ලියන්න.

ඔබේ අරමුණු නිශ්චය කර ගැනීමට මෙවලම 2.3. බලන්න.

ඔබේ පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා දැනට පවතින වැඩ සටහන් හා සම්පත් පිළිබඳව සාකච්ඡා කළ යුතුය. (මෙවලම 2.1 බලන්න) අපට උදව් විය හැකි හෝ වෙනස් කල යුතු ප්‍රතිපත්ති සම්බන්ධව සහ ප්‍රජාවේ ඇති ළඟාකර ගත හැකි සම්පත් පිළිබඳවද විමසා බැලිය යුතුය. පරමාර්ථ මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය අරමුණු පාසලෙන් යෝජනා කරන්නේ දැයි සැලකිලිමත් විය යුතුයි.

පරමාර්ථ 1 ක් හෝ 2 ක් සම්බන්ධව ක්‍රියාක්මක වීමට ආරම්භයේදී ඔබට අවස්ථාව ලැබුනත් සාර්ථකව ළඟා කරගන්නා එක් එක් පරමාර්ථ නිසා විශ්වාසය වර්ධනය වන අතර ඉදිරි කටයුතු සඳහා ඉන් ධෛර්යයක්ද ලැබේ.

සෑම අරමුණක්ම ක්‍රියාත්මක කිරීම සඳහා ගන්නා පියවර පිළිබඳව විමසා බැලිය යුතුය. මෙම පියවර අතරින් 1 වසර 2 වසර හා 3 වසරේදී ක්‍රියාත්මක කරන්නේ කුමක් දැයි තීරණය කළ යුතුය. තවත් පරමාර්ථ තිබේ නම් ඒවා වසර 3 වනතුරු ක්‍රියාත්මක නොවුනත් සැලැස්මට ඇතුලත් විය යුතු දැයි තීරණය කළ යුතුය.

සැළැස්ම ඇගයීමකට ලක්කර පවරාදීම් කෙසේ කළ යුතු දැයි පාසල් බලධාරීන් සමග සාකච්ඡා කළ යුතුය. 1 වන වසරේදී ක්‍රියාත්මක වන පියවරයන්ට වගකිව යුත්තේ කවුරුන්ද? ජනතාවගේ කුසලතා සහ පළපුරුද්ද මෙම පියවරයන් සමග සම්බන්ධ කිරීමට උත්සාහ කල යුතුය. සමහර විට ප්‍රජා උපදේශක කමිටුවේ සාමාජිකයින්ට සමහර පියවරවලට උදව් කිරීමට හැකිවනු ඇත. පාසල් සෞඛ්‍ය කණ්ඩායමටත්, පාසල් උපදේශක කමිටුවටත්, අන් අයටත් ලබාදෙන වගකීම් නියමිත පරිදි පැහැදිලි කරදීම අත්‍යවශ්‍යය. එවිට කළ යුතු කාර්යයන් පිළිබඳව සියලු දෙනාම දැනුවත් වන අතර, ඒ ඒ කාර්යයන් ඉටුකරන්නේ කවුරුන් දැයි දැනුවත් වනු ඇත.

මුදල් ප්‍රතිපාදන සහ අවශ්‍ය සහයෝගය ලබාගැනීම පිළිබඳව විමසා බැලිය යුතුය. සැලසුම්කරුවන් සහ අධ්‍යාපන නිලධාරීන් සමහර අස්ථාවන්හිදී සෞඛ්‍ය ප්‍රවර්ධනය පාසැල් කටයුතුවලින් පරිබාහිර අමතර කටයුත්තක් ලෙස සලකා පාසල් සෞඛ්‍ය වැඩ සටහන්වලට මුදල් ප්‍රතිපාදන වෙන් නොකරති. මෙය සෑම පාසලකටම පාහේ මුහුණ දීමට සිදුවන කාලීන අභියෝගයකි. බොහෝ සෞඛ්‍ය ප්‍රවර්ධන ආරම්භක වැඩ සටහන්වලට පවත්නා අයවැයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමට හැකිවන අතර, එමගින් එය කාර්ය මණ්ඩලයේ දැනට පවත්නා වගකීම් හා බද්ධ වේ. ඉතිරි ඒවාට අමතර මුදල් ප්‍රතිපාදන අවශ්‍ය වනු ඇත. සැලසුම් සකස් කරනුයේ පාසල් මට්ටමිනි මේ නිසා එම ක්‍රියාකාරකම් ඇතුලත් කිරීමේ වගකීම පාසල සතුය. පාසල් මට්ටමේ සැලසුම් සකස්කිරීමේදී ඒ පිළිබඳව සැලකිල්ල යොමුකර ක්‍රියා කල යුතුයි

පාසල් අයවැයට අමතරව මුදල් ප්‍රතිපාදන අවශ්‍ය වන අවස්ථාවන්හිදී පහත ක්‍රියාවන් සම්බන්ධව අවධානය යොමු කළ හැකිය.

* ප්‍රජාවෙන් ආධාර ලබා ගැනීම (උදා: වියදමට හවුල්වීම, පරිත්‍යාගයන් සහ තාක්ෂණික සහයෝගය)
* මුදල් සොයා ගැනීමේ ව්‍යාපෘති/දින යොදාගෙන තෝරාගත් ව්‍යාපෘති සඳහා සියළු දෙනාම එකතු වී මුදල් සොයා ගැනීම.
* පාසලට ආදායම් ලැබෙන ක්‍රියාවන් සංවිධානය කිරීම, සෞඛ්‍යවත් ක්‍රමානුකූල ආහාර සකස් කර විකිණීම

* පෞද්ගලික ආයතන සමග සහයෝගයෙන් හවුල් ව්‍යාපාර ආරම්භ කිරීම
* ජාත්‍යන්තර ආයතනවල සහයෝගය
* ශක්තිය, කුසලතාවය හා කාලය පරිත්‍යාග කල හැකි ස්වේච්ඡා නිලධාරීන් සොයා ගැනීම

## සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් වැඩසටහන ඇගැයීම

සම්බන්ධ වූ සියළු දෙනාගේම කැපවීම දිගටම පවත්වාගෙන යාමට නම් සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් මගින් තම පරමාර්ථ මුදුන්පත් කර ගැනීමේ ප්‍රගතිය අන් අයට ඒත්තු යන සේ ප්‍රදර්ශනය කළ යුතුය. කණ්ඩායමේ උත්සාහයන් (වැඩ කටයුතු) පිළිබඳව නිතිපතා කරන ඇගයීම් මගින්,

* ඔබේ අනාගත වැඩ පිළිවෙලට මග පෙන්වීමට වැඩ සටහන් හා තොරතුරු ලබා ගත හැකිය.
* ඔබේ පාසලේ ප්‍රගතිය උත්සවාකාරයෙන් ප්‍රදර්ශනය කළ යුතුයි, ප්‍රචාරය කළ යුතුයි.
* ඔබේ කණ්ඩායම අනුගමනය කල ක්‍රියා පරිපාටිය අන් අයට පෙන්වීමෙන් ඒ අයට පළපුරුද්දක් ලැබෙනු ඇත.

වෙනස්වීම් සඳහා භාවිතා කල පියවර සහ ක්‍රියාවලිය සම්බන්ධ අන් අයට පෙන්වීමට පාසල් සෞඛ්‍ය කණ්ඩායම තොරතුරු එක්රැස් කල යුතුයි. පහත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට හැකිවන සේ තොරතුරු එක්රැස් කළ යුතුයි.

i. කොපමණ ජනතාවක් සහභාගී වුනා ද?
ii. කොපමණ ජනතාවකට ප්‍රයෝජනයක් ලැබුනා ද?
iii. බලාපොරොත්තු වූ පියවර සත්‍ය වශයෙන්ම සිදු වුනාද? එසේ නොවේ නම් එයට හේතුව?
iv. බලාපොරොත්තු නොවූ යම් දෙයක් සිදුවුනා ද?
v. සහභාගී වු හා ප්‍රයෝජනයක් ලැබූ ජනතාව වැඩ සටහන ගැන කුමක් සිතන්නේ ද?
vi. ප්‍රයෝජනයට ගත් සම්පත් මොනවාද? ඒවා ප්‍රමාණවත් වූයේද?
vii. ක්‍රියාකාරී සැලැස්ම වැඩිදියුණු කළ හැක්කේ කෙසේද?

සම්බන්ධ වූ අය උපයාගත් දේ කතන්දර අනුසාරයෙන් දැනගන්න ඔවුනට ලැබුණු ප්‍රතිලාභ කවරේද? ඔවුන් ඉගෙන ගත් පාඩම් මොනවා ද?

### <u>ප්‍රතිඵල තක්සේරු කිරීම.</u>

මෙය විස්තර සහිතව සහ දීර්ඝකාලීනව කරන විමසා බැලීමකි. එමගින් වැඩ සටහන නිසා පෞද්ගලික හැසිරීම් රටාවේත්, පරිසරයේත් ඇතිවී ඇති වෙනස්කම් හා පාසල් දරුවන්ගේත්/ප්‍රජාවේත් සෞඛ්‍ය දියුණුව විමසා බැලේ. මේ අන්දමේ විමසා බැලීමකදී සිදුවිය යුත්තේ, සෞඛ්‍ය තත්වයන් පිළිබඳව හා ප්‍රජාවේ සම්පත් පිළිබඳව මුලින් කරන ලද තක්සේරු දත්තයන්, අලුත් දත්තයන් සමග සංසන්දනය කර බැලීමයි. වෙනස්කම් ඇතිවීමට ප්‍රථම තත්වය ලේඛණ ගතකර වෙනස්කම් ඇතිවන විට එම අවස්ථාවන් සටහන් කල යුතුයි. ඔබේ ව්‍යාපෘතිය නිසා ලබා ඇති ප්‍රගතිය පෙන්වීමට මෙම තොරතුරු තබාගත යුතුයි.

ඔබ ප්‍රතිඵල තක්සේරු කිරීමට තීරණය කර ඇත්නම් එය මුල සිටම සැලසුම් කල යුතුය. එසේ කල යුත්තේ විශේෂිත මැන බැලිය හැකි අරමුණු ඇති කිරීමෙනි. දිස්ත්‍රික් සහ ජාතික නියෝජිතයින්, විශ්ව විද්‍යාල හෝ රාජ්‍ය නොවන සංවිධානවල සමහර විට ප්‍රයෝජනවත් සම්පත් තිබෙන්නට පුලුවන. සමහර විට ඔවුන් උදව් කිරීමට කැමති වීමටත් ඉඩ තිබේ.

## තොරතුරු රැස් කිරීම.

ඔබේ උත්සාහයන් ලේඛනගත කිරීමට ලිඛිත තොරතුරු තිබීම අවශ්‍යවේ. මෙම මාර්ගෝපදේශක සංග්‍රහයේ ඇති වැඩ සටහන් පත්‍රිකා අනුව පරීක්ෂා කළ යුතු වැඩ ලැයිස්තුව සකස් කල යුතුයි. මෙහි පියවර පරීක්ෂා කර ඔබ ක්‍රියාවලියක් සම්පූර්ණ කළ බව පෙන්වන්න. අනෙක් තොරතුරු ලබාගත හැකි ප්‍රභවයන් සහ මූලාශ පහත සඳහන්ය.

* වැදගත් කරුණු සටහන් කල කණ්ඩායමේ සාමාජිකයින්ගේ දිනපොත් හෝ ලොග් පොත්
* රැස්වීම්වල වාර්තා
* කුඩා සමූහ සාකච්ඡාවල වාර්තා
* ඔබ අන් අයගෙන් විමසන ප්‍රශ්න මාලාව (මෙය සරල විය යුතුයි)
* වැඩ සටහන සමග සම්බන්ධ වූ අය සමග කරන ලද සාකච්ඡා හෝ වැඩ සටහන නිසා වෙනසකට ලක් වූ අය
* සිදුවූ දේ සම්බන්ධ චිත්‍රයක් හෝ සැලැස්මක්
* මාධ්‍ය වාර්තා - පුවත්පත් වාර්තා, සඟරා, පත්‍රිකා වැනි දේ - (ඔබේ ක්‍රියාවන් ඇතුළත් කර ඇති)
* දරුවන්ගේ හෝ යොවුන් වියේ අයගේ වැඩ කටයුතු.

## අපට ප්‍රශ්න තිබේනම් හෝ උදව් අවශ්‍ය නම් අපට යා හැක්කේ කොතනකටද?

## පුහුණුව සහ තාක්ෂණික සහාය ලබාගැනීම.

සෞඛ්‍ය ප්‍රවර්ධනයේ සංකල්ප, පරමාර්ථ සහ කුසලතා සම්බන්ධ පුහුණුව තුළින් පාසල් කාර්ය මණ්ඩලයට හා ප්‍රජා සාමාජිකයින්ට සාර්ථක ප්‍රතිඵල ලැබේ. පුහුණුව නිසා දැනුම සහ හැකියාව වර්ධනය වේ, කැපවීම ඇති කරයි, පුහුණුව ලබන්නන් අතර සම්බන්ධතාවය වැඩි කරයි. මෙයින් සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් වැඩසටහනට ශක්තියක් ලැබේ. විශේෂිත ගැටලු සම්බන්ධව ක්‍රියා කිරීමට, ක්‍රියාකාරී සැලසුම් ඉදිරියට ගෙන යාමට, අරමුණු ලඟා කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට සහ ප්‍රගතිය තක්සේරු කර බැලීමට පාසල් සෞඛ්‍ය කණ්ඩායමට ඇති ශක්තිය මෙයින් වර්ධනය වේ.

එක් එක් පාසල් අවශ්‍යතාවයන් අනුව සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල්වල ප්‍රධාන ලක්ෂණ සම්බන්ධව පුහුණු කිරීම, විශේෂිත විෂය මාලාවක් සකස් කිරීම, සමස්ථ කුසලතා වර්ධනය, අලුත් තාක්ෂණික සංවර්ධනය හෝ වෙනත් මාතෘකා අවශ්‍ය වනු ඇත. සමහර සෞඛ්‍ය තේමාවන් බොහෝ විට විවාදයට භාජනය වන හෝ හැඟීම් දනවන ඒවාය. ගුරුවරුන් සහ වෙනත් සෞඛ්‍ය කාර්ය මණ්ඩල බොහෝ විට දරුවන්ගේ

කුසලතා වර්ධන කටයුතු පුහුණු කිරීමෙන් සහ මේ හැඟීම් දනවන තේමාවන් සම්බන්ධව ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමෙන් ප්‍රතිලාභ ලබති.

ගුරුවරුන්ට ලබාදෙන පුහුණුව මගින් පන්ති කාමරයේ නිර්මාණ කටයුතු ද විෂය මාලා ඉගැන්වීමේ කටයුතු ද සම්බන්ධව ඔවුන්ගේ කුසලතා ද වැඩිදියුණු වේ. මෙය තවදුරටත් ඉවහල් වන්නේ විෂය මාලාවේ අලුත් තොරතුරු අඩංගු වනවිටද ඔවුන් ඉගෙනගත් කරුණු ක්‍රියාවට නැංවීමට අවස්ථාවක් ලැබෙන විටදීය. අනෙකුත් කාර්ය මණ්ඩලයත්, දෙමව්පියන්ටත්, ප්‍රජාවේ සාමාජිකයින්ටත් පුහුණුව මගින් පොදු තේමාවක් ලැබෙන අතර සංකල්ප හුවමාරු කර ගැනීමටත්, විශාල වැඩ කරන කණ්ඩායමක් ගොඩ නගා ගැනීමටත් අවස්ථාව ලැබේ.

## <u>ප්‍රාදේශීය වැඩ සටහන් ජාතික මට්ටමේ වැඩ සටහන සමග සම්බන්ධ කිරිම ?</u>

සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල ගොඩනැගීමේ කටයුතුවලට සම්බන්ධ වී සිටින වෘත්තිකයින්ටත්, රැකියාවල නියුතු වන්නන්ටත්, දෙමව්පියන්ටත්, තරුණයින්ටත්, අනෙකුත් ප්‍රාදේශීය නායකයින් සමග බෙදා හදා ගැනීමට තොරතුරු, අත්දැකීම් හා අදහස් ඇත. සමහර රටවල්වල ජාතික හා පළාත් කාර්ය මණ්ඩලය ද ප්‍රාදේශීය සංවර්ධනයට හා සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල්වල වැඩසටහන වෙනුවෙන් කැපවීමට උදව් ලබාදෙන අතර සමහර විට සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් පරිසරයක් බවට පත්වීමට උත්සාහයක් දරන ප්‍රාදේශීය පාසල් අතර සන්නිවේදන ජාලයක්ද ඇති කරයි. ලෝක සෞඛ්‍ය සංවිධානය ජාත්‍යන්තර සහ කලාපීය සන්නිවේදන ජාලයන් මගින් තොරතුරු ප්‍රචාරය කිරීමටත්, සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් ඇති කිරීම සඳහා සහයෝගය වර්ධනය කිරීමටත් ක්‍රියා කරයි.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ සෞඛ්‍යමත් නගර වැඩ සටහන මගින්ද සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් සංවර්ධනය කිරීම සඳහා ආධාර සැපයේ. එමගින් සාමූහික උත්සාහයක් තුලින් පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන පුළුල්ව පවත්වාගෙන යාමට සවිමත් අඩිතාලමක්ද ඇතිවේ.

දිස්ත්‍රික් සහ ජාතික මට්ටමේ ප්‍රතිපත්තිවලින් අවශ්‍ය සහයෝගය හා දිරිගැන්වීම් ලැබෙන්නේ නම් පාසල්වල ඇතිවන වෙනස්කම් කල් පැවතීමට ඉඩ ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයේ බටහිර පැසිපික් කලාපයේදී ජාතික හා දිස්ත්‍රික් මට්ටමේ දෙපාර්තමේන්තු සෞඛ්‍ය ප්‍රවර්ධනයේ කඩඉම් ළඟාකර ගත් පාසල් ප්‍රසිද්ධියේ පිළිගෙන ඒවාට සහතික පත්‍ර ප්‍රදානය කරයි. ලබාදී ඇති නිර්නායක අනුව එම පාසල් වලට ලෝකඩ, රිදී හෝ රත්තරන් පදක්කම් ප්‍රදාන දිනාගත හැක. එවැනි දිරිගැන්වීම් ඔබේ කාලයේදී ලබාදී තිබේදැයි සොයා බැලිය යුතුය. එසේ ලබාදී නැත්නම් ඒවා ඇති කිරීමට ක්‍රියා කළ යුතුයි. එයට හේතුව යම් මට්ටමක පිළිගැනිමක් එමගින් ලැබෙන නිසා ජනතාව එම ප්‍රතිඵල ලබාගැනීමට උනන්දු වීමයි.

# 4 වන පරිච්ඡේදය.

## පළාත් ප්‍රාදේශීය දිස්ත්‍රික් මට්ටමේ නායකයින්ට පණිවිඩයක්.

ඔබ ප්‍රාදේශීය මට්ටමේ සේවය කරන්නේ නම් ඔබට ප්‍රාදේශීය මට්ටමේ වැඩ සටහන් වලට වැදගත් අයුරින් උපකාර කල හැක. ඔබේ දෙපාර්තමේන්තුව තුළ සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල්වලට උපකාර කිරිමට වැඩ සටහනක් සකස් කල හැක. එමගින් සෞඛ්‍ය හා අධ්‍යාපන කණ්ඩායම් අතර සබඳතාවය වර්ධනය කළ හැක. ඔබ විශේෂයෙන් ඒ සම්බන්ධව කරන කටයුතු භූගෝලය, සන්නිවේදන පහසුකම්, සිටින කාර්ය මණ්ඩලය එක් එක් පාසල් සමග ඔබේ ඇති සම්බන්ධතාවය සහ ප්‍රාදේශීය, පළාත් සහ ජාතික මට්ටමේ ජාලයක් තිබීම වැනි කරුණු මත පදනම් වනු ඇත. ඔබේ උපකාරය අනුව පාසල්වලට පහත සඳහන් ප්‍රතිලාභ ලැබීමට හැකිවනු ඇත.

## පාසල්වලට ආරම්භයක් ලබාදීම සඳහා ප්‍රාදේශීය/පළාත් කාර්ය මණ්ඩලයට කල හැකි දේ.

* සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල්වලට සහයෝගය ලබාගත හැකි පළාත් ප්‍රතිපත්ති සම්බන්ධව දැනුවත් කිරිම
* ප්‍රාදේශීය පාසල්වල වැඩ සටහන්වලට සහයෝගයක් ලැබෙන ලෙස පළාත් ප්‍රතිපත්ති, ත්‍යාග, දිරිගැන්වීම්, කෘතඥතාවය පලකිරීම් වර්ධනය කිරීම
* සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල්වල සංවර්ධනයට සහයෝගය ලබාදීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරිම
* ප්‍රාදේශීය පාසල්වල පාසල් සෞඛ්‍ය කණ්ඩායම් සහ ප්‍රජා උපදේශක කමිටු ඇති කිරීමට සහයෝගය ලබාදීම
* සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල්වල ප්‍රධාන ලක්ෂණ සවිමත් කර සමාජයේ ඒවා ප්‍රචලිත කිරීම,
* පාසල්වලට පැහැදිලි දර්ශනයක් ඇතිකර ගැනීමට උපකාර කිරීම
* ප්‍රාදේශීය සෞඛ්‍ය ගැටළු සම්බන්ධව සහ අවදානම් හැසිරීම් සම්බන්ධව සංඛ්‍යා ලේඛණ ලබාදීම
* පළාත තුළ ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
* ප්‍රාදේශීය පළාත් හා ජාතික සන්නිවේදන ජාලයන්ට පාසල් සම්බන්ධ කිරීම.
* ප්‍රාදේශීය පාසල්වල වැඩ සටහන්වලට උපකාර වන ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙවලම් සහ ප්‍රකාශන බෙදාදීම.

## තාක්ෂණ සහාය සහ උපකාර ලබාදීමට දිස්ත්‍රික් කාර්ය මණ්ඩලවලට කල හැකි දේ.

* සැලසුම් කිරීමෙන් සහ අයවැය සකස් කිරීමෙන් පාසල් සෞඛ්‍ය කණ්ඩායම්වලට ආධාර කිරීම
* ප්‍රාදේශීය මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පාසල්වලට ආධාර කිරීම
* ආදර්ශ වැඩ සටහන් හඳුනාගෙන පාසල් අතර සම්බන්ධතාවය ඇති කිරීමට දිරිගැන්වීම තුලින් වඩා හොඳ ප්‍රතිඵල ලබාදීම
* ප්‍රාදේශීය වශයෙන් හෝ පළාත් වශයෙන් සේවයේ යෙදී සිටියදී සපයන පුහුණුවීම් සංවිධානය කිරීම තුළින් වෘත්තීය සංවර්ධනය ඇතිකිරීමට උපකාර කිරීම

* වැඩ සටහනට සම්බන්ධ වන පාසල්වලට සම්පත් දායකයින් ලබාදීම තුළින් සහයෝගය ලාබදීම
* ප්‍රාදේශීය පාසල් සන්නිවේදන ජාලයට ඇතුළත් කිරිම
* අවශ්‍ය නම් කලාපීය සහයෝගීතාවය ලබාදීමට කණ්ඩායම් සුදානම් කිරීම.
* ජාතික ප්‍රතිපත්ති සම්පාදකයින්ට හා අධ්‍යාපන, සෞඛ්‍ය අමාත්‍යාංශවල නිලධාරීන්ට පාසල් සම්බන්ධ කිරිම
* ජාත්‍යන්තර සම්බන්ධතා ඇතිකර ගැනීමට උපකාර කිරීම

## ප්‍රාදේශීය වැඩ සටහන් ඇගයීමට උපකාර කිරිමට, පළාත් කාර්ය මණ්ඩලවලට කල හැකි දේ.

* පළාත් /ජාතික මට්ටමේ ඇගයීම් සඳහා දර්ශක සකස් කරන්න.

* පළාත්/ජාතික මට්ටමේ ඇගයීමක් ආරම්භ කිරීමට හෝ සංවිධානයට කටයුතු කිරීම.

* ඇගයීමට සහයෝගය හා විශේෂඥ සහාය ලබාදීමට කටයුතු කිරීම.

* සියළු ප්‍රාදේශීය ව්‍යාපෘති සම්බන්ධව විමසා බැලීමට වගබලා ගැනීම.

# 5 වන පරිච්ඡේදය.

## වැඩදායක පාසල් සෞඛ්‍ය වැඩ සටහනක් සඳහා සම්පත් යොමු කිරීම.

සෙනෙගල්හිදී 2000 අප්‍රේල් මාසයේදී පවත්වන ලද ලෝක අධ්‍යාපන සංසදයේදී ලෝක සෞඛ්‍ය සංවිධානය, එක්සත් ජාතින්ගේ ළමා අරමුදල, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන වැඩ සටහන සහ ලෝක බැංකුව, වැඩදායක පාසල් සෞඛ්‍ය වැඩ සටහන් සඳහා සම්පත් යොමු කිරිමට එක්ව කටයුතු කිරිමට තීරණය කළහ. එම සංවිධාන එසේ කිරීමේදී එම පාසල්, ළමා මිතුරු පාසල් බවට පත්වේ. උදාහරණයක් වශයෙන් දරුවන්ට මිතුරු සහ ආදරය දනවන ඉගැන්වීමේ පරිසරයක් ඇති දරුවන්ට සෞඛ්‍යමත්, දරුවන්ට ඵලදායී, දරුවන්ට ආරක්ෂාකාරී පාසල් ළමා මිතුරු සහ සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් ඇතිකිරීමේ වැදගත් පියවරක් වන්නේ ඵලදායී පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමයි.

ලෝක සෞඛ්‍ය සංවිධානය, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන වැඩ සටහන සහ ලෝක බැංකුවේ අත්දැකීම්වලට අනුව ඔවුන් යෝජනා කරන්නේ අධ්‍යාපන, සෞඛ්‍ය සේවකයින්, ගුරුවරුන්, පාසල් දරුවන්, දෙමව්පියන් සහ ප්‍රජාවේ සාමාජිකයින් එකට එක්ව ඵලදායී පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කල යුතු බවයි. එම වැඩ සටහන් පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත විය යුතුයි.

1. ***සෞඛ්‍යයට සම්බන්ධ පාසල් ප්‍රතිපත්ති***
2. ***ආරක්ෂිත, සුරක්ෂිත, කායික හා මනෝ සාමාජයික පරිසරයක් ඇති කිරිමට ප්‍රථම පියවර වශයෙන් ජලය සහ පරිසරය සම්බන්ධව ක්‍රියා කිරිම.***
3. ***දැනුම, ආකල්ප, ප්‍රතිලාභ සහ ජීවන කුසලතා සම්බන්ධව අවධානය යොමුකර ආකල්ප පදනම් කරගත් සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම තුළින් ධනාත්මක සෞඛ්‍යයට බලපාන තීරණ ගැනීම හා ඒ අනුව කටයුතු කිරිම***
4. ***සෞඛ්‍ය හා පෝෂණ සේවාවන්ට පහසුවෙන් ලඟාවීමට හැකිවීම හෝ සම්බන්ධකම් පැවැත්වීම.***

සෑම පාසලකටම මෙම අංගයන් සියල්ලම සපුරා තිබිය යුතුය. මෙය සඵලමත් පාසල් සෞඛ්‍ය වැඩසටහනක් ඇතිකිරීමේ ආරම්භක පියවරයන්ය. එමගින් ළමා මිතුරු පාසල් වර්ධනය කිරීමේ පුළුල් ක්‍රියාවලියට ඉඩ සැලසේ.
ලෝක සෞඛ්‍ය සංවිධානය විවිධ දෙපාර්තමේන්තු කලාපීය කාර්යාල මගින් පාසල් සෞඛ්‍ය වැඩ සටහන ශක්තිමත් කරයි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ජාත්‍යන්තර පාසල් සෞඛ්‍ය වැඩ සටහන මගින් සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල්වලට ආධාර සැපයීමේ වැඩ සටහන උපාය මාර්ග 04 කින් සමන්විතය.

### *01. පර්යේෂණ*

පර්යේෂණ ඇගයීම හා විශේෂඥ උපදෙස් විශ්ලේෂණය කර පවත්වාගෙන යාම තුළින් පාසල් සෞඛ්‍ය වැඩ සටහනෙහි තත්ත්වය සහ ඵලදායීතාවය විස්තර කිරීම.

### *02. උපදෙස් දීම සඳහා අවස්ථාවන් වර්ධනය කිරීම.*

අනෙකුත් එක් එක් ජාතීන්ගේ සංවිධාන හා කොටස්කරුවන් සමග එක්ව පර්යේෂණ තොරතුරු ප්‍රසිද්ධියට පත් කිරීම, එමගින් වඩා ඵලදායී පාසල් සෞඛ්‍ය වැඩ සටහන් සම්බන්ධව උපදෙස් දීමට මහජනතාවට රුකුලක් ලැබේ.

### *03. ජාතික හැකියාවන් ශක්තිමත් කිරීම.*

සෞඛ්‍ය හා අධ්‍යාපනය අතර සම්බන්ධතාවය ඇතිකිරීම තුළින් රටවල්වලට පාසල් මගින් සෞඛ්‍ය වැඩිදියුණු කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ශක්තිය සහ ආධාර උපකාර ලැබේ.

### *4. සංවිධාන සහ සන්නිවේදන ජාලයක් ඇතිකිරීම*

සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් වැඩිදියුණු කිරීමේ ජාලයක් ආරම්භ කළ යුතුයි. ජාත්‍යන්තර අධ්‍යාපන ආයතන සමග සන්ධාන ගතවීම වැනි පියවර මගින් සන්ධාන ජාලයක් ඇතිකල යුතුයි. එමගින් ලොව පුරා ගුරුවරුන්ගේ වෘත්තීය සමිතිවලටත් එක් එක් ජාතීන්ගේ නොයෙකුත් සංවිධාන වලටත් පාසල් මගින් සෞඛ්‍ය දියුණු කිරිමට අවස්ථාව සැලසේ.

## මෙවලම 01

# සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් : ක්‍රියාකාරකම් සඳහා අවස්ථාවන් සොයා බැලීම

(ගැලපෙන ක්‍රියාකාරකම් තුළ ☑ ලකුණ යොදන්න)

## <u>ප්‍රධාන ලක්ෂණය - 1</u> - සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් සෞඛ්‍යය අධ්‍යාපන හා ප්‍රජා නායකයින් සම්බන්ධ කර ගනියි.

***<u>අරමුණ</u>***

පාසලේ පැවැත්ම සඳහා පවුලේ සහ ප්‍රජාවේ දායකත්වය අපි අගය කරමු.

**<u>ක්‍රියාකාරකම්</u>**

- සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා තීරණ ගැනීමේදී පවුල් දායක කරගනී
- අපේ පාඨමාලාවේ දරුවන් ඔවුන්ගේ පවුල් සමග එක්ව කරන, සෞඛ්‍යයට සම්බන්ධ ක්‍රියාකාරකම් ඇත.
- ළමා සහ යොවුන් සෞඛ්‍ය සම්බන්ධ උනන්දුවක් දක්වන ප්‍රදේශයේ කණ්ඩායම් සහ ප්‍රජාවට සේවාවන් සපයන සෞඛ්‍ය සංවිධාන හඳුනාගනී
- පාසලේ ක්‍රියාකාරකම් සඳහා එක්වී සහභාගී වේ
- වෙනත්

***<u>අරමුණ</u>***

අපි ප්‍රජාව සමග සම්බන්ධකම් ගොඩනැගීම සඳහා නිරන්තර උත්සාහයක යෙදී සිටිමු.

***<u>ක්‍රියාකාරකම්</u>***

- ශිෂ්‍යයන් සහ ගුරුවරුන් පාසල අවට සමාජයේ සිදුවන වැඩ සටහන් (සංස්කෘතික, ආගමික කටයුතු ක්‍රීඩා, හා උත්සව) වලට නිරන්තරයෙන් සහභාගී වේ.
- පාසල තම සෞඛ්‍ය ක්‍රියාකාරකම් පිළිබඳව මාධ්‍ය මගින්ද, පාසල විවෘත කර තබන දිනවලදී ප්‍රජාවේ උත්සවවලදී සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් සංකල්පය ළමුන් මගින්ද ප්‍රජාවට දක්වයි.
- වෙනත්

## <u>ප්‍රධාන ලක්ෂණය - 2</u>

**පාසලේ ආරක්ෂා සහිත සෞඛ්‍යමත් පරිසරයක් ඇති කිරිම (භෞතික හා මනෝ සමාජීය)**

***<u>අරමුණ</u>***

අපි ප්‍රමාණවත් ජලය හා සනීපාරක්ෂක පහසුකම් සපයන්නෙමු.

***<u>ක්‍රියාකාරකම්</u>***

- පිරිමි ළමුන්ට හා ගැහැනු ළමුන්ට ප්‍රමාණවත් වැසිකිළි / කැසිකිළි පහසුකම් ඇත
- පානය කිරිමට සහ අත් සේදීමට සුරක්ෂිත, පිරිසිදු ජලය ඇත
- සේදීමේ කටයුතු හා පරිසර කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි ජලය ඇත
- වෙනත්

***<u>අරමුණ</u>***

අපි පාරිසරික යහ පැවැත්ම තහවුරු කරනු ලබන ක්‍රියාකාරිත්වයන් වර්ධනය කරන්නෙමු

**ක්‍රියාකාරකම්**

- කඩදාසි, වීදුරු, ඇලුමිනියම් වැනි ප්‍රතිචක්‍රීකරණය කළ හැකි දේ ඒ සඳහා යොමු කරවමු.
- එක් වරක් පාවිච්චි කර ඉවත දමන පොලිතින් සහ ප්ලාස්ටික් භාවිතය අපි අධෛර්යමත් කරන්නෙමු.
- වෙනත්

**අරමුණ**

පාසලේ පහසුකම් හා පරිසරය හොඳින් අලංකාරවත්ම පවත්වාගෙන යාමට සිසුන් දිරිමත් කරන්නෙමු.

**ක්‍රියාකාරකම්**

- අපට විධිමත් කසල ඉවත් කිරීමේ ක්‍රියාවලියක් ඇත
- පාසල් සිසුහු පාසල් අලංකාර කිරිම සඳහා ක්‍රියා කරයි. උදාඃ පින්තාරු කිරීම, මල් වැවීම, ක්‍රීඩාපිටිය පිරිසිදු කිරිම.

**අරමුණ**

අපි පාසල අවට භෞතික පරිසරය සුරක්ෂිත කර පාසල තුල හා අවට උපද්‍රව අවම කරමු.

**ක්‍රියාකාරකම්**

- දොරවල්වල ඇති කැඩී යා හැකි වීදුරු ඉවත් කිරීම, ක්‍රිඩාපිටියේ උපකරණ, යට ඇති කොන්ක්‍රීට් /තාර ඉවත් කිරිම, ක්‍රීඩාපිටියේ ඇති වලවල් හැරුණු තැන් යලි සකස් කිරිම
- ක්‍රීඩාපිටියේ උපකරණ හොඳ තත්වයේ තබා ගැනීම සහ රසායනාගාර විද්‍යා කටයුතු සඳහා සුරක්ෂිත ස්ථානයක් කිරිම
- අවශ්‍ය වන පරිදි සුරක්ෂිතභාවය පෙන්වන සංකේත හා ආරක්ෂිත උපකරණ සවිකිරිම
- අමතර

**අරමුණ**

අපි පාසලේ භෞතික තත්වයන් උසස් මට්ටමකට ගෙන ඒම තුළින් අධ්‍යාපනය ලැබීමේ අවස්ථා වඩාත් සඵල කරමු.

**ක්‍රියාකාරකම්**

- සිසුන් එක්රැස්වන සෑම තැනකම ප්‍රමාණවත් වාතාශ්‍රය සැපයීම
- සෙවන සහිත ස්ථාන හෝ අවශ්‍ය වන උෂ්ණත්වය ලබාගත හැකි මාර්ග ඇතිකිරීම
- ශබ්දය නිසා ඇතිවන බලපෑම අවම කිරීම
- දැනට පවත්නා ප්‍රමිතීන් පරීක්ෂා කර පලාත් පාලන ආයතන සමග එක්ව එම ප්‍රමිතීන් නියමිත මට්ටමට පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් සොයා ගැනීම
- පාසලේ ඇති භෞතික සම්පත් (ආලෝකය, පුටු සහ ලී බඩු) ප්‍රමිතියට අනුව සැපයීම තුළින් ඉගෙනුම් ක්‍රියාවලියට උපකාර කිරිම
- වෙනත්

***අරමුණ***

අපි පාසලේ සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ මානසික අධ්‍යාත්මික හා සමාජයික අවශ්‍යතා සපුරා ගැනීමට උදව් කර ඒ තුළින් ප්‍රීතිමත් පාසලක් ගොඩනැගීම.

***ක්‍රියාකාරකම්***

- පාසල් දරුවන්ගේ නිර්මාණාත්මක හා අධ්‍යාපනික කුසලතාවයන් වර්ධනය කිරීමට උපකාර කරන අතර ඒවා අගය කිරිමටද කටයුතු කරයි.
- අධ්‍යාපනික කටයුතු දරුවන්ගේ සැබෑ ජීවිතයේ යථාර්ථ සමග අනුරූප වනසේ සකස් වේ.
- ගුරුවරුන් දරුවන්ට කර්කශ දඩුවම් පැමිණවීම හෝ ශාරීරික හිංසනයන්ට ලක් නොකිරීම හා දරුවන්ට උදව් කරමින් ඔවුන්ගේ ගෞරවය ආරක්ෂා වන පරිදි කටයුතු කරයි
- පාසලේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට පාසල් සිසුන් ද හවුල් වේ
- දරුවන් තම ඉගෙනීමේ කටයුතුවලට සක්‍රියව සහභාගී වේ.
- ඇතිවිය හැකි මානසික ආතතිය හඳුනාගැනීමේ ලක්ෂණ පාසල් දරුවන් සහ ගුරුවරුන් ප්‍රගුණ කරන අතර මානසික ආතතියට ලක්ව ඇති මහජනතාව ගැන අවධානය යොමුකර ඔවුන්ට උපකාර කිරීමට කටයුතු කිරිම
- කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ට තම සේවා කටයුතු ගෞරවාන්විත ලෙසත්, ධනාත්මක ලෙසත් ඉටු කිරිමට හැකිවන පරිසරයක් පාසල තුළ ඇති කිරීම
- වෙනත්

***අරමුණ***

පාසල් දරුවන්ගේ පැමිණීම සහ සහභාගිත්වය දිරිගැන්වීම සඳහා ආරක්ෂාව, විශ්වාසනීයත්වය හා මිත්‍රත්වය පදනම් කරගත් වටපිටාවක් නිර්මාණය කරමු.

***ක්‍රියාකාරකම්***

පාසල් දරුවන් හා කාර්ය මණ්ඩල අතරද ඔවුන් එකිනෙකා අතරද ශාරීරික හා වාචික අපයෝජනය හා ප්‍රචණ්ඩත්වය පාසල තුල, ක්‍රියාවෙන්ම අධෛර්යමත් කරමු.

- ගැහැණු හා පිරිමින්ටද, පිරිමි ළමුන්ට හා ගැහැණු ළමුන්ටද විවිධ ජාතීන් හා ආගම් වලට අයත් අයටද සමාන ගරුත්වයක් ඇතිව කටයුතු කිරීම පාසල ධෛර්යමත් කරයි.
- වෙනත්

***අරමුණ*** පන්තියේ අනෙකුත් දරුවන් හා සසඳන විට විශේෂිත අපහසුතා ඇති දරුවන්ට උදව් හා උපකාර කිරීමට අපි ක්‍රියා කරමු.

***ක්‍රියාකාරකම්***

- අපි සමහර සිසුන්ට ඇති විශේෂ අවශ්‍යතා හඳුනාගෙන ඔවුන්ට අවශ්‍ය පහසුකම්, ඉගෙනීමේ උපකරණ සැපයීමටත්, ආබාධිත හෝ වෙනත් අපහසුතා ඇති දරුවන්ට විශේෂ වැඩ සටහන් පැවැත්වීමටත් කටයුතු කරමු.
- අපි ආබාධිත ළමුන්ට සැලකිල්ලක් දක්වන අතර ඔවුන් පාසලේ සියළු කටයුතු සඳහා සම්බන්ධ කරවා ගනිමු.
- වෙනත්

***අරමුණ***

අපි පාසලේ සියලු දරුවන් පිළිබඳව තක්සේරුවක් කරන අතර ඔවුන් අතර ඇති වෙනස්කම් සම්බන්ධව ගරු කරමු. සැලකිලිමත් වන්නෙමු.

***ක්‍රියාකාරකම්***

- සංස්කෘතික, ආගමික හා විවිධ ජාතීන් අතර ඇති වෙනස්කම් ආහාර, ඇඳුම් පැළඳුම්, නැටුම්, ශිල්ප, සංදර්ශන,උත්සව හා ප්‍රදර්ශන මගින් උත්සවශ්‍රීයෙන් සැමරීමට පාසල අවස්ථාවන් ඇති කරයි.
- පාසල් විෂය මාලාව මගින් සංස්කෘතික, ආගමික, වාර්ගික හා වෙනත් විවිධ වෙනස්කම් පිළිබඳව සිසුන්ට අධ්‍යාපනයක් ලබාදීමට කටයුතු කරයි.
- පිරිමි සහ ගැහැණු ළමුන් අතරත්, විවිධ ජාතීන්ට, ආගම්වලට සහ සමාජ කණ්ඩායම් වලට අයත් ළමුන් අතරත් සාධාරණත්වය හා සමානාත්මතාවය වැඩිදියුණු කිරීමට පාසල ක්‍රියා කරයි.

## ප්‍රධාන ලක්ෂණය - 3

### සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් කුසලතා පදනම් කරගත් සෞඛ්‍ය අධ්‍යාපනයක් ලබාදෙයි

***අරමුණ***

අප විෂය නිර්දේශය තුළ සෞඛ්‍ය අවශ්‍යතාවයන් පරිපූර්ණවූත්, ලිහිල්ව අවබෝධ කරගත හැකිවූත්, ක්‍රමෝපායන් මගින් ඉගැන්වීම කෙරේ.

***ක්‍රියාකාරකම්***

- අපගේ විෂය නිර්දේශය සිත් ඇදගන්නා සුළු ප්‍රස්තුත කරුණුවලින් යුතු එකකි.
- එය දරුවන්ගේ සහභාගිත්වය පිළිබඳව අවධාරණය කරයි
- එම විෂය නිර්දේශය තුළ සිසුන්ට තමාගේ ප්‍රජාව සමග සම්බන්ධ කර ගත හැකි කරුණු විද්‍යමාන වන අතර සිසුන්ගේ අත්දැකීම් සම්බන්ධවද අවධානය යොමුකර ඔවුන් නිතිපතා කරන සෞඛ්‍ය ආරක්ෂණ වැඩ පිළිවෙලට ද උපකාර කරයි
- සංවර්ධනයට අනුකූල ඉගෙනීමේ අත්දැකීම් එයින් ලබාදේ
- විෂය නිර්දේශය තුළ සෑම සතියකටම සෞඛ්‍ය සඳහා ප්‍රමාණවත් කාලයක් වෙන්කර ඇත
- දරුවන්ට එකට එක්වී ක්‍රියාකාරකවල යෙදීමට උනන්දු කිරීමටත් එමගින් අවබෝධයන් ලබාගැනීමටත්, සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අවස්ථාව ලබාදෙන අන්දමේ ඉගැන්වීමේ ක්‍රමවේදයක් අනුගමනය කරයි
- වෙනත්

***අරමුණ***

විෂය නිර්දේශය සකස් වී ඇත්තේ දරුවන්ගේ අවබෝධය සහ ව්‍යාවහාරය වැඩිදියුණු වන අන්දමිනි.

***ක්‍රියාකාරකම්***

- විෂය නිර්දේශය මගින් සිසුන්ගේ මනසට හා සංස්කෘතියට ගැලපෙන පරිදි පෝෂණය, රෝග වැලැක්වීම හා සනීපාරක්ෂාව, කායික ක්‍රියාකාරිත්වය, ආරක්ෂාව, හැඟීම් පාලනය, මුඛ සෞඛ්‍ය, ලිංගිකත්වය, (එච්.අයි.වී ඒඩ්ස් ඇතුළුව) මත්පැන්,

දුම්වැටි සහ මත්ද්‍රව්‍ය අපයෝජනය වැලැක්වීම සහ පරිසර සෞඛ්‍ය පිළිබඳ මූලික අවබෝධය ලබාදේ.

- එමගින් සිසුන්ට ගැටළු විසඳීමට තීරණ ගැනීමට, සඵලමත් සන්නිවේදනයට, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීමට, ආතතිය මැඩ පවත්වා ගැනීමට, විචාරාත්මක චින්තනයට අවශ්‍ය ජීවන කුසලතා ඉගෙනීමටත් ඒවා පුරුදු පුහුණු කිරීමටත් අවශ්‍ය අවස්ථා ලබාදේ.
- මධ්‍යසාර, මත්ද්‍රව්‍ය, අපයෝජනය සහ අනවශ්‍ය ලිංගික ක්‍රියාකාරකම් වලට එරෙහිවීමේ හා ප්‍රතික්ෂේප කිරීමේ කුසලතාවයන් පුරුදු පුහුණු කිරීමට අවස්ථාව ලබාදේ.
- වෙනත්.

***<u>අරමුණ</u>***

අපේ ගුරුවරුන් සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල්වල කාර්යභාරයන් ඉටු කිරීමට ප්‍රමාණවත් ලෙස සූදානම්ව සිටි.

***<u>ක්‍රියාකාරකම්</u>***

- සෞඛ්‍ය ප්‍රවර්ධනය සම්බන්ධ මූලික පුහුණුවේදී හා සේවා නියුක්ති පුහුණුවීවලදී ගුරුවරුන්ට අවබෝධයක් ලබාදේ
- පාසල් කාර්ය මණ්ඩලය සහ ගුරුවරුන්ගේ සෞඛ්‍ය ප්‍රවර්ධනය සම්බන්ධ නව දැනුම හා කුසලතා වර්ධනය කර ගැනීමටත් මෙම සම්පත් උපයෝගී කරගෙන පාසල තුළදී ඒවා ක්‍රියාත්මක කිරීමටත් උපකාර කිරීම නිරතුරුවම සිදු කරයි.
- වෙනත්

## ප්‍රධාන ලක්ෂණ - 4

**සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් සෞඛ්‍ය සේවාවන් පූර්ණ ලෙස ලබාදීමට ක්‍රියා කරයි.**

***<u>අරමුණ</u>***

සිසුන්ට හා කාර්ය මණ්ඩලයට මූලික සෞඛ්‍ය පහසුකම් සැපයීමට ක්‍රියා කරමු.

***<u>ක්‍රියාකාරකම්</u>***

- සිසුන්ට ප්‍රතිශක්තීකරණය ලබාදීමට අපි ක්‍රියාශීලීව කටයුතු කරමු.
- පෙනීම, ඇසීම, දත් පිළිබඳ ආබාධ තිබේදැයි පරීක්ෂා කිරීම සිදු කරයි.
- ආබාධ නිවැරදි කිරීමට කටයුතු කර ඇති සිසුන්ගේ සෞඛ්‍ය පිළිබඳ වාර්තා විදුහල්පතිවරු විසින් පවත්වාගෙන යනු ලබයි.
- ප්‍රථමාධාර කට්ටලයක් සපයා ඇති අතර එය පාවිච්චි කිරීම පිළිබඳව පුහුණුව ලබාදෙන්නෙමු.
- සමාජයික වශයෙන් හා මානසික වශයෙන් පසුබෑමට ලක්වී සිටින සිසුන් සඳහා ද, සෞඛ්‍ය ගැටළු ඇති සිසුන් සඳහා ද උපදේශන හා සහායවීමේ සේවාවන් පවත්වන්නෙමු.

***අරමුණ***

ප්‍රදේශයේ පවතින සෞඛ්‍ය සේවය, අප පාසලේ සෞඛ්‍ය වැඩ සටහනේ කොටස්කරුවන් වේ.

***ක්‍රියාකාරකම්***

- සෞඛ්‍යයට අදාල විෂය නිර්දේශ සකස් කිරිම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ සෞඛ්‍ය නිලධාරීන් සහ ගුරුවරුන් අතර තොරතුරු විමසීම් ඇතිවේ.
- එම විෂය නිර්දේශ ඉගැන්වීමේදි සෞඛ්‍ය නිලධාරින් ගුරුවරුන් සමග එක්ව කටයුතු කරයි
- සෞඛ්‍ය කාර්ය මණ්ඩලය මගින් ගුරුවරුන් සඳහා විශේෂිත මාතෘකා යටතේ පුහුණුවීම් ලබාදේ.
- පාසලේ පැවැත්වෙන විවිධ සෞඛ්‍ය ව්‍යාපෘතිවලදී ප්‍රදේශයේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ සහයෝගය ලැබේ
- වෙනත්

## ප්‍රධාන ලක්ෂණය - 5

සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල, සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර අනුගමනය කරයි

***අරමුණ***

අප පාසලේ ගැහැණු සහ පිරිමි ළමුන් අතර සම්පත් බෙදීයාමේ සමානත්වයක් තිබෙන බවට සහතික කර ඇත.

***ක්‍රියාකාරකම්***

- ක්‍රීඩාපිටියේ ඉඩකඩ, උපකරණ, ගුරුවරුන්ගේ කාලය සහ අනෙකුත් සම්පත් සම්බන්ධව පවතින චාරිත්‍ර සහ පුරුදු සමාලෝචනය කර අවශ්‍ය අවස්ථාවන්හිදී අපක්ෂපාතී ලෙස ක්‍රියා කර ඇත.
- වෙනත්

***අරමුණ***

සෞඛ්‍යයට හිතකර ආහාර සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කර ඇත.

***ක්‍රියාකාරකම් -***

- සෞඛ්‍යයට හිතකර, දේශීය ආහාර පමණක් සපයා ඇත.
- සෞඛ්‍යයට හිතකර ආහාර පමණක් ගැනීමෙන් ගුරුවරුන් ආදර්ශයක් ලබාදේ.
- පාසලේ උත්සව අවස්ථාවලදී තෝරාගැනීම සඳහා සෞඛ්‍යයට හිතකර ආහාර පමණක් සපයා ඇත.
- අප ආහාර සුරක්ෂිත කිරිම සඳහා පනවා ඇති ප්‍රමිති අනුගමනය කරමු.

## ප්‍රධාන ලක්ෂණය - 6

සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් ප්‍රජාවේ සෞඛ්‍යයද සංවර්ධනය කරයි.

***අරමුණ***

පාසල් ප්‍රජාව ආරක්ෂිත පරිසරයක් ගොඩ නැගීමට ක්‍රියා කර ඇත.

***ක්‍රියාකාරකම්***

- ගුරුවරුන්ට සහ දරුවන්ට සැලකිල්ලක් දක්වන අතර පාසලේ ප්‍රතිපත්ති සහ ඒවා ක්‍රියාත්මක කිරීමේදී ඔවුන්ට ඉඩ ප්‍රස්ථා ලබාදී ඇත.
- ගැහැණු දරුවන් ලිංගික අපයෝජනයෙන් ආරක්ෂා කර ඇත.
- සියලු සිසුන් ලිංගික හිරිහැර කිරීම් වලින් ආරක්ෂා කර ඇත
- ගොඩනැගිලි සහ උපකරණ සම්බන්ධව නිසිකලට තත්ව පරීක්ෂණයක් කර අවශ්‍ය අවස්ථාවන්හිදී ඒවා අලුත්වැඩියා කෙරේ.
- ප්‍රජාවේ සහයෝගය ඇතිව මාර්ග උපද්‍රව (වාහන සහ මත්ද්‍රව්‍ය භාවිතය) අවම කිරිමට කටයුතු කර ඇත.
- අනවශ්‍ය අමුත්තන්ගෙන් දරුවන් ආරක්ෂා කර ගැනීමට ක්‍රියාමාර්ග සකස් කර ඇත
- අලුතින් ක්‍රීඩා උපකරණ තෝරා ගැනීදේ ළමුන්ට ඇතිවිය හැකි අනතුරු සම්බන්ධව සලකා බලා එම උපකරණ පාවිච්චි කිරීමේදී සපයා ඇති උපදෙස් අනුව කටයුතු කරයි.
- පාසලේ භූමිය තුලදී දරුවන්ට සිදුවන අනතුරුවලදී ඒ සම්බන්ධව ක්‍රියා කිරීමට සැලැස්මක් සකස් කර ඇත
- වෙනත්

***අරමුණ***

අපි සිසුන්ගේ යහ පැවැත්මට බලපෑමක් ඇති කිරීම සඳහා දෙමාපියන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ක්‍රියා කරමු.

***ක්‍රියාකාරකම්***

- අවශ්‍ය අවස්ථාවන්හිදී දෙමව්පියන්ට විශේෂිත අධ්‍යාපනික සේවා සපයයි. (උදා: කියවීමේ, ලිවීමේ අධ්‍යාපනය, දෙමාපිය කුසලතා, එච්අයිවී/ලිංගාශ්‍රිත රෝගවලින් ආරක්ෂාවීම, ප්‍රචණ්ඩත්වය).
- පාසලේදී දරුවන් ඉගෙන ගන්නා සෞඛ්‍ය හා සමාජයික කරුණු පිළිබඳව දෙමව්පියන් දැනුවත් කිරීම තුළින් දෙමව්පියන්ගේ සහයෝගය දරුවන්ට ලබාදේ.
- ප්‍රජාවේ ඇති සේවාවන් සම්බන්ධ කිරීම සඳහා පාසල ක්‍රියා කරයි.
- වෙනත්.

***අරමුණ***

පාසලට සම්බන්ධ අනෙකුත් ප්‍රධාන අයටද සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලකින් ලැබෙන කුසලතා ලබාගැනීමට අවස්ථාව ලබාදේ.

***ක්‍රියාකාරකම්***

- දෙමව්පියන්ට, සෞඛ්‍ය හා අධ්‍යාපන නිලධාරීන්ට, ප්‍රජාවේ සාමාජිකයින්ට පුහුණුවීම් පැවැත්වීම තුළින් පාසල් සෞඛ්‍ය සඳහා ඔවුන්ගේ කාර්යභාරය පුළුල් කෙරේ.
- වෙනත්

***අරමුණ***

ස්වාභාවික සහ වෙනත් ආපදා අවස්ථාවන්ට මුහුණ දීමට ආරක්ෂක සැලැස්මක් ඇත.

***ක්‍රියාකාරකම්***

- ගුරුවරුන්ට සහ පරිපාලනයට සම්බන්ධ අයට අදාල ක්‍රම උපායන් පිළිබඳව පුහුණුවක් ලබාදී ඇත.
- දරුවන් සහ කාර්ය මණ්ඩලය හදිසි අවස්ථාවකදී ක්‍රියාකල යුතු ආකාරය පුහුණුවී ඇත.
- වෙනත්

***අරමුණ***

සෞඛ්‍යයට සම්බන්ධ වෙනත් කරුණු සම්බන්ධව ප්‍රතිපත්ති සකස් කර ඇත.

***ක්‍රියාකාරකම්***

- හිරු එළියෙන් ආරක්ෂාවීම
- සෞඛ්‍ය ගැටලු කලින් හඳුනාගැනීම.
- හදිසි අවස්ථාවකදී පාසල වසා දැමීම
- එච්අයිවී/ඒඩ්ස් ලිංගාශ්‍රිත රෝග සඳහා අධ්‍යාපනයක් ලබාදීම හා ඒ අවස්ථාවන්හිදී කොන් කිරීම සම්බන්ධව
- දුම්පානය සම්බන්ධව
- පාසලේ ආයුධ තබා ගැනීම
- පාසලට සපයන ආහාර
- සැම කෙනෙකුටම සමානව සැලකීම
- පණුරෝග සහ වෙනත් පරපෝෂිත රෝග මර්ධනය
- පෝෂණය
- වෙනත්

පොදු චක්‍ර ලේඛ අංක 01.37/2007

මගේ අංකය: FHB/af/03/2007
2007 නොවැම්බර් මස 26 දින
385 බද්දේගම විමලවංශ මාවත, කොළඹ 10
සෞඛ්‍ය ලේකම් කාර්යාලය

සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියළුම විශේෂ වැඩසටහන් භාර අධ්‍යක්ෂවරුන්
අධ්‍යක්ෂ, ජාතික සෞඛ්‍ය විද්‍යායතනය
රෝහල් අධ්‍යක්ෂවරුන් ඇතුළු සියළුම රෝහල් භාර වෛද්‍ය නිලධාරීන්
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, කොළඹ මහ නගර සභාව
සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්
සියළුම පාසල් වෛද්‍ය නිලධාරීන්

## <u>පාසල් සෞඛ්‍ය වැඩසටහන</u>

අධ්‍යාපන අමාත්‍යංශය මගින් නිකුත් කරන ලද පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය හා සම්බන්ධ චක්‍රලේඛයට සමාන්තරව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. සෞඛ්‍ය අමාත්‍යංශය මගින් 1918, කොළඹ නගර සහා බල ප්‍රදේශයේ පාසල් සෞඛ්‍ය වැඩසටහන ආරම්භ කරන ලදී. 1926 ජාතික සෞඛ්‍ය විද්‍යායතනය ස්ථාපිත කිරීමෙන් ඇරඹුණු සෞඛ්‍ය ඒකක පිහිටුවීමත් සමගම මෙම වැඩසටහන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන්ගේ කාර්යභාරය බවට පත්විය. ප්‍රධාන නගර සහා බල ප්‍රදේශවල එම කටයුතු සඳහා පාසල් වෛද්‍ය නිලධාරීන් පත්කරන ලදි (කොළඹ, ගාල්ල, යාපනය, මාතර හා මහනුවර නගර සහා සීමා තුල).

මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වන්නේ ස්වකීය සෞඛ්‍ය මෙන්ම තම පවුලේ හා සමාජයේ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම හා දෙන ලද අධ්‍යාපන අවස්ථා වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට හැකියාවක් ඇති දරු පරපුරක් ඇති කිරීමයි. මෙම අරමුණ කරා ළඟා වීමට සෞඛ්‍ය හා අධ්‍යාපන අමාත්‍යංශ දෙකේ එකඟත්වයෙන් පාසල්, සෞඛ්‍ය ප්‍රවර්ධන ස්ථාන බවට පත් කිරීමට කටයුතු යොදා ඇත (ලෝක සෞඛ්‍ය සංවිධානයේ සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රමවේදයන් අනුව ).

ඒ අනුව පහත සඳහන් සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රමවේදයන් අධ්‍යාපන අමාත්‍යංශයේ පරිපාලනය යටතේ පවතින, දිවයින පුරා ඇති සියලු පාසල්වලට හඳුන්වා දීමට කටයුතු යොදා ඇත.

1. සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා සෞඛ්‍ය හා අධ්‍යාපන නිලධාරීන්, ගුරුවරුන්, පාසල් ළමුන්, දෙමව්පියන්, ප්‍රජා නායකයන් සහ වෙනත් අදාළ සංවිධාන සහභාගී කරවා ගැනීම.

2. කායික හා මානසික වශයෙන් ආරක්ෂාකාරී සෞඛ්‍යමත් පරිසරයක් ගොඩනැගීම (සෞඛ්‍ය හිතකර ආපනශාලා, ආරක්ෂාකාරී සෞඛ්‍යමත් පරිසරය, සෞඛ්‍ය ආරක්ෂිත ජල සැපයුම හා වැසිකිළි පහසුකම්).

3. නිපුණතා පාදක සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම.

4. සෞඛ්‍ය සේවා නැවත ප්‍රතිසංවිධානය කිරීම, පාසල් ළමුන් සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා සැලසුම් කිරීම සඳහා බලගැන්වීම.
   උදා :- වර්ධනය නියාමනය කිරීම, යකඩ ෆෝලික් අම්ල පෙති ලබාදීම

5. සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම - උදා :- පොලිතින් තොර පරිසරයක්

6. පාසල් සෞඛ්‍ය සමාජ තුළින් ප්‍රජා සහභාගිත්වය වැඩි දියුණු කිරීම.
   උදා :-ප්‍රජා සහභාගීත්වය, ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන්

   පාසල් සහ නවයොවුන් සෞඛ්‍ය සඳහා මධ්‍ය කේන්ද්‍රීය ස්ථානය ලෙස සෞඛ්‍ය අමාත්‍යංශ විසින් පවුල් සෞඛ්‍ය කාර්යාංශය නම් කර ඇති අතර, අධ්‍යාපන අමාත්‍යංශය විසින් සෞඛ්‍ය හා පෝෂණ පිළිබඳ අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය කටයුතු පිළිබඳ මධ්‍ය කේන්ද්‍රීය ස්ථානය ලෙස නම් කර ඇත.

පළාත් මට්ටමින් එම වගකීම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ද දිස්ත්‍රික් මට්ටමෙන් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ද පැවරී ඇත. පාසල් සෞඛ්‍ය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදි දිස්ත්‍රික් මට්ටමින් මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරු ද ප්‍රාදේශීය මට්ටමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරු ද (නගර සභා බල ප්‍රදේශ තුල පාසල් වෛද්‍ය නිලධාරීන් ) පාසල් මට්ටමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක ද කේන්ද්‍රිය වගකීම දරණ නිලධාරීන් බවට පත්වේ.

සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් / පාසල් වෛද්‍ය නිලධාරීන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩල මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේත් අනිකුත් දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්ගේද (ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ / ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍ය / ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක, සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී / මානසික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, බෝ-නොවන රෝග පිළිබඳ වෛද්‍ය නිලධාරී සහ වෛද්‍ය නිලධාරී / සැලසුම්) සහය ඇතිව පාසල් සෞඛ්‍ය වැඩසටහන් සැලසුම් කිරිමේදි ක්‍රියාත්මක කිරිමේදි හා නියාමනය සහ ඇගයීම් අවස්ථාවලදීත් පාසල් ප්‍රජාවට තාක්ෂණික මඟ පෙන්වීම සිදුකල යුතුය.

අධ්‍යාපන නිලධාරීන් සමඟ එක්ව ගැටළු විශ්ලේෂණය කොට සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනාගැනීම, ඒ කාර්යයන් සපුරා ලීම සඳහා අවශ්‍ය සැලැස්ම පිළියෙළ කිරිම පාසල් ප්‍රජාවගේ දායකත්වය ඇතිව සිදු කල යුතුය.

**<u>සෞඛ්‍ය නිලධාරීන්ගේ වගකීම් වන්නේ ,</u>**

- පාසල් ප්‍රජාවගේ සෞඛ්‍ය දියුණු කිරීමට අධ්‍යාපන දෙපාර්තමේන්තු නිලධාරීන් සමඟ කටයුතු කිරීම.
- ශිෂ්‍යයන්ගේ වර්ධනය සහ සංවර්ධනය සඳහා අවශ්‍යතා හඳුනාගෙන ඒ සඳහා විසඳුම් සෙවීමට මඟපෙන්වීම.
- ගැටළු විශ්ලේෂණය කර පාසල් සෞඛ්‍ය වැඩ සැලසුමක් පාසල් සෞඛ්‍ය සමාජය සමඟ පිළියෙළ කිරීම.
- සෞඛ්‍ය සහ ජීවිතය සම්බන්ධ තීරණ ගැනීමේදී අවශ්‍ය වන දැනුම ආකල්ප හා කුසලතා පාසල් ප්‍රජාව තුළ ඇති කිරීම.
- පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ආරම්භය හා පැවැත්ම සඳහා අවශ්‍ය ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීම.
- වෛද්‍ය පරීක්ෂණ මඟින් සහ යොමු කිරීම් මගින් පාසල් විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ ශිෂ්‍යයන්ගේ සෞඛ්‍ය තත්වය නඟා සිටුවීමට උදවුවීම.
- ගුරුවරුන් හට ප්‍රජනක සෞඛ්‍ය ඉගැන්වීම හා උපදේශණය සහ මනෝ සමාජීය නිපුණතා ඉගැන්වීමේ කුසලතා දියුණු කිරීම.
- පාසල් පරිසරය ආරක්ෂිතව, හිංසනයෙන්, අපයෝජනයෙන් සහ ශාරීරික හා මානසික දඬුවම් වලින් තොරව පවත්වා ගැනීමට මඟපෙන්වීම.
- බෝවන සහ බෝ-නොවන රෝග වලින් වැලකී සිටීමට පාසල් ප්‍රජාවට මඟ පෙන්වීම.
- දිවා ආහාර වැඩසටහන අධීක්ෂණය කිරීම.
- පාසල් සෞඛ්‍ය ක්‍රියාකාරකම් වලට ප්‍රජාවේ සහාය ලබා ගැනීමට කටයුතු කිරීම.
- පාසල් ශිෂ්‍යයන් ප්‍රජා ක්‍රියාකාරකම් වලට සහභාගි වීමට මඟපෙන්වීම.
- දරුවන්ගේ මනෝ සමාජීය කුසලතා දියුණු කිරීමට ආධාර කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට ආධාර කිරීමට ක්‍රමවේදයන් ඇති කිරීම.
- අධ්‍යාපන නිලධාරීන් සමඟ පාසල් සෞඛ්‍ය වැඩසටහන නියාමනය, ඇගයීම සහ ප්‍රතිපෝෂණයක් ලබාදීම.

සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරු, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සහ අනිකුත් පළාත් සහ දිස්ත්‍රික් සෞඛ්‍ය නිලධාරීන් පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් බවට දියුණු කිරීමට අධ්‍යාපන බලධාරීන්ට මඟ පෙන්වීම සහ සහයෝගය ලබාදිය යුතුයි.

නිතිපතා සිදුකරන පාසල් සෞඛ්‍ය කටයුතු එනම්, පාසල් වෛද්‍ය පරීක්ෂණ, ගුරුවරුන් සහ සිසුන් සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්, අධ්‍යාපන නිලධාරීන් සඳහා උද්දේශන වැඩසටහන්, පාසල් සෞඛ්‍ය සමාජයේ වැඩකටයුතු යනාදිය ඉටු කිරීමේදී ජාතික මට්ටමේ අධ්‍යාපන හෝ සෞඛ්‍ය අමාත්‍යාංශ වලින් අවසර ගත යුතු නොවේ. නමුත් ඒ කටයුතු ද අධ්‍යාපන අමාත්‍යාංශයේ පළාත්, කළාප සහ කොට්ඨාස අධ්‍යක්ෂවරුන් සමඟ සැලසුම් කර ඒවා පළාත් සෞඛ්‍ය, සහ **පළාත් අධ්‍යාපන ආංශික සංවර්ධන සැලසුමට** ඇතුළත් කල යුතුයි.

## පාර්ශවකරුවන් විසින් පාසල් සෞඛ්‍ය කටයුතු  සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

A. පාසල් සෞඛ්‍ය කටයුතු සැලසුම් කර ඇති සෞඛ්‍ය අමාත්‍යංශයේ සියළුම අධ්‍යක්ෂවරුන් එම සැලසුම් පාසල් සෞඛ්‍ය වැඩසටහනෙහි මධ්‍ය කේන්ද්‍රිය ආයතනය වන පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ / මාතෘ හා ළමා සෞඛ්‍ය මගින් පෙර වසරේ ඔක්තෝම්බර් 01 දිනට පෙර අධ්‍යාපන අමාත්‍යංශයේ සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන භාර මධ්‍ය කේන්ද්‍රිය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දනුම් දිය යුතුය.

B. එම සෞඛ්‍ය කටයුතු සෑම විටම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සහ ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් හරහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ පාසල් වෛද්‍ය නිලධාරි මගින් ක්‍රියාත්මක කල යුතුය. කිසිවිටෙකත් ඔවුන්ගේ අනුදැනුමකින් තොරව  පාසල්  සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක නොකළ යුතුය.

C. අධ්‍යාපන අමාත්‍යංශයේ ජාතික මට්ටමේ කමිටුව මඟින් අනුමත නොකරන ලද සහ පළාත් අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්මට ඇතුළත් නොකරන ලද, රාජ්‍ය නොවන සංවිධාන මගින් පාසල් ළමුන් සඳහා සෞඛ්‍ය වැඩසටහන් සිදුකරන අවස්ථා වලදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ අනිකුත් රජයේ වෛද්‍ය නිලධාරින් උදව් දීම හෝ සහභාගී වීම නොකළ යුතුය.

### පාසල් වෛද්‍ය පරීක්ෂණය

මෙය පාසල් සෞඛ්‍ය වැඩසටහනේ වැදගත් අංගයකි. (ඇමුණුම 1 බලන්න) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සහ ආරෝග්‍ය ශාලා ප්‍රධානීන්ගේ උපකාර ඇතිව පාසල් වෛද්‍ය පරීක්ෂණ සුදානම් කලයුතු අතර රෝහල් වෛද්‍යවරුන්ගේ සහාය වෛද්‍ය පරීක්ෂණ සඳහා සහ ශිෂ්‍යයන් යොමු කිරීමේ දී ලබාගත යුතුය.

### පාසල් සෞඛ්‍ය වැඩසටහන ඇගයීම

A. පාසල් සෞඛ්‍ය කටයුතු අධීක්ෂණය කිරීම මෙන්ම මෘතා හා ළමා සෞඛ්‍ය කටයුතු සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ රාජකාරි කටයුතු සමාලෝචනය කරන සියලුම අවස්ථාවන් වලදී පාසල් සෞඛ්‍ය කටයුතු නියාමනය සහ ඇගයීම් අධ්‍යාපන නිලධාරින් සමඟ සිදුකිරීම ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ගේද, මාතෘ හා ළමා වෛද්‍ය නිලධාරිවරුන්ගේද සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගේ ද වගකීමක් වේ.

B. සියළුම ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් පාසල් සෞඛ්‍ය වැඩසටහන දියුණු කිරීමට තමා යටතේ ඇති අදාළ නිලධාරින් අධීක්ෂණය කර මඟ පෙන්වීම කළ යුතුය. මෙය අනාගතයේ ජනතාවගේ සෞඛ්‍ය දියුණුවට හේතුවේ.

C. පළාත් මට්ටමේ පාසල් සෞඛ්‍ය පළාත් කමිටුව පිහිටුවිය යුතුය. පළාත් සෞඛ්‍ය  ලේකම්, පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ, ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ/ වෛද්‍ය නිලධාරි මාතෘ හා ළමා සෞඛ්‍ය, ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් අවශ්‍යතාවය අනුව නම් කරනු ලබන නිලධාරින් පළාත් කමිටුවේ සමාජිකයින් වේ.

D. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්ගෙන් හා කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත කළාප කමිටු පිහිටවිය යුතුය. ප්‍රාදේශීය පරිපාලන මහජන පරික්ෂක හා සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරින් එම කමිටුවේ සාමාජිකයින් වේ.

### පාසල් සෞඛ්‍ය සමාජය - (ඇමුණුම 1 බලන්න)

අ. පාසල් ප්‍රජාව සමග සෞඛ්‍ය කටයුතු සැලසුම් කොට ක්‍රියාත්මක කිරිමට සෞඛ්‍ය සමාජය මුලිකත්වය ගනි.

ආ. සෞඛ්‍ය සමාජයෙහි වගකීම වන්නේ සෞඛ්‍ය ප්‍රවර්ධන වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙළ කිරිම පාසල් සෞඛ්‍ය කමිටුවේ අනුමැතිය ඒ සඳහා ලබාගැනිම, ක්‍රියාත්මක කිරිම, නියාමනය සහ ඇගයීම වේ. ඒ සඳහා මහජන සෞඛ්‍ය පරික්ෂක තුමාගේ සහාය ලබාදිය යුතුය.

### පාසල් සෞඛ්‍ය උපදේශන කමිටුව

අ. සංයුතිය

- විදුහල්පති (සභාපති)
- සෞඛ්‍ය වැඩසටහන් භාර නියෝජ්‍ය විදුහල්පති/ අංශ ප්‍රධාන/අදාල ගුරු භවතා
- ගුරුවරු- (ශිෂ්‍ය සංඛ්‍යාව මත පත් කිරීමට විදුහල්පතිට අවකාශ ඇත.

(සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන/ජීවන නිපුණතා/විද්‍යාව හෝ වෙනත් ගුරු භවතෙකු විය හැක.)

- ශිෂ්‍ය නියෝජිතයෙකු - පාසල් සෞඛ්‍ය සංගමයේ සභාපති හා ලේකම්
- දෙමාපිය නියෝජිතයෙකු
- මහජන සෞඛ්‍ය පරීක්ෂක
- සමෘද්ධි සංවර්ධන නිලධාරි
- බාහිර සුභ පතන්නන්

ආ. **වගකීම**

සෞඛ්‍ය සමාජය විසින් සකස් කරන ලද වාර්ෂික සෞඛ්‍ය සැලැස්ම අනුමත කිරීම සහ ඒ සඳහා අවශ්‍ය සම්පත් සපයාදීම, සෞඛ්‍ය ක්‍රියාකාරකම් සඳහා මහ පෙන්වීම නිගමනය සහ ප්‍රතිපෝෂණය.

**<u>කළාප සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව</u>**

(අ) සංයුතිය

- කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ (සභාපති)
- කළාප සෞඛ්‍ය / පෝෂණ වැඩසටහන් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
- වෛද්‍ය නිලධාරි / මාතෘ හා ළමා සෞඛ්‍ය
- ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ විසින් නම් කරන ලද නිලධාරීන් (ප්‍රාදේශීය වසංගත විශේෂඥ, ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍ය)
- ප්‍රාදේශිය පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක
- සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්
- කොට්ඨාස අධ්‍යාපන නිලධාරීන්
- ගණකාධිකාරි (කළාප අධ්‍යාපන කාර්යාලය)
- සමෘද්ධි සංවර්ධන නිලධාරි
- විදුහල්පතිවරුන් හතරදෙනෙකු (1AB, 1C Type 2, Type 3 පාසල් වලින් 1 බැගින්)

ආ. වගකීම

සපයා ඇති පරීක්ෂණ ලැයිස්තුව අනුව පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ඇගයීම.

- කළාප කමිටු රැස්වීම් කාර්තු අවසානයයේ පවත්වා පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු නියාමනය සහ ඇගයීම.
- සිදුකරන ලද පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු පිළිබඳව ප්‍රතිපෝෂණය කිරීම.
- රන් පදක්කම් සඳහා සුදුසුකම් ලත් පාසල් ලැයිස්තුව අධ්‍යාපන අමාත්‍යංශයට ලබාදීම.

**<u>පළාත් සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව</u>**

(අ) සංයුතිය

- පළාත් අධ්‍යාපන ලේකම්
- පළාත් සෞඛ්‍ය ලේකම්
- පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
- පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
- කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු
- ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
- ප්‍රජා වෛද්‍ය විශේෂඥවරුන්
- වෛද්‍ය නිලධාරි (මාතෘ හා ළමා සෞඛ්‍ය)
- පළාත් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක
- සෞඛ්‍ය හා පෝෂණ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂරුන්
- ගණකාධිකාරි (පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව)
- දිස්ත්‍රික් සමෘද්ධි කළමනාකරු

ආ. වගකීම

- ජාතික සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති පළාතට අනුකූලව සකස්කර ගැනීම.
- වර්ෂයකට දෙවරක් වැඩසටහන ඇගයීමට ලක්කිරීම.
- පාසල් සෞඛ්‍ය කටයුතු සාර්ථකව සිදුකිරීම සඳහා ප්‍රතිපෝෂණය කිරීම.

**සෞඛ්‍ය ප්‍රවර්ධන ජාතික කමිටුව**

(අ) සංයුතිය

- ලේකම් අධ්‍යාපන අමාත්‍යංශය (සභාපති)
- ලේකම් සෞඛ්‍ය අමාත්‍යංශය / අතිරේක ලේකම් (සෞඛ්‍ය සේවා)
- සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
- ලේකම්, ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යංශය
- අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) / අධ්‍යාපන අමාත්‍යංශය
- නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් / (ම.සෞ.සේ) සෞඛ්‍ය අමාත්‍යංශය
- අධ්‍යක්ෂ / මාතෘ හා ළමා සෞඛ්‍ය
- අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා පෝෂණ), අධ්‍යාපන අමාත්‍යංශය
- අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන) අධ්‍යාපන අමාත්‍යංශය
- වැඩසටහන් භාර විශේෂඥ වෛද්‍ය නිළධාරී / පවුල් සෞඛ්‍ය කාර්යාංශය

ආ. වගකීම

පාසල් සෞඛ්‍ය පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීම.

- වැඩසටහන නියාමනය කිරීම හා ඇගයීම.
- වැඩසටහනේ ගැටළු නිරාකරණය කිරීමට කටයුතු කිරීම.
- පාසල් සෞඛ්‍ය වැඩසටහන සාර්ථකව ඉටු කිරීම සඳහා මෙම චක්‍ර ලේඛ පැවතුම් පිළිපදින බවට නිලධාරීන් වගබලා ගත යුතුවේ.

වෛද්‍ය අතුල කහඳලියනගේ
ලේකම් / සෞඛ්‍ය, ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යංශය

පිටපත්

- ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය
- අතිරේක ලේකම් / අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන, අධ්‍යාපන අමාත්‍යංශය
- සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය අමාත්‍යංශය
- නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, (මහජන සෞඛ්‍ය සේවා) සෞඛ්‍ය අමාත්‍යංශය
- නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා), සෞඛ්‍ය අමාත්‍යංශය
- අධ්‍යක්ෂ (මාතෘ හා ළමා සෞඛ්‍ය), සෞඛ්‍ය අමාත්‍යාංශය
- අධ්‍යක්ෂ, සෞඛ්‍ය අධ්‍යාපන හා ප්‍රචාරණ සෞඛ්‍ය අමාත්‍යාංශය
- අධ්‍යාපන අධ්‍යක්ෂ / සෞඛ්‍ය හා පෝෂණ, අධ්‍යාපන අමාත්‍යංශය

## ඇමුණුම 1-ඒ

### පාසල් සෞඛ්‍ය වැඩසටහන් අරමුණු

1. පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමෙහිලා, අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රවල ඇති සහයෝගය හා සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම.
2. පාසල් ළමුන්ගේ පූර්ණ වර්ධනය සහ සංවර්ධනය සඳහා අවශ්‍ය අවස්ථා හඳුනා ගැනීම.
3. සුදුසු සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් මගින් පාසල් ළමුන්ට තමන්ගේ සෞඛ්‍යයට බලපාන හේතු සාධක පාලනය කිරීම හා ප්‍රවර්ධනය කිරීමට ඇති හැකියාවන් වැඩි දියුණු කිරීම.
4. පවුල හා සමාජය තුල සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා විපර්යකාරකයන් ලෙස කටයුතු කිරීමට පාසල් ළමුන් තුල ඇති හැකියා වැඩි දියුණු කිරීම.
5. ඉගෙනීම හා ඉගැන්වීම සඳහා සුදුසු පරිදි පාසල් පරිසරය සෞඛ්‍යමත් ලෙස හා ආරක්ෂාකාරී ලෙස සකස් කිරීම.
6. බෝවන හා බෝ-නොවන රෝග වලින් පාසල් දරුවන් ආරක්ෂා කිරීම.
7. සෞඛ්‍ය ගැටලු හැකි ඉක්මනින් හඳුනා ගෙන පිළියම් කිරීම සඳහා පාසල් ළමුන් වෛද්‍ය පරීක්ෂණවලට ලක් කිරීම.
8. නිතිපතා සොයා බැලීම් හා සුදුසු මැදිහත්වීම් තුලින් පාසල් දරුවන්ගේ පෝෂණ තත්වය වැඩි දියුණු කිරීම හා හිතකර සෞඛ්‍ය පුරුදු ප්‍රගුණ කිරීම.
9. පාසල් සෞඛ්‍ය කටයුතු සංවර්ධනය සඳහා උපරිම ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීම.
10. පාසල් සෞඛ්‍ය වැඩ සටහනේ සාර්ථකත්වය සඳහා නියාමන හා ඇගයීම් ක්‍රියාවලියක් පවත්වාගෙන යාම.

## ඇමුණුම 1- බී

### පාසල් වෛද්‍ය පරීක්ෂණය

A. 200ට වැඩි ළමුන් සංඛ්‍යාවක් සිටින සියළුම පාසල් වල වෛද්‍ය පරීක්ෂණය වාර්ෂිකව 1, 4, 7, 10 සිසුන් සඳහා සිදුකල යුතුය. 200ට අඩු ළමයින් සංඛ්‍යාවක් සිටින පාසල් වල හෝ ඊට අඩු සියළුම ළමුන් වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂණයට භාජනය කළ යුතුවේ.

B. කොට්ඨාස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි / අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, විදුහල්පතිවරුන් සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කොට මෙම කටයුතු සැලසුම් කල යුතුය. පාසල් සෞඛ්‍ය කාර්තු ඉදිරි වැඩසටහන මේ අනුව පිළියෙළ කල යුතුය.

C. අධ්‍යාපන අමාත්‍යංශය මෙම දිනය, පාසල් සෞඛ්‍ය දිනයක් ලෙසට ප්‍රකාශයට පත්කිරීමට තිරණය කොට ඇති අතර සියළුම සෞඛ්‍ය කාර්ය මණ්ඩල සහ පාසල් ප්‍රජාව (නිවාරණ හා ප්‍රතිකාර අංශවල) එක්ව එදිනට පාසල් සෞඛ්‍ය කටයුතු සැලසුම් කල යුතුය.

D. පාසල් වෛද්‍ය පරීක්ෂණය සඳහා නියම කරගත් දිනට අවම වශයෙන් සති 2 කට පෙර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා පාසලට / විදුහල්පතිට ප්‍රතිශක්තිකරණ වැඩසටහන වෛද්‍ය පරීක්ෂණය පිළිබඳව නැවත දැනුම් දීම කළ යුතුය. අනතුරුව විදුහල්පති විසින් දෙමාපියන්ට දැනුම් දීම සහ 1 ශ්‍රේණිය සිසුන්ගේ සහ සෞඛ්‍ය ගැටළු සහිත දරුවන්ගේ දෙමාපියන්ට එම දිනයේදී සහභාගී වීමට දැනුම් දිය යුතුය.

E. විදුහල්පති විසින් ළමා සෞඛ්‍ය වර්ධන සටහන ගෙනඒමට සහ ප්‍රතිශක්තිකරණ සඳහා ලිඛිත අවසර ලබාගැනිමට දෙමාපියන් දැනුවත් කල යුතුය.

F. වෛද්‍ය පරීක්ෂණය දිනයට පෙර මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් පෙර පරීක්ෂණය සිදු කළ යුතුය.

G. ළමුන් වෛද්‍ය පරීක්ෂණයට ලක් කිරීම (SMI) සෑම විටම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි/ නියෝජ්‍ය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, වෛද්‍ය නිලධාරියෙකු ලියාපදිංචි වෛද්‍ය නිලධාරියකුගෙන් හෝ සහකාර වෛද්‍ය නිලධාරියෙකු විසින් සිදුකල යුතුය.

H. මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් SMI දිනයේදීම ප්‍රතිශක්තිකරණ කටයුතු සිදුකල යුතුයි. (හදිසි අවශ්‍යතාවයක් වුවහොත් අවශ්‍ය හදිසි ප්‍රතිකාර සඳහා වෛද්‍යවරයෙකු හෝ මහජන සෞඛ්‍ය හෙදි සොයුරියක් එම ස්ථානයේ සිටිය යුතුය).

I. ප්‍රතිශක්තිකරණය තනි කටයුත්තක් ලෙස නොව වෛද්‍ය පරීක්ෂණයේම කොටසක් ලෙස සිදුකල යුතුය.

| | |
|---|---|
| ද්විත්ව පෝලියෝ (DT/OPV) | 1 ශ්‍රේණියේ සියළු ළමුන් සඳහා, කලින් ලබාදී නොමැති නම් |

වැඩිහිටි පිටගැස්ම ගලපටල (aTd) 7 ශ්‍රේණියේ සියලු ළමුන් සඳහා

රුබෙල්ලා 8 ශ්‍රේණියේ සියලු ළමුන් සඳහා

ලබාදිය යුතු අතර සියළු එන්නත් ළමා සෞඛ්‍ය වර්ධන සටහනෙහි සටහන් කළ යුතුය.

J. සම්පූර්ණ කරන ලද එන්නත් වාර්තාව එම කාර්තුවට පසු කාර්තුවේ පළමු මස 15 දිනට පෙර ප්‍රතිශක්තිකරණ කාර්තු වාර්තාවට ඇතුලත් කිරීම සඳහා මහජන සෞඛ්‍ය හෙදි සොහොයුරියට ලබාදිය යුතුය.

K. පෝෂණ තත්වය මැන බැලීමටත් අවශ්‍ය මැදිහත් වීම් සිදුකිරීමටත් පාසල් ගුරුවරුන් සහ දරුවන් බලකරණය කල යුතුය.

L. වෛද්‍ය පරීක්ෂණයට සහභාගි නොවූ සිසුන් වෙනත් දිනයකදී හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සෙනසුරාදා දින පවත්වන මධ්‍යම සායනයේ දී පරීක්ෂා කොට අවශ්‍ය සේවා ලබාදිය යුතුය.

M. වෛද්‍ය පරීක්ෂණයේදී හඳුනාගන්නා ලද ආබාධ සහිත දරුවන් අදාල විශේෂඥ සායන වෙත යොමු කිරීම පත්‍ර (H 606). මෙසේ යොමු කරන ලද ළමුන් බාහිර රෝගී අංශය හරහා එම විශේෂඥ සායන වලට යා යුතු නැත.

N. පාසලට පසු විපරම් සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් වෛද්‍ය පරීක්ෂණයට සති 2 කට, සති 6 කට සහ, මාස 6 කට පසු තුන් වතාවක් (අවම වශයෙන්) යා යුතුය. ආබාධ සටහන පිටපත් කොට පන්ති භාර ගුරුතුමිය වාර්තාව ලබාදී ආබාධ නිවැරදි කරන බවට එමගින් සහතික විය යුතුය.

O. බාහිර රෝගී අංශයේ සහ විශේෂඥ සායනවලදී යොමු කරන ලද පාසල් දරුවන්ට මුලිකත්වය ලබාදීමට රෝහල් ප්‍රධානීන් කටයුතු කල යුතුය. (සෙසු චක්‍ර ලේක අංක 02-32/2002). එසේ යොමු කරන ලද දරුවන් පෝලීමේ නොතබා ප්‍රතිකාර ලබාදීමට ආයතන ප්‍රධානීන් කාරුණිකව සහතික විය යුතුය. සෙනසුරාදා දිනවල හෝ සතියේ දින සවස් වරුවේ පාසල් දරුවන් සඳහා විශේෂඥ සායන පැවැත්විය යුතුවේ.

P. ඇස් කණ්ණාඩි හෝ ශ්‍රවණාධාරක අවශ්‍ය සිසුන් එම වට්ටෝරු සමඟ පළාත් අධ්‍යාපන කාර්යාලයේ විශේෂ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරී වෙත යොමු කිරීමෙන් ඒවා නොමිලේ ලබාගත හැක. මේ සම්බන්ධව ගුරුවරුන් දැනුවත් කල යුතුය.

Q. හැසිරීමේ ආබාධ සහිත දරුවන් ළමා රෝග විශේෂඥ වෙත යොමු කල යුතුය. මානසික ගැටළු ඇති ළමුන් මනෝ වෛද්‍ය විශේෂඥගේ මනෝ චිකිත්සක වෙත යොමු කළ යුතුය.

R. හෘද රෝග ඇති දරුවන් ළමා රෝග විශේෂඥ හරහා හෘද රෝග විශේෂඥ වෙත යොමු කළ යුතුය.

S. සියලුම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සෑම මසකම අවසානයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මාර්ගෝපදේශනයට අනුව මාසික වාර්තාව පිළියෙළ කොට ප්‍රධාන පත්‍රිකාව සම්පූර්ණ කිරීම සඳහා පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකට භාරදිය යුතුය.

T. පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් කාර්තු වාර්තාව සකස් කොට සෑම කාර්තුවකටම පසු පළමු මාසයේ 20 දිනට පෙර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ මාතෘ හා ළමා සෞඛ්‍යට පිටපත් එවිය යුතුය.

**ඇමුණුම 1- සී**

**<u>පාසල් සෞඛ්‍ය සමාජ ක්‍රියාකාරකම් පිළිබඳ සෞඛ්‍ය නිලධාරීන්ගේ වගකීම් සහ ඒ තුළින් පාසල තුල කළ හැකි ක්‍රියාකාරකම්</u>**

පාසල් සෞඛ්‍ය සමාජය, සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් වැඩසටහනෙහිම අංගයක් වන අතර එය එහි ප්‍රධාන අංග 5 න් එකක් ආමන්ත්‍රණය කිරීමට අවශ්‍යවේ. එනම් තමාගේ සෞඛ්‍ය ප්‍රවර්ධනයට ප්‍රජාවගේ දායකත්වය ලබාගැනීම. පාසල් සෞඛ්‍ය සමාජය ශිෂ්‍යයන්ගේ සෞඛ්‍ය ප්‍රවර්ධනය කරන අතර, පාසල් ප්‍රජාවේ අනිකුත් සමාජිකයන්ගේද සෞඛ්‍ය නහාලයි. එය ශිෂ්‍යාන්ට තම සෞඛ්‍ය ප්‍රවර්ධනයට සහ රැකගැනීමට එමෙන්ම පාසල් ප්‍රජාවගේ සෞඛ්‍ය දියුණුවට තමාගේ කුසලතා දියුණු කරගත හැක.

පාසල් සෞඛ්‍ය සමාජ ඇතිකිරීම, උදව් දීම මහජන සෞඛ්‍ය පරික්ෂක මහතාගේ ප්‍රධාන කාර්යකි. එය සඳහා මාර්ගෝපදේශකත්වය සහ අධීක්ෂණ කටයුතු සිදුකිරීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගේ සහ අනිකුත් කොට්ඨාස මට්ටමේ අධීක්ෂණ නිලධාරීන්ගේ වගකීමකි. පාසල් සෞඛ්‍ය සමාජය සෞඛ්‍ය නිලධාරීන්ගේ නීති මාර්ගෝපදේශකත්වයට භාජනය විය යුතුය. මසකට වරක්

පාසල් සෞඛ්‍ය සමාජ රැස්වීම් පැවැත්විය යුතු අතර සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම්ද සිදුකල යුතුය.

දිස්ත්‍රික් මට්ටමේ අධීක්ෂණ නිලධාරින්, ක්ෂේත්‍රයේ පාසල් සෞඛ්‍ය කටයුතු සිදුකරන නිලධාරින් අධීක්ෂණය සහ මාර්ගෝපදේශනය තුලින් නිරතුරු පසු විපරම් කිරීමට දිරි ගැන්විය යුතුය. මාතෘ හා ළමා වෛද්‍යවරයා පාසල් සෞඛ්‍ය පිළිබඳ ප්‍රධාන වගකීම දරණ අතර ප්‍රාදේශිය දන්ත ශල්‍ය වෛද්‍ය, ප්‍රාදේශිය වසංගතවේදි බෝනොවන රෝග වෛද්‍ය නිලධාරි, මානසික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, ප්‍රාදේශිය පරිපාලන මහජන සෞඛ්‍ය පරික්ෂක, සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි, පරිපාලන මහජන සෞඛ්‍ය හෙද සොහොයුරිය යන නිලධාරින්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්ය මණ්ඩලය හා අධ්‍යාපන නිලධාරින් මගින් සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල ක්‍රියාත්මක කරනු ලබයි.

පාසල් සෞඛ්‍ය සමාජ ක්‍රියාකාරකම් ,සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරින්ගේ මූලික වගකීමක් වන්නේ, ඔවුන් ප්‍රජා සහභාගිත්වය ලබාගැනීම සහ හැසිරීම් රටා වෙනස් කිරීම සඳහා සන්නිවේදනය කිරීම ඔවුන්ගේ විශේෂ වගකීම් වන බැවිනි. සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරින්, අනිකුත් ක්ෂේත්‍ර නිලධාරින්ගේ සහ අධ්‍යාපන දෙපාර්තමේන්තු නිලධාරින්ගේ සන්නිවේදන කුසලතා දියුණු කල යුතුය.

## පාසල් සෞඛ්‍ය සමාජ තුලින් කලහැකි සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම්

1. පාසල් සෞඛ්‍ය සමාජ කමිටුවේ උපදෙස් ඇතිව වාර්ෂික සෞඛ්‍ය ප්‍රවර්ධන සැලසුම පිළියෙළ කිරීම.
2. මාසිකව සෞඛ්‍ය සමාජය විසින් කරන ක්‍රියාකාරකම් නියාමනය කිරීම.
3. පාසල් ප්‍රජාවගේ සෞඛ්‍ය ප්‍රවර්ධනය වි ඇතිදැයි නිර්නායක යොදාගෙන නියාමනය කිරීම.
4. පාසලෙහි වාර්ෂිකව පාසල් සෞඛ්‍ය දිනයක් පැවැත්වීම.

## වාර්ෂික ක්‍රියාකාරකම් සැලසුමෙහි අඩංගු කලහැකි ක්‍රීයාකාරකම්

(a) පාසල් සෞඛ්‍ය සමාජයේ මාසික රැස්වීම
(b) විශේෂ ක්‍රියාකාරකම් පැවැත්වීම - ආරාධිතයන්ගේ දේශන, දේශන සාකච්ඡා කර පෙන්වීම්, කෙටි නාට්‍ය, චිත්‍රපට, සහචර ඉගෙනුම්
(c) දිනපතා සෞඛ්‍ය කතා,පාසල් පොදු ඇමතීම් කිරීම.
(d) සෞඛ්‍යට සම්බන්ධ තරඟ පැවැත්වීම - උදා- නාට්‍ය , ප්‍රදර්ශන ,දේශන
(e) සෞඛ්‍ය ප්‍රවර්ධන බිත්ති පුවත්පත් පවත්වාගෙන යාම.
(f) සෞඛ්‍ය සම්පත් මධ්‍යස්ථානයක් ඇති කර එහි අවශ්‍යකරන පත්‍රිකා, විඩියෝ, පෝස්ටර්, පත්තර, ලිපි ආදිය භාවිතය සඳහා තැබීම.
(g) සහචර අධ්‍යාපනය සහ ජිවන නිපුණතා වර්ධනය කිරීම.
(h) කුණු කසල බැහැරලීමේ ක්‍රමවේදයක් තිබීම සහ පරිසරය පිරිසිදුව පවත්වා ගැනීම.
(i) පාසල තුළ බීමට සුදුසු ජලය ලබාදීමට උදව් කිරීම.
(j) පාසල තුළ වැසිකිළි පිරිසිදු කිරීමේ ක්‍රමවේදයක් සැකසීම.
(k) පාසල් වෛද්‍ය පරීක්ෂණයට උදව් කිරීම.
(l) පාසල් ප්‍රජාවට යහපත් සෞඛ්‍ය පුරුදු ඇතිකර ගැනිමට දිරිගැන්වීම.
(m) දිවා ආහාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට උදව් කිරීම.
(n) ප්‍රජා සෞඛ්‍ය දියුණු කිරීමේ වැඩසටහන් තිබීම.
(o) සෞඛ්‍යමත් ආපනශාලා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ආධාර කිරීම.
(p) ප්‍රථමාධාර මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සහ විශේෂ අවස්ථාවල ප්‍රථමාධාර ලබාදීමට කටයුතු කිරීම.

දුරකථන /தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary — 2784812

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ........................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
'இசுருபாயா'
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. ED/11/21/1/2/2

දිනය / திகதி / Date 2007.10.08

චක්‍රලේඛ අංකය:- **2007/21**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
විදුහල්පතිවරුන් වෙත

**<u>පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන</u>**

ශ්‍රී ලාංකිකයන්ගේ විශේෂයෙන් පාසල් සිසුන්ගේ සෞඛ්‍ය හා පෝෂණ ගැටලු පවතින බව විවිධ පර්යේෂණ හා මාධ්‍ය මගින් දැන ගන්නට ලැබී ඇත. මේ තත්වය මගහරවා ලීමේ කාර්යය පාසල් මට්ටමින් කළ හැකි බැවින් පාසල් සිසුන්, ගුරුවරුන් ඇතුළු පාසල් ප්‍රජාවගේ සෞඛ්‍ය තත්වය ප්‍රවර්ධනය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහාය ඇතිව තිරසාර වැඩසටහනක් දියත් කිරීම පිණිස මේ චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

පාසල තම පූර්ණ සංවිධානාත්මක ශක්තිය යොදවා පාසල් සිසුන් හා ගුරුවරුන් ඇතුළු පාසල් ප්‍රජාවගේ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ක්‍රියා කිරීමට යොමු කිරීම මේ වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. විදුහල්පති විසින් පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන සඳහා පාසල් සිසුන්, ගුරුවරුන් ඇතුළු පාසල් ප්‍රජාවගේ පූර්ණ දායකත්වය ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.

**2.0** අරමුණු

ඉහත සඳහන් ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීම පිණිස පහත සඳහන් අරමුණු අනිවාර්යයෙන් ම පාසල මගින් ඉටු කළ යුතු ය.

**2.1** සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් ප්‍රතිපත්ති සැකසීම.
**2.2** පාසල් සිසුන් තුළ සෞඛ්‍ය ප්‍රවර්ධන දැනුම හා නිපුණතා ඇති කිරීම.
**2.3** පාසල තුළ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා හිතකර පරිසරයක් ඇති කිරීම.
**2.4** පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා පාසල් සිසුන්, ගුරුවරුන් ඇතුළු පාසල් ප්‍රජාවගේ සහභාගිත්වය ලබා ගැනීම.
**2.5** සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහාය ඇති ව පවත්වන පාසල් සෞඛ්‍ය සේවා, සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ඵලදායී ලෙස යොදා ගැනීම.

**3.0 පාසල තුළ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා අවධානය යොමු කළ යුතු මූලිකාංගඃ**

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීමේ දී පහත සඳහන් මූලිකාංග කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

**3**.1 පාසල් පරිශ්‍රය අලංකාර ව, ආරක්ෂිත ව සහ ප්‍රියමනාප ව පවත්වා ගැනීම.

**3.2** වැසිකිළි. කැසිකිළි ප්‍රමාණවත් ව හා පවිත්‍ර ව පවත්වා ගැනීම.(ඇමුණුම 1)

**3.3** පානීය ජල පහසුකම් පැවතීම.

**3**.4 ශිෂ්‍ය සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය පිළිබඳ සැලකිලිමත් වීම.

**3**.5 පාසල් ආපන ශාලාව සෞඛ්‍ය ආරක්ෂිත ව හා සිසු පෝෂණයට හිතකාමී ලෙස පවත්වා ගැනීම.

**3**.6 පාසල් සිසුන්ට හිතකාමී පාසල් වාතාවරණයක් ඇති කිරීම.

**4.0 වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා නියාමනය :**

මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පාසල හා පාසලට අදාළ අධ්‍යාපන ආයතනයන් තුළ වඩා සාර්ථකව මෙහෙයවීම සඳහා ශිෂ්‍ය සමාජ සහ සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටු පත් කර ගැනීම අත්‍යාවශ්‍ය වේ.

4.**1පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජ**

පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජ පිහිටුවිය යුතු ය. මෙහි දී ප්‍රාථමික හා ද්විතියික අංශ සඳහා වෙන් වෙන් වශයෙන් සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජ පිහිටුවීම යෝග්‍ය වේ.. පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජවල සියලු නිලතල හා වගකීම් සිසුන්ට ලබා දිය යුතු ය.

**4.1.1 සංයුතිය-**

සභාපති, උප සභාපති, සම ලේකම්වරුන්, භාණ්ඩාගාරික සහ කාරක සභිකයින්ගෙන් නිලධාරි මඩුල්ල සමන්විත වන අතර ඕනෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකට සමාජිකත්වය ලබා ගත හැකි ය.

4.1.2 **වගකීම:**

- පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය සම්බන්ධයෙන් වාර්ෂික සැලැස්මක් සකස් කර පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන උපදේශන කමිටුවේ අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කිරීම.
- මාසිකව රැස්වීම් පවත්වා අදාළ ක්‍රියාකාරකම් ප්‍රගති සමාලෝචනය හා සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන ඇගයීම් නිර්ණායකවලට අනුකූල වන පරිදි අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.
- පාසල් සෞඛ්‍ය දිනයක් පැවැත්වීම.

4.2 **පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන උපදේශන කමිටුවඃ**

**4.2.1 සංයුතිය-**

විදුහල්පති (සභාපති)
සෞඛ්‍ය වැඩසටහන් භාර නියෝජ්‍ය විදුහල්පති/අංශ ප්‍රධාන/අදාළ ගුරු භවතුන්
ප්‍රාථමික අංශ භාර නියෝජ්‍ය විදුහල්පති/අංශ ප්‍රධාන
ගුරුවරු උපරිම **03** දෙනකු (ශිෂ්‍ය සංඛ්‍යාව මත පත් කිරීමට විදුහල්පතිට අවකාශ ඇත.)
(සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන/ජීවන නිපුනතා/විද්‍යාව හෝ වෙනත් ගුරු භවතුන් විය හැකි ය.)
ශිෂ්‍ය නියෝජිතයන් - පාසල් සෞඛ්‍ය සමාජවල සභාපති, සම ලේකම්වරු හා භාණ්ඩාගාරික
දෙමාපිය නියෝජිතවරු (උපරිමය පස් දෙනෙකි.)
මහජන සෞඛ්‍ය පරීක්ෂක
සමෘද්ධි සංවර්ධන නිලධාරි
බාහිර සුභ පතන්නන් (උපරිමය දෙදෙනෙකි.)

**4.2.2 වගකීම:**

- පාසලේ සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජවල ක්‍රියාකාරකම් සඳහා මග පෙන්වීම හා වැඩසටහන් නියාමනය කිරීම හා ප්‍රතිපෝෂණය කිරීම.
- ත්‍රෛමාසික රැස්වීම් පවත්වා පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා යොමු කිරීම.
- ක්‍රියාකාරී ප්‍රජා සහභාගිත්වය සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්වලට ලබා ගැනීම.

**4.3 කලාප අධ්‍යාපන සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව:**

**4.3.1 සංයුතිය:**

කලාපයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (සභාපති)
කලාපයේ සෞඛ්‍ය වැඩසටහන් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාපයේ පෝෂණ වැඩසටහන් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාප ප්‍රාථමික නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාපයේ විශේෂ අධ්‍යාපනය භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 01
ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක
පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක
සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් (කලාපයට අයත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල)
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් (කලාපයට අයත් අධ්‍යාපන කොට්ඨාසවල)
ගණකාධිකාරී(කලාප අධ්‍යාපන කාර්යාලය)
දිස්ත්‍රික් සමෘද්ධි කළමනාකරු
විදුහල්පතිවරුන් 04 දෙනකු
(1AB පාසල් 01, 1C පාසල් 01, 2 වර්ගයේ පාසල් 01,3 වර්ගයේ පාසල් 01)

**4.3.2 වගකීම:**

- ත්‍රෛමාසික ව කලාප මට්ටමේ රැස්වීම් පවත්වා පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් ඇගයීම සහ නියාමනය.
- පාසල් වැඩසටහන් සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දීම.
- අවශ්‍ය සහාය සේවා ලබා දීමට පියවර ගැනීම.
- ඇගයීමේ දී රන් සම්මාන සහතික ලබා ගන්නා පාසල් ලේඛන පළාත් කමිටුවට හා අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දීම.

**4.4 පළාත් අධ්‍යාපන සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව:**

**4.4.1 සංයුතිය:**

පළාත් අධ්‍යාපන ලේකම් (සභාපති)
පළාත් සෞඛ්‍ය ලේකම්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 01
පළාත් සෞඛ්‍ය වැඩසටහන් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් සැළසුම් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් පෝෂණ වැඩසටහන් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් විශේෂ අධ්‍යාපන අධ්‍යක්ෂ
ගණකාධිකාරී(පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව)
දිස්ත්‍රික් සමෘද්ධි සහකාර කොමසාරිස්

#### 4.4.2 වගකීම්

- ජාතික ප්‍රතිපත්තිය අනුව පළාත් මට්ටමේ සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති තීරණය කිරීම.
- වර්ෂයකට දෙවරක් රැස්වීම් පවත්වා පළාත් මට්ටමේ පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් ඇගයීම සහ නියාමනය.
- පාසල් වැඩසටහන් සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දීම.

### 4.5 ජාතික මට්ටමේ අධ්‍යාපන සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව:

#### 4.5.1 සංයුතිය:

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්
ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (සෞඛ්‍ය සේවා)
සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා)
ජාතිය ගොඩ නැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියකු.
ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියකු.
අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන)
අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සැළසුම් සහ කාර්‍ය සාධන සමාලෝචන)
අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි
පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ
සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශයේ අධ්‍යක්ෂ
අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞඛ්‍ය හා පෝෂණ වැඩ සටහන් භාර අධ්‍යාපන අධ්‍යක්ෂ
අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂ
අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන අධ්‍යක්ෂ
අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ

#### 4.5.2 වගකීම :

- ජාතික මට්ටමේ පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති තීරණය කිරීම.
- වර්ෂයකට දෙවරක් රැස්වීම් පවත්වා පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් ඇගයීම සහ නියාමනය.
- පාසල් වැඩසටහන් සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දීම.

කමිටු ස්ථාපිත කිරීම, නිසි වකවානුවල කමිටු රැස්වීම් පැවැත්වීම, සෑම කමිටුවකම සභාපතිවරුන් සතු වගකීම වේ.

### 5.0 ඇගයීම:

පාසල තුළ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා අවධානය යොමු කළ යුතු අරමුණු හා මූලිකාංග ආශ්‍රයෙන් ඒ ඒ පාසල්වල ක්‍රියාත්මක වන සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ඇගයීමකට ( ඇමුණුම-2 ඇගයීම් පත්‍රිකාව) ලක් කොට අපේක්ෂිත මට්ටමට ළඟා තිබෙන පාසල් හඳුනා ගෙන ඒවා අගය කිරීම සඳහා ඇගයීම් සහතිකයක් වාර්ෂික ව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් නිකුත් කළ යුතු ය.

#### 5.1 කලාප ඇගයීම් මණ්ඩලය.:

කලාප මට්ටමේ ඇගයීම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයකු, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ ඔහුගේ නියෝජිතයකු ඇතුළත් වන පරිදි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන නිලධාරීන් 4 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් සිදු කළ යුතු ය. ඇගයීම් පත්‍රිකාවට අනුව වැඩි ලකුණු ලබා ගන්නා පාසල් සඳහා කලාප මට්ටමින් පහත සඳහන් පරිදි සහතික ප්‍රදානය කළ යුතු ය.

ලකුණු 100-80 අතර රන් සම්මාන සහතිකය.
ලකුණු 79-70 අතර රිදී සම්මාන සහතිකය.

ලකුණු 69-60 අතර ලෝකඩ සම්මාන සහතිකය.
ලකුණු 80 ත් ඉහළ ගන්නා පාසල් පිළිබඳ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දිය යුතු අතර එම පාසල් ජාතික මට්ටමින් ඇගයීමක් සඳහා ඇතුළත් කර ගනු ලැබේ.

**5.2 ජාතික ඇගයීම් මණ්ඩලය :**

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියකු, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියකු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන නිලධාරියකු, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන නිලධාරියකුගෙන් සමන්විත වේ. ලකුණු 80ට වැඩියෙන් ගන්නා පාසල් සඳහා ජාතික මට්ටමේ පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ඇගයීම් සහතිකයක් නිකුත් කෙරේ.

මේ වැඩසටහන සාර්ථක ව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම සියලු ම විදුහල්පතිවරුන්, ගුරුවරුන්, කාර්ය මණ්ඩලය සහ නිලධාරීන්ගේ වගකීම වේ.

ආරියරත්න හේවගේ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත- ලේකම්- සෞඛ්‍ය අමාත්‍යාංශය
ලේකම්- ජාතිය ගොඩ නැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය

# Sanitary Facility

**Toilets and Urinals for Pupils**

| No of students | Required no of toilets for girls schools | Required no of toilets and urinals for boys schools | |
|---|---|---|---|
| | | Toilets | Urinals |
| 100 | 2 | 1 | 2 |
| 200 | 3 | 1 | 2 |
| 300 | 5 | 2 | 3 |
| 400 | 6 | 2 | 4 |
| 500 | 8 | 3 | 5 |
| 600 | 9 | 3 | 6 |
| 700 | 11 | 4 | 7 |
| 800 | 12 | 4 | 8 |
| 900 | 14 | 5 | 9 |
| 1000 | 15 | 5 | 10 |
| 1200 | 16 | 5 | 11 |
| 1400 | 17 | 6 | 11 |
| 1600 | 18 | 6 | 12 |
| 1800 | 19 | 6 | 13 |

For Mix schools, identify no of toilets and urinals separately for boys and girls using above table.

Example :300 boys and 400 girls
For boys, two toilets and three urinals.
For girls, six toilets.

**Teacher Toilets**

For teachers less than10 two toilets
10 to 40 teachers – four toilets
Above 40 – five toilets

**Water**

Water can be supplied from water supplying schemes under Urban Councils if schools are situated in urban areas. Please check as to availability of water for the school concerned. Even if water is supplied, overhead tanks have to be constructed.

If not, well water must be made available for students.
A well has to be dug in the premises of school, Overhead tank has to be constructed and pump house with electrical water pump has to be provided to pump water from the well to the tank. From there, water must be distributed to toilets, Laboratories, Home Science, Canteen, Administrative Block etc,.

If school is situated in a close proximity to the sea, well water is not drinkable due to salinity.

# පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩ සටහන ඇගයීම් පත්‍රිකාව

| නිර්ණායකය | දර්ශකය | ඇගයීම් මට්ටම | ලබාගත් ලකුණු | ප්‍රභවය |
|---|---|---|---|---|
| 1 පාසල් සෞඛ්‍ය කමිටුව | 1 කමිටුවක් ඇත ක්‍රියාත්මක ය.<br>2 කමිටුවක් ඇත. ක්‍රියාත්මක නැත<br>3 කමිටුවක් නැත. | 2<br>1 | | කමිටු නාමාවලිය හා රැස්වීම් වාර්තා අත්සන් පත්‍ර |
| 2 ශිෂ්‍ය සෞඛ්‍ය සංගමය | 1 සංගමයක් ඇත ශිෂ්‍ය සහභාගිත්වය 100% පවතී. ක්‍රියාකාරකම්වල යෙදේ. වාර්ෂික සැලැස්මක් ඇත.<br>2 සංගමයක් ඇත. ශිෂ්‍ය සහභාගිත්වය 50% පමණි. ක්‍රියාකාරකම් වල යෙදේ වාර්ෂික සැලැස්මක් ඇත.<br>3 සංගමයක් ඇත. ශිෂ්‍ය සහභාගිත්වය ප්‍රමාණවත් ව නැත. ක්‍රියාකාරකම්වල යෙදීම ප්‍රමාණවත් නැත. වාර්ෂික සැලැස්මක් ඇත. | 3<br>2<br>1 | | ශිෂ්‍ය සංගම් වාර්තා |
| 3 ප්‍රථමාධාර ලබා දීම | 1 ශිෂ්‍යයන් සඳහා ප්‍රථමාධාර ලබා දීමේ ක්‍රියාමාර්ග පවතී. ප්‍රථමාධාර ඒකකයක් ඇත හදිසි අනතුරු සඳහා ප්‍රථමාධාර උපකරණ පවතී. පුහුණුව ලත් ගුරුවරු හා සිසුහු සිටිති.<br>2 පහසුකම් සහිත ප්‍රථමාධාර පෙට්ටියක් පවතී.ක්‍රියාමාර්ග පවතී<br>3 එවැනි පහසුකම් නොමැත | 3<br>2<br>0 | | ප්‍රථමාධාර උපකරණ ප්‍රතිකාර ලබාදීම පිළිබඳ වාර්තා/ලේඛනය |
| 4 සෞඛ්‍ය වෛද්‍ය පරීක්ෂණය | 1 පසුගිය වර්ෂයේ පවත්වා ඇත. අදාළ සියලුම සිසුන් සෞඛ්‍ය වෛද්‍ය පරීක්ෂණයට භාජන කර ඇත.<br>2 SMI සිදු කර ඇත්තේ සිසුන් 100%-80% පමණි.<br>3 SMI සිදු කර ඇත්තේ සිසුන් 80%-50% පමණි.<br>4 වාර්ෂික ව SMI සිදු කර නැත. | 3<br>2<br>1<br>0 | | SMI කාඩ්පත්<br>MoH ගේ ලොග් සටහන |

| නිර්ණායකය | දර්ශකය | ඇගයීම් මට්ටම | ලබාගත් ලකුණු | ප්‍රභවය |
|---|---|---|---|---|
| 5 සෞඛ්‍ය වෛද්‍ය පරීක්ෂණයෙන් හඳුනා ගත් ගැටලු සඳහා ක්‍රියාමාර්ග ගැනීම | 1 හඳුනා ගත් සිසු ගැටලු සඳහා ප්‍රතිකර්ම වැඩ සටහන් සිදු කර ඇත. ඒ පිළිබඳ ව සොයා බලා ක්‍රියා කරයි.<br>2 හඳුනා ගත් සිසු ගැටලු සඳහා ප්‍රතිකර්ම වැඩ සටහන් ඇත. එහෙත් ඒ පිළිබඳ සොයා නොබලයි.<br>3 හඳුනා ගත් සිසු ගැටලු සඳහා ප්‍රතිකර්ම වැඩ සටහන් නැත. එහෙත් ආනාවරණ පිළිබඳ තොරතුරු පවතී.<br>4 අනාවරණ ගැටලු පිළිබඳ නොදනී. | 3<br>2<br>1<br>0 | | සෞඛ්‍ය ගැටලු සටහන් පත්‍ර<br>H 456 සටහන් පත්‍ර |
| 6 පාසල් සෞඛ්‍ය වැඩ සටහන් පිළිබඳ ප්‍රජා දායකත්වය | 1 ඉතා ඉහළ මට්ටමක පවතී. (60%)පාසල් වාරයකට එක් ක්‍රියා කාරකමක්වත් සිදු කර ඇත.<br>2 සහභාගිත්වය අඩු ය (30%)<br>3 සහභාගිත්වයක් නැත | 3<br>1<br>0 | | වැඩසටහන් සඳහා පැමිණි ප්‍රතිශතය |
| 7 පාසල විසින් සිදු කරන ප්‍රජා සෞඛ්‍ය වැඩ සටහන් | 1 වාර්ෂික ව ක්‍රියාකාරකම් 3කට වඩා සිදු කර ඇත.<br>2 වාර්ෂික ව ක්‍රියාකාරකම් 2කට වඩා සිදු කර ඇත.<br>3 වාර්ෂික ව ක්‍රියාකාරකම් 1කට වඩා සිදු කර ඇත.<br>4 වාර්ෂික ව ක්‍රියාකාරකම් සිදු කර නැත. | 5<br>3<br>2<br>0 | | වාර්තා සටහන් |
| 8 සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 1 ශිෂ්‍ය සංඛ්‍යාවට හා ගුරු සංඛ්‍යාවට ප්‍රමාණවත් පරිදි භාවිත කළ හැකි පහසුකම් පවතී.<br>2 සනීපාරක්ෂක පහසුකම් පවතින නමුත් ප්‍රමාණවත් නොවේ. (80%)<br>3 සනීපාරක්ෂක පහසුකම් පවතින නමුත් ප්‍රමාණවත් නොවේ. (50%)<br>4 සනීපාරක්ෂක පහසුකම් නොමැත. | 6<br>3<br>2<br>0 | | ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂ ව පවතින සනීපාරක්ෂක පහසුකම් |

| නිර්නායකය | දර්ශකය | ඇගයීම් මට්ටම | ලබාගත් ලකුණු | ප්‍රභවය |
|---|---|---|---|---|
| 9 සනිපාරක්ෂක පහසුකම් හා ඒවායේ පවිත්‍රතාව | 1 ක්‍රමවත් ව සැලසුම් කර ඇත.(ඉදිකර ඇත.) පිරිසිදු ව පවත්වා ගෙන යයි. අඛණ්ඩව ජල පහසුකම් සැපයේ.<br>2 පිරිසිදුව පවති. එහෙත් අඛන්ඩ වැඩ පිළිවෙළක් නැත. ජල සැපයුම ඇත.<br>3 පිරිසිදු ව ඇත. ජල සැපයුම නැත.<br>4 පිරිසිදු කිරිමේ වැඩ පිළිවෙළක් නැත. | 6<br>4<br>2<br>0 | | සනිපාරක්ෂක පහසුකම් පවත්වා ගෙන යාමේ මට්ටම |
| 10 ජල පහසුකම් සැපයිම | 1 ජල පහසුකම් ඇත. අඛණ්ඩ ව නඩත්තු කරයි. පිරිමැසුම් ක්‍රම භාවිත කරයි..බීමට සුදුසු ජලය ඇත.<br>2 ජල පහසුකම් ඇත. නඩත්තු පරිසරයක් පවති. පිරිමැසුම් ක්‍රම භාවිත නොකරයි බීමට සුදුසු ජලය ඇත<br>3 ජල පහසුකම් ඇත. නඩත්තු පරිසරයක් නොමැත. පිරිමැසුම් ක්‍රම භාවිත නො කරයි. බීමට සුදුසු ජලය ඇත.<br>4 ජල පහසුකම් ඇත. නඩත්තු පරිසරයක් නොමැත. පිරිමැසුම් ක්‍රම භාවිත නො කරයි. බීමට සුදුසු ජලය නැත.<br>5 ජල පහසුකම් නැත. | 6<br>4<br>2<br>1<br>0 | | පවතින ජල පහසුකම් හා පවත්වා ගෙන යාම |
| 11 ශිෂ්‍ය පැමිණීම | 1 පසුගිය වර්ෂයේ සාමාන්‍ය පැමිණීම 90% වැඩි ය.<br>2 සාමාන්‍ය පැමිණීම 90% -80% අතර ය.<br>3 සාමාන්‍ය පැමිණීම 80%-70% අතර ය. | 5<br>3<br>1 | | පැමිණීමේ ලේඛනය |
| 12 ගුරු පැමිණීම | 1 සාමාන්‍ය පැමිණීම 90% වැඩි ය.<br>2 සාමාන්‍ය පැමිණීම 90% -80% අතර ය.<br>3 සාමාන්‍ය පැමිණීම 80%-70% අතරය. | 5<br>3<br>1 | | පැමිණීමේ ලේඛනය / නිවාඩු වාර්තා |

| නිර්ණායකය | දර්ශකය | ඇගයීම් මට්ටම | ලබාගත් ලකුණු | ප්‍රභවය |
|---|---|---|---|---|
| 13 පන්ති කාමර පරිසරය | 1 සෑම පන්ති කාමරයක් ම ක්‍රමවත් ව පිරිසිදු ව මනා ආලෝකය හා වාතාශ්‍රය සහිත ව පවතී. ඒ සඳහා ක්‍රමවේද ඇත<br>2 පන්ති කාමර වලින් 80% ක්‍රමවත් ව පිරිසිදු ව මනා ආලෝකය හා වාතාශ්‍රය සහිත ව පවතී.<br>3 පන්ති කාමර වලින් 50% ක්‍රමවත් ව පිරිසිදුව මනා ආලෝකය හා වාතාශ්‍රය සහිත ව පවතී.<br>4 පන්ති කාමර ක්‍රමවත් ව පිරිසිදුව මනා ආලෝකය හා වාතාශ්‍රය සහිත ව පැවැතීම ප්‍රමාණවත් නොවේ. | 5<br>3<br>2<br>0 | | භෞතික පරිසරය |
| 14 පාසල් පරිසරය | 1 ක්‍රමවත් ව පිරිසිදු ව අනතුරු සහිත ස්ථාන නොමැතිව අලංකාර ව පවත්වා ගෙන යයි. ක්‍රීඩා කිරීමේ ඉඩකඩ පවතී.<br>(පවතින තත්ත්වය අනුව ලකුණු 1-5 අතර ලබා දිය යුතු ය.) | 5 | | භෞතික පරිසරය |
| 15 පෝෂණ ගැටලු අවම කිරීම | 1 හඳුනා ගැනීම සිදු කරයි. වැඩ සටහන් ක්‍රියාත්මක වේ.<br>2 හඳුනා ගැනීම සිදු කරයි. දැනුවත් කිරීම සිදු කරයි.<br>3 හඳුනා ගැනීම සිදු කරන නමුත් ක්‍රියාකාරකම් නොමැත. | 4<br>2<br>1 | | වැඩ සටහන් පිළිබඳ වාර්තා |
| 16 සෞඛ්‍ය හා පෝෂණ දැනුම හා නිපුණතා ලබා දීම | 1 වාර්ෂික ව වැඩ සටහන් 3කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කර ඇත.<br>2 වාර්ෂික ව වැඩ සටහන් 2 කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කර ඇත.<br>3 වාර්ෂික ව වැඩ සටහන් 1 කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කර ඇත. | 6<br>4<br>2 | | වාර්තා සටහන් |
| 17 ශිෂ්‍ය ශාරීරික යෝග්‍යතාව | 1 සිසුන්ගෙන් 90%ශාරීරික යෝග්‍යතාව නිසි පරිදි පවතී<br>2 සිසුන්ගෙන් 90%-75% යෝග්‍යතාව නිසි පරිදි පවතී<br>3 සිසුන්ගෙන්75% - 65% යෝග්‍යතාව නිසි පරිදි පවතී | 10<br>6<br>4 | | ශිෂ්‍ය යෝග්‍යතා සටහන් |

| නිර්ණායකය | දර්ශකය | ඇගයීම් මට්ටම | ලබාගත් ලකුණු | ප්‍රභවය |
|---|---|---|---|---|
| 18 ශරීර සුවතා වැඩ සටහන් | 1 අඛණ්ඩ වැඩ පිළිවෙලක් ඇත. සෑම ශිෂ්‍යයෙකුගේම සහභාගිත්වය පවතී<br>2 අඛණ්ඩ වැඩ පිළිවෙලක් ඇත. සෑම ශිෂ්‍යයකුගේ ම සහභාගිත්වය නොපවතී<br>3 අහඹු ලෙස සිදු කරයි. | 6<br>4<br>0 | | වැඩ සටහන තුළින් සිසුන්ගේ තොරතුරු ලබා ගැනීම |
| 19 පෞද්ගලික ස්වස්ථතාව | 1 අඛණ්ඩ සොයා බලයි. යොමු කිරීමක් ඇත<br>2 සොයා බලයි. යොමු කිරීමක් නැත<br>3 සොයා බැලීමක් නැත | 4<br>2<br>0 | | ශිෂ්‍ය වාර්තා සටහන් |
| 20 ආපන ශාලාව පවත්වා ගෙන යාම | 1 පිරිසිදු ව පවතී. පෝෂ්‍යදායි ආහාර ලබා ගත හැකිය. අහිත කර ආහාර වර්ග නැත.<br>2 පිරිසිදුව පවතී. පෝෂ්‍යදායි ආහාර ලබා ගත හැකිය. අහිත කර ආහාර වර්ග ඇත.<br>3 පිරිසිදකම පිළිබඳ සෑහීමකට පත් විය නොහැකිය. පෝෂ්‍යදායි ආහාර ලබා ගත හැකි ය. අහිත කර ආහාර වර්ග නැත. | 4<br>2<br>1 | | ආපන ශාලාව නිරීක්ෂණය කිරීම. |
| 21 මනෝ සමාජයීය පරිසරයක් | 1 නුසුදුසු දඬුවම් නොමැති මිතුරු පරිසරයක් ඇත.ළමයින්ට උදව් කරන ක්‍රියා මාර්ග ඇත.<br>2 දඬුවම් සමහරක් පවතී මිතුරු පරිසරයක් ඇත. | 3<br>2 | | නිරීක්ෂණ මඟින් |
| 22 උපදේශනය හා මාර්ගෝපදේශනය | 1 ගුරුවරයෙක් ඇත. යොමු වීම සඳහා අවස්ථාව ඇත. ස්ථානයක් ඇත. ක්‍රියා මාර්ග ගෙන තිබේ.<br>1-3 විහිදේ | 3 | | වාර්තා සටහන්<br>නිරීත්ෂණ |

**පාසල් හා නව යොවුන් සෞඛ්‍ය ඒකකය**
**පවුල් සෞඛ්‍ය කාර්යාංශය**
**නො 231, ද සෙරම් පෙදෙස**
**කොළඹ 10**

Tel 011 2692746
Fax 011 2692746
E mail - **sh_fhb@yahoo.com**
Web - www.familyhealth.gov.lk